2020

වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

ANNUAL REPORT



කාර්මික තාක්ෂණ ආයතනය

கைத்தொழில் தாழில்நுட்ப நிறுவனம்

INDUSTRIAL TECHNOLOGY INSTITUTE

වාර්ෂික වාර්තාව 2020

කාර්මික තාක්ෂණ ආයතනය

පටුන

01 පරිච්ඡේදය	හැඳින්වීම	
1.1.	දැක්ම, මෙහෙවර සහ ගුණාත්මක බව පිළිබඳ ප්‍රතිපත්තිය	**1**
1.2.	සංවිධාන ව්‍යුහය	**2**
02 පරිච්ඡේදය	උපාය මාර්ගික කාර්ය සාධනය	
2.1.	සභාපතිතුමාගේ පණිවුඩය	**3**
2.2.	අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය	**4**
2.3.	ක්‍රියාකාරී සැලැස්ම	**12**
03 පරිච්ඡේදය	පාලනය සහ පාරිශ්‍රමික	
3.1.	මණ්ඩල කරුණු	**20**
3.2.	කළමනාකරණ මණ්ඩලය	**20**
3.3.	කළමනාකරණ කමිටුව	**21**
3.4.	අභ්‍යන්තර විගණන	**23**
3.5.	වේතන	**23**
04 පරිච්ඡේදය	කාර්ය සාධනයේ විශේෂ අවස්ථා	
4.1.	තාක්ෂණය පැවරීම	**25**
4.2.	පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදනය	**27**
	4.2.1 තාක්ෂණ සංවර්ධනය	**27**
	4.2.2 පැවරීම සඳහා සූදානම්ව ඇති තාක්ෂණය	**29**
4.3.	තාක්ෂණික සේවාවන්ගේ සංවර්ධනය	**30**
	4.3.1 නව සේවාවන්	**30**
4.4.	යටිතල පහසුකම් සංවර්ධනය	**32**
4.5.	ජාතික ගැටළු සඳහා දායකත්වය	**34**
4.6.	ජාතික ව්‍යාපෘති සඳහා දායකත්වය	**35**
4.7.	මානව සුබ සාධනය සහ සමාජ ආර්ථිකය නැංවීම සඳහා තාක්ෂණය	**37**
4.8.	නව මූලාරම්භයන්	**40**
4.9.	දායකත්වයන්	**41**
05 පරිච්ඡේදය	පරිසර දූෂණය අධීක්ෂණය සහ අවම කිරීම	
5.1.	අපජලය පවිත්‍රකරණය	**43**
5.2.	වායු දූෂණය පාලනය	**43**
5.3.	ශබ්දය අවම කිරීම	**44**
06 පරිච්ඡේදය	තිරසර සංවර්ධනය	
6.1.	සේවා නියුක්ති සංඛ්‍යාලේඛන	**45**
6.2.	තත්ත්ව සහතික	**49**
6.3.	තොරතුරු සේවාවන්	**49**
6.4.	සම්මාන	**50**
6.5.	ධාරිතා සංවර්ධනය	**50**
6.6.	විදේශ පුහුණු වැඩසටහන්	**54**
6.7.	කාර්මික තාක්ෂණ ආයතනයේ යහපැවැත්ම	**55**
6.8.	ප්‍රවර්ධන අවස්ථා	**56**
07 පරිච්ඡේදය	මූල්‍ය කාර්ය සාධනය	**57**
08 පරිච්ඡේදය	පර්යේෂණ ප්‍රතිඵල	
8.1.	යොමුගත ජර්නලවල පළ කිරීම්	**61**
8.2.	ජාත්‍යන්තර සන්නිවේදන	**65**

පටුන

8.3.	ග්‍රන්ථ, පරිච්ඡේද සහ මාර්ගෝපදේශ	**67**
8.4.	පේටන්ට් බලපත්‍ර	**67**
8.5.	අයදුම් කළ පේටන්ට්	**67**
	විධායක කාර්ය මණ්ඩලය	**69**

01 වන පරිච්ඡේදය: හැඳින්වීම

1.1 දැක්ම, මෙහෙවර සහ ගුණාත්මක බව පිළිබඳ ප්‍රතිපත්තිය

දැක්ම

ජාතික සංවර්ධනය සඳහා වන විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණවල විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානය වීම.

මෙහෙවර


ශ්‍රී ලාංකීය ජනතාවගේ යහපත සඳහා සංවර්ධනය වේගවත් කිරීමට නව්‍ය පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම හා ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී තාක්ෂණික සේවා සැපයීම.

ගුණාත්මක බව පිළිබඳ ප්‍රතිපත්තිය

කාර්මික තාක්ෂණ ආයතනයේ ඉහළ කළමනාකාරිත්වය, ISO/ ISO 17025: 2017 සහ ISO 9001: 2015 පිරිවිතරයන්ට අනුකූලව මෙන්ම ජාතික තත්ත්ව ප්‍රතිපත්තියට අනුකූලව සහ අඛණ්ඩව සංවර්ධනය තුළින් ගනුදෙනුකරුවන්ට සේවය සපයන අතර එහි ක්‍රියාකාරකම්වල ගුණාත්මක භාවයට අනුකූලව ගුණාත්මක අරමුණු ස්ථාපිත කරමින් සහ සමාලෝචනය කරමින් ඉහළ මට්ටමේ වෘත්තීය භාවිතයන් සඳහා කැපවී සිටී.

සේවා ප්‍රමිතිය අවදානමට ලක් නොවන අතර තත්ත්ව කළමනාකරණ පද්ධති (QMS) පවත්වා ගෙන යාමෙන් සහ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමෙන් සහ ප්‍රකාශිත ක්‍රම සහ පාරිභෝගික අවශ්‍යතාවලට අනුකූලව ස්වාධීන සහ අපක්ෂපාතී සත්‍ය දත්ත සැපයීමෙන් ඉහළම පාරිභෝගික තෘප්තිය ළඟා කර ගැනීමට කාර්මික තාක්ෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය උත්සාහ කරයි. QMS හි කාර්යක්ෂමතාවය අඛණ්ඩව වැඩිදියුණු කිරීමට කාර්මික තාක්ෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය ද කැපවී සිටිති.

1.2 සංවිධාන ව්‍යුහය


සභාපති සහ
කළමනාකරණ
මණ්ඩලය
අභ්‍යන්තර
විගණන
අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ
කමිටුව
පර්යේෂණ සහ සංවර්ධන අංශය (R&D)
ආහාර තාක්ෂණ අංශය (FTS)
ශාක සාර තාක්ෂණ අංශය (HTS)
ද්‍රව්‍ය තාක්ෂණ අංශය (MTS)
පාරිසරික තාක්ෂණ අංශය (ETS)
ජෛවතාක්ෂණ අංශය (BTS)
තාක්ෂණ සේවා අංශය (TS)
රසායනික සහ ක්ෂුද්‍ර ජීව විද්‍යා රසායනාගාරය (CML)
ද්‍රව්‍ය තාක්ෂණ රසායනාගාරය (ML)
කර්මාන්ත මිනුම් රසායනාගාරය (IML)
විද්‍යුත් තාක්ෂණ රසායනාගාරය (ETL)
අවශේෂ විශ්ලේෂණ රසායනාගාරය (RAL)
ඛනිජ තෙල් සහ ලිහිසි ද්‍රව්‍ය පර්යේෂණ රසායනාගාරය (PLTL)
ඖෂධ රසායනාගාරය (PL)
පරිගණක ඒකකය (CU)
තොරතුරු සේවා මධ්‍යස්ථානය (ISC)
පරිපාලන හා මෙහෙයුම් අංශය (A&O)
මානව සම්පත් දෙපාර්තමේන්තුව (HRD)
අලෙවිකරණ සහ ව්‍යාපාර සංවර්ධන දෙපාර්තමේන්තුව (MBD)
ඉංජිනේරු සේවා (ES)
ප්‍රවාහන ඒකකය (TU)
මූල්‍ය දෙපාර්තමේන්තුව (FD)
ගබඩා (STO)
සැපයුම් (SUP)
තත්ත්ව සුපරීක්ෂණ දෙපාර්තමේන්තුව (QAD)

02 වන පරිච්ඡේදය: උපාය මාර්ගික කාර්ය සාධනය

2.1 සභාපතිතුමාගේ පණිවුඩය

රටේ සංවර්ධනය සඳහා විද්‍යාත්මක කාර්මික පර්යේෂණවල නියැලී සිටින ප්‍රමුඛතම පර්යේෂණ සහ සංවර්ධන ආයතනය වන කාර්මික තාක්ෂණ ආයතනයේ (ITI) වාර්ෂික වාර්තාව - 2020 වෙත මෙම පණිවිඩය යැවීමට ලැබීම පිළිබඳව මම ඉමහත් සතුටට පත්වෙමි.

ආයතනය වෙත පවරා ඇති කාර්යයන් නිසි ලෙස සපුරාලමින්, ආයතනය පසුගිය වසර හැටපහ පුරා ක්‍රමානුකූලව වර්ධනය වී ඇති අතර, පරීක්ෂණ සේවා, කාර්මික ක්‍රමාංකනය සහ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා පර්යේෂණ ඇතුළු විවිධ විද්‍යාත්මක විෂය ක්ෂේත්‍ර ගණනාවකින් එහි කුසලතා, ප්‍රවීණත්වය සහ නිපුණතා අඛණ්ඩව පුළුල් කර ඇත. 1955 දී Ceylon Institute of Scientific and Industrial Research (CISIR) ලෙස ආරම්භ කරන ලද එය නව්‍ය පර්යේෂණ සහ සංවර්ධන, තාක්ෂණ සංවර්ධනය, තාක්ෂණික සේවා සහ ධාරිතා වර්ධනය, විද්‍යා හා තාක්ෂණ මිනිස් බල සංවර්ධනය සහ රටේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර අංශයේ නිපුණතා වැඩි දියුණු කිරීම ඇතුළු රටේ පුළුල් පරාසයක විද්‍යා හා තාක්ෂණ අවශ්‍යතා සඳහා මැදිහත් වීම තුළින් ජාතික සංවර්ධනයට ඉමහත් දායකත්වයක් ලබා දී ඇත.

2020 පෙබරවාරි මාසයේදී පත් කරන ලද කාර්මික තාක්ෂණ ආයතනයේ වත්මන් කළමනාකරණ මණ්ඩලයට 2020 මුල් භාගයේදී රට තුළ ව්‍යාප්ත වීමට පටන් ගත් ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ හදිසි ඉල්ලීම් සපුරාලීම සඳහා එහි හැකියාවන් වැඩිදියුණු කිරීමේ අභියෝග රාශියක් තිබුණි. කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීමේ ඉල්ලීම් සපුරාලීමේදී රජයට ද අභියෝගවලට මුහුණ දීමට සිදු වූ අතර ඒ සඳහා රටේ පර්යේෂණ සහ සංවර්ධන සහ පරීක්ෂණ ආයතනවලින් විද්‍යා හා තාක්ෂණ යෙදවුම් අවශ්‍ය විය. කාර්මික තාක්ෂණ ආයතනය, එහි දක්ෂ කාර්ය මණ්ඩලය සමඟ, කොවිඩ් -19 වසංගතයේ වැළැක්වීමේ ක්‍රියාවලියට සහ කළමනාකරණ අංශවලට සහාය වීම සඳහා අදාළ ලියාපදිංචි අධිකාරීන් වෙත පෙව වෛද්‍ය නිෂ්පාදන ලියාපදිංචි කිරීම සඳහා වඩාත්ම අවශ්‍ය විශ්ලේෂණ සේවා සපයන ලදී. එයින්ද නොනැවතී, කාර්මික තාක්ෂණ ආයතනය, අත් සේදුම් විෂබීජ නාශක නිෂ්පාදන පහසුකම ස්ථාපිත කරන ලද අතර, ගුණාත්මක බවින් යුත් මධ්‍යසාර මත පදනම් වූ අත්සේදුම් විෂබීජ නාශක සැපයීම සඳහා GMP සහ WHO මාර්ගෝපදේශ සපුරාලමින් අමාත්‍ය මණ්ඩලයේ මගපෙන්වීම මත රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව සහ සතොස අලෙවිසැල් හරහා මහජනතාවට ලබා ගැනීමට ඉඩ සලසන ලදී.

සාමාන්‍යකරණය වූ නව තත්වයන්, 4 වන කාර්මික විප්ලවයේ ඉල්ලීම් සහ සමාජ-ආර්ථික, තාක්ෂණික, පාරිසරික සහ දේශපාලන භූ දර්ශනයේ තත්වය සහ ගෝලීය වෙළඳපලවල ගතිකතාවයන් සමඟ, ගෝලීය වශයෙන් නිර්මාණය කර ඇති නව ඉල්ලීම් සපුරාලීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය දැනට පවතින කළමනාකරණය සහ මෙහෙයුම් ව්‍යුහය වෙත ක්‍රමෝපායික වෙනස්කම් ඉදිරිපත් කිරීමට යෝජනා කළේය. මෙම සන්දර්භය තුළ, කාර්මික තාක්ෂණ ආයතනයේ ඇගයීම සහ දැනුම පදනම් කරගත් ආර්ථිකයක් සඳහා කාර්මික සංවර්ධනවල දියුණුවේ ඉල්ලීම් සපුරාලීම සඳහා නිර්දේශ යෝජනා කිරීම සඳහා ජාතික විද්‍යා සහ තාක්ෂණ කොමිෂන් සභාවේ යෝජනාව මණ්ඩලය විසින් අනුමත කරන ලදී. එමෙන්ම, වසර කිහිපයකට පෙර පාර්ශ්වකරුවන්ගේ සියලුම විද්‍යා හා තාක්ෂණ අවශ්‍යතා සපුරා ගැනීම පිණිස "සියල්ල එක තැනකින් ලබාගත හැකි" මධ්‍යස්ථානයක්

ස්ථාපිත කිරීමේ ක්‍රියාවලිය මණ්ඩලය විසින් නැවත ආරම්භ කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, කාර්මික තාක්ෂණ ආයතනයේ කොළඹ පරිශ්‍රයේ විද්‍යා හා තාක්ෂණ ව්‍යාපාර මධ්‍යස්ථානය (S&T BC) පිහිටුවීමට මණ්ඩලය අනුමැතිය ලබාදුන් අතර S&T BC කටයුතුවලට සහාය වීම සඳහා විද්‍යා හා තාක්ෂණය පදනම් කරගත් පෞද්ගලික අංශයේ ආයතනවල ප්‍රමුඛ පෙළේ පුද්ගලයින්ගෙන් උපදේශක කමිටුවක් පත් කරන ලදී.

කාර්මික තාක්ෂණ ආයතනයෙ තාක්ෂණික හැකියාවන් ශක්තිමත් කිරීමේ දී, එහි උසස් විශ්ලේෂණ පහසුකම් සඳහා නව උසස් උපකරණ කිහිපයක් එක් කරන ලද අතර විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ නව ආචාර්ය සහ විද්‍යාපති උපාධිධරයන් කිහිප දෙනෙකු කාර්ය මණ්ඩලයට ඇතුළත් කරගනු ලැබීය. කොවිඩ් -19 වසංගතය සහ නැවත නැවත රට වසා දැමීම් මධ්‍යයේ 46.4% වියදම් ප්‍රකෘතිමත් වීමක් සමග පෙර වසරට සාපේක්ෂව ආදායම් උත්පාදනය සුළු පහත වැටීමක් විය. තවද, සේවා සැපයීම කෙරෙහි බලපෑමක් එල්ල කරමින් කාර්ය මණ්ඩලය ආසාදනය වීම වළක්වා ගැනීම සඳහා ඉතා කෙටි කාලයක් තුළ කාර්ය මණ්ඩලයේ සියල්ලන්ට එන්නත් කිරීම යනාදී උපක්‍රමික ක්‍රියාමාර්ග තුළින් කාර්මික තාක්ෂණ ආයතනය අඛණ්ඩ සේවාවක් ජාතියට තහවුරු කළේ ය. වසංගතය හේතුවෙන් ඇති වූ බොහෝ අවාසි මධ්‍යයේ වුවද, උපාය මාර්ගික විසඳුම් ක්‍රියාවට නැංවීමත් සමග, රට තුළ ආර්ථික නැග්මක් ඇති කිරීම සඳහා "සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්ති රාමුව සමග සම්බන්ධ වෙමින් කාර්මික තාක්ෂණ ආයතනය වසර තුළ සැලකිය යුතු ලෙස ප්‍රගතියක් ලබා ඇත. එබැවින්, ප්‍රමුඛතම කාර්මික පර්යේෂණ ආයතනය සහ ජාත්‍යන්තරව පිළිගත් පරීක්ෂණ පහසුකම ලෙස කාර්මික තාක්ෂණ ආයතනයේ තත්ත්වය පවත්වා ගැනීමට සහ කර්මාන්තයේ සහ මහජනතාවගේ ඉල්ලීම් සපුරාලීම සඳහා කටයුතු කිරීමට දරන ව්‍යායාමයන් පිළිබඳව මණ්ඩලය වෙනුවෙන්, ආයතනයේ කාර්ය මණ්ඩලයට සහ කළමනාකාරීත්වයට ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි.

ආචාර්ය සිරිමල් ප්‍රේමකුමාර PhD
සභාපති

2.2 අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

වසර 65 කට අධික කාලයක් පුරා, ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණ ආයතනයේ (CISIR) අනුප්‍රාප්තික වූ කාර්මික තාක්ෂණ ආයතනය (ITI) විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය තුළින් විවිධාකාර වූ අභියෝගයන් විසඳාලමින්, පර්යේෂණ සහ සංවර්ධනය, උපදේශනය, තාක්ෂණික හුවමාරුව, පුහුණු කිරීම් ඔස්සේ කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය කරමින් සහ ජාත්‍යන්තර තරගකාරී පරීක්ෂණ සහ ක්‍රමාංකන සේවාවන් තුළින් රටේ ආර්ථික සංවර්ධනයට දායක වෙමින් සිටී. 2020 නොවැම්බර් මස තෙක් ආයතනය විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය යටතේ සහ ඉන්පසු උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය.

කෝවිඩ් 19 ගෝලීය වසංගතය, 2020 මාර්තු 15 වන දින පළමු වරට රට වසා දැමීමේ සිට කාර්මික තාක්ෂණ ආයතනය ඇතුළු ශ්‍රී ලංකාවේ අංශ ගණනාවක කටයුතුවලට බාධා කරන ලදී. කොවිඩ් 19 ආශ්‍රිත වසා දැමීම් හේතුවෙන් පරීක්ෂණ සහ ක්‍රමාංකන, පර්යේෂණ සහ සංවර්ධන සේවා, සැපයුම් දාම සහ කාර්ය සම්පාදනය යනාදී ක්ෂේත්‍රයන්ට දැඩි බලපෑම් ඇති වූ අතර කටයුතු කිරීමට සිදු වූයේ අවම කාර්ය මණ්ඩලයක් සමගිනි. 2020 වසංගතය තුළ දේශීය කර්මාන්ත සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා

දෙමින් කාර්මික තාක්ෂණ ආයතනය මෙම අභියෝගවලට කැපවීමෙන්, නිර්මාණශීලීත්වයෙන් සහ නොපසුබට උත්සාහයෙන් මුහුණ දුන්නේය. ශ්‍රී ලංකාවේ තාක්ෂණික නායකත්වය සහ තාක්ෂණික ස්වෛරීභාවය සහතික කරගැනීමේ අපගේ කාර්යභාරය සම්පූර්ණයෙන් ඉටු කිරීම සඳහා, කාර්මික තාක්ෂණ ආයතනය වසංගතය අතරතුර ඉහළ ඔරොත්තු දීමේ හැකියාවක් ප්‍රදර්ශනය කළේය. ශ්‍රී ලංකා රජයේ සහ දේශීය සහ විදේශීය ප්‍රදාන ආයතනවල සහාය ඇතිව කාර්මික තාක්ෂණ ආයතනයට එහි ඒකාබද්ධ ප්‍රයත්නයන් තුළින් ව්‍යවහාරික පර්යේෂණ සහ සංවර්ධන, පරීක්ෂණ සහ ක්‍රමාංකන සේවාවන්හි ප්‍රමුඛ සංවිධානයක් ලෙස එහි භූමිකාව පවත්වාගෙන යාමට සහ තහවුරු කිරීමට හැකි විය.

මෙම වාර්ෂික වාර්තාව 2020 වසරේ කාර්මික තාක්ෂණ ආයතනයේ ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක්, උපක්‍රමික කාර්ය සාධනය සහ ක්‍රියාකාරී සැලැස්ම, 2020 දී සැලසුම් සහගත අරමුණුවලට එරෙහිව කාර්ය සාධන ඉස්මතු කිරීම් සහ ප්‍රතිඵල, දූෂණය අධීක්ෂණය සහ අවම කිරීම, මූල්‍ය කාර්ය සාධනය සහ අපගේ දායකත්වය සහ ගුණාත්මක සේවාවන් රජයට, කර්මාන්තවලට, රාජ්‍ය නොවන සංවිධානවලට සහ ප්‍රජාවට විශාල වශයෙන් ලබා දීම පිළිබඳව තොරතුරු සපයයි.

පළමුවෙන්ම, කාර්මික තාක්ෂණ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය වෙතින් ලැබෙන අගනා මාර්ගෝපදේශය සහ උපදෙස් ඇගයීමට මම මෙය අවස්ථාවක් කරගනිමි. දෙවනුව, දැඩි කැපවීමෙන් සහ සහයෝගීතාවයෙන් යුතුව විශේෂ පැවරුම් භාර ගනිමින්, විද්‍යාත්මක හා පරිපාලන කටයුතු සඳහා බහුවිධ ප්‍රවේශයක් අනුගමනය කරමින් මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන ගිය කාර්මික තාක්ෂණ ආයතනයේ කළමනාකරණ කමිටුවට, කාර්මික තාක්ෂණ ආයතනයේ කාර්ය මණ්ඩලයට සහ සගයන්ට මාගේ කෘතඥතාව පුද කරන්නෙමි. ඔවුන්ගේ නොමද සහයෝගය සහ සහයෝගීතාවය නොවන්නට, 2020 දී පැවති කොවිඩ්-19 වසංගතය හේතු වූ ආර්ථික තත්ත්වයන් නිසා ඇති වූ කැලඹිලි සහිත කාලවලදී කාර්මික තාක්ෂණ ආයතනයට සිය ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වනු ඇත.

2020 දී අපි පර්යේෂණ සංක්‍රාන්තියට සහ පර්යේෂණ ප්‍රතිඵල වාණිජකරණයට පහසුකම් සලසන අතරම, ජාතික ප්‍රතිපත්ති රාමුවක් වන 'සෞභාග්‍යයේ සහ කාර්මික ඉල්ලුමේ දැක්ම' රාජ්‍ය ප්‍රමුඛතා සමග සමපාත වන ක්ෂේත්‍රවල විද්‍යා හා තාක්ෂණය සහ නවෝත්පාදන කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කළෙමු. වසර තුළදී කාර්මික තාක්ෂණ ආයතනය සහ ක්‍රමාංකන, පරීක්ෂණ, තාක්ෂණ පැවරීම්, උපදේශනය, ව්‍යාපෘති කොන්ත්‍රාත් සහ පුහුණුව ඇතුළු සේවා 15,000 කට වැඩි ප්‍රමාණයක් සිදු කළ අතර ශ්‍රී ලාංකීය කර්මාන්ත, ජාත්‍යන්තර ආයතන ඇතුළු සේවාදායකයන් 18,000 කට වැඩි ප්‍රමාණයක් සමග සහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් 1000 කට වැඩි ප්‍රමාණයක් සමග කටයුතු කළේ ය.

දක්ෂිණ කලාපයේ තිරසර සංවර්ධනය සඳහා විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (COMSATS), කාර්මික සහ තාක්ෂණික පර්යේෂණ සංවිධාන සංගමය (WAITRO), උණ සහ වේවැල් පිළිබඳ ජාත්‍යන්තර ජාලය (INBAR), එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO), එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO), Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP). චීනයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, යූනාන් ග්‍රාමීය විද්‍යා හා තාක්ෂණ සේවා මධ්‍යස්ථානය සහ යූනාන් කෘෂිකර්ම විශ්ව විද්‍යාලය, කරච්චි විශ්ව විද්‍යාලයේ රසායනික ජීවවිද්‍යා සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය, කොරියානු බුද්ධිමය දේපළ කාර්යාලය (KIPO), රාජ්‍ය පරිපාලනය පිළිබඳ කොරියානු කාර්යාලය (KIPA) අර්ධ ශුෂ්ක නිවර්තන කලාප සඳහා ජාත්‍යන්තර බෝග පර්යේෂණ ආයතනය (ICRISAT) සහ

එක්සත් ජනපදයේ ටොලේඩෝ විශ්ව විද්‍යාලය සමග කාර්මික තාක්ෂණ ආයතනය දීර්ඝකාලීන සහයෝගයන් සහ ඒකාබද්ධ වැඩසටහන් ඉදිරියට ගෙන ගියේය.

තාක්ෂණය පැවරීම්

ප්‍රධාන තාක්ෂණ පැවරීම් ගිවිසුම් තුළින් සම්පූර්ණ කෙරිණි. මේවාට ඇතුළත් වන්නේ; (අ) අපනයන වෙලඳපොල ඉලක්ක කර ගනිමින් එහි අනන්‍ය රසය සහ ඖෂධීය වටිනාකමින් යුත් මධ්‍යසාර කිතුල් පානයක්. රාජ්‍ය ගෙවීමද ඇතුළුව රු.මි. 20.5 ක වටිනාකමක් සහිත මෙම පානය සඳහා තනි අයිතිය Agri Deshiya (Pvt) Ltd හට හිමි වන අතර එය කාර්මික තාක්ෂණ ආයතන ඉතිහාසය තුළ තාක්ෂණයක් සඳහා වන ඉහළම වාර්තාගත මූල්‍ය ගනුදෙනුව වේ. (ආ) තෙල් කාන්දුවීම් ඉවත් කිරීම සඳහා නවීකරණය කරන ලද කොහුබත් මත පදනම් වූ ද්‍රව්‍ය සහ එහි යෙදවුම් නිෂ්පාදන Taprobane International Ltd වෙත අලෙවි කරන ලදී. (ඇ) ආනයනික අර්තාපල් තීරු සඳහා ආදේශකයක් ලෙස දේශීයව වගා කරන ලද අර්තාපල් ප්‍රභේදවලින් ශීත කළ අර්තාපල් තීරු, කෘෂිකර්ම අමාත්‍යාංශයේ කුඩා වතු හිමියන්ගේ කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසටහනේ (SAPP) සහාය ඇතිව JGS-Kahaththawela Ltd වෙත අලෙවි කරන ලදී.

සමාලෝචන වර්ෂය තුළදී, නව ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යාපාර වැඩිදියුණු කිරීමට හෝ විෂය පථය පුළුල් කිරීමට සහය වන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (MSMEs) වෙත තාක්ෂණයන් 60කට වඩා පවරන ලදී. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත පවරන ලද ප්‍රධාන තාක්ෂණ අතරට කොවිඩ්-19 ට එරෙහිව ඖෂධ පැළෑටි පදනම් කරගත් සත්කාර නිෂ්පාදන, අඩු මිලට බෝතල් කළ අයිස් කෝපි, රස කළ කිරි පානයක්, අඹ පල්ප්, අඹ පාන, අඹ කල් තබා ගැනීම, පිළිගැන්වීමට සූදානම් බීම, පළතුරු සහ එළවළු විජලනය කිරීමේ තාක්ෂණය ශීත කළ පළතුරු සහ එළවළු සැකසීමේ තාක්ෂණයන්, කුළුබඩු සැකසීමේ තාක්ෂණයන්, වරකා මත පදනම් වූ නිෂ්පාදන, පොළොස්වලින් මස් ආදේශක , හතු සහ ධාන්‍ය වර්ග වලින් සත්ත්ව කොටස්වලින් තොර නිෂ්පාදන සහ උසස් තත්ත්වයේ ග්‍රැෆින් පදනම් වූ ද්‍රව්‍ය, අලි අනතුරු පූර්ව අනතුරු ඇඟවීම් සහ අනතුරු ඇඟවීමේ පද්ධතියක්, ශාකසාර ආලේපන , අත් සනීපාරක්ෂක, ඖෂධීය තේ සහ ගෘහ ආරක්ෂණ නිෂ්පාදන ඇතුළත් වේ.

මීට අමතරව, කිතුල් සක්‍රීය කිරීමේ සහ යුෂ නිෂ්පාදන ප්‍රතික්‍රියාකාරක (KASPER) තාක්ෂණය APIC Agro Pvt Ltd සහ කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) සමඟ අඛණ්ඩව පවත්වාගෙන යාමට බලපත්‍ර ගිවිසුම් අත්සන් කරන ලදී. ක්ෂුද්‍ර ව්‍යවසාය (MEs) සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ආරම්භ කිරීමට/ප්‍රවර්ධනය කිරීමට සහ විදාතා මධ්‍යස්ථාන සහ විදාතා ව්‍යවසායකයන් හරහා ග්‍රාමීය කාර්මික සංවර්ධනය තුළ නව ව්‍යවසායන් ආරම්භ කිරීමට අවශ්‍ය තාක්ෂණය සැපයීමද කාර්මික තාක්ෂණ ආයතනය අඛණ්ඩව සිදු කළේ ය.

පර්යේෂණ සංවර්ධනය සහ නවෝත්පාදනය

විශිෂ්ට පර්යේෂණ, තාක්ෂණය සහ නවෝත්පාදන තුළින් ජාතියට සේවය කිරීමට ලැබීම භාග්‍යයක් ලෙස අපි සලකමු. ජාතික රජයට හිමි විශාලතම විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන ආයතනය ලෙස කාර්මික තාක්ෂණ ආයතනය, රජය, ශ්‍රී ලංකාව සහ විදේශීය පර්යේෂණ ජාලය, කර්මාන්ත සහ විශ්ව විද්‍යාල සමග

සහයෝගයෙන් වැඩ කරමින් තාක්ෂණ නවෝත්පාදන ලබාදීමේ අපේ මූලික අරමුණ අඛණ්ඩව සපුරාලයි. 2020 වසරේදී කර්මාන්ත සහ පාරිභෝගික ඉල්ලීම මත පදනම්ව පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කරන ලද අතර මෙම ව්‍යාපෘති, ආහාර, සෞඛ්‍යය, ජෛව තාක්ෂණය, ද්‍රව්‍ය, පරිසරය, ස්වභාවික සම්පත්, මිතිවේදය, විද්‍යුත්තාක්ෂණය සහ අනාගත කර්මාන්ත යනාදී ක්ෂේත්‍ර ආවරණය කරයි. වාණිජකරණය සඳහා මෙම ව්‍යාපෘතිවලින් තාක්ෂණයන් ගණනාවක් සංවර්ධනය කෙරිණි. කාර්මික තාක්ෂණ ආයතනය තාක්ෂණික ගැටළු සම්බන්ධව කටයුතු කළ අතර කර්මාන්ත සහ සමාජයට විසඳුම් සපයන ලදී.

කාර්මික තාක්ෂණ ආයතනය විසින් මෙම වසර පුරා කොවිඩ්-19 ට එරෙහිව සටන් කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කර ඇත. සංවර්ධනය කරන ලද ප්‍රධාන නිෂ්පාදන අතරට දියර සහ ජෙල් විෂබීජනාශක අත් සේදුම්, ඖෂධීය මුඛ සේදීම, විෂබීජනාශක අත් සේදුම් ඩිස්පෙන්සය සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම, COVID-19 ප්‍රතිදේහජනක හඳුනාගැනීම සඳහා වේගවත් රෝග විනිශ්චය කට්ටලයක්, මීදුම උමඟ, සහ O_3 උත්පාදක ඇතුළත් වේ. කාර්මික තාක්ෂණ ආයතනයේ ඖෂධ පැළැටි මත පදනම් වූ නෙබියුලයිස් කිරීමේ කාරකයක් සහ ඉන්හේලරයක්, අතේ ගෙන යා හැකි ශාකසාර ස්ටීමරය, ආයුර්වේද ශරීර ආලේපන, අත්සේදුම්, ගෘහස්ථ ප්‍රතිබැක්ටීරීය මතුපිට පිරිසිදු කිරීමේ ජෙල්, සනීපාරක්ෂක දුම් නිෂ්පාදන, පොල්තෙල් එස්ටර- පදනම් වූ ප්‍රති-ක්ෂුද්‍ර ජීවී මතුපිට විෂබීජ නාශක කාරකය, පලතුරු සහ එළවළු සේදීම සඳහා Bio Surf සහ Bio Surf මතුපිට විෂබීජ නාශක, ශරීර දියර, Bio wet wipes සහ Bio G විනිවිද පෙනෙන සබන් සහ කැප්සියුල, පෙති, ඖෂධීය තේ, ඖෂධීය ෂොට්, සිරප් වැනි ප්‍රතිශක්තිකරණ වර්ධක, ලොසින්ජර් සහ පස්පංගුව, කොල්ලු නිෂ්පාදන, ඔසු කැඳ, දෙහි සමස්ථානික ශක්ති වර්ධක සහ ගම්මිරිස්, කොත්තමල්ලි, කහ සහ ඉඟුරු ආශ්‍රිත නිෂ්පාදන කොවිඩ්-19 වසංගත කාලසීමාව තුළ එහි පර්යේෂණ හා සංවර්ධනය තුළින් සංවර්ධනය කරන ලදී.

වාණිජකරණය සඳහා පර්යේෂණ සහ සංවර්ධන හරහා සංවර්ධනය කරන ලද අනෙකුත් ප්‍රධාන තාක්ෂණ අතරට දේශීය ග්‍රෑෆයිට්වලින් ලිහිසි තෙල් නිෂ්පාදන, විද්‍යුත් රසායනික යෙදුම් සඳහා ග්‍රෑෆයිට් මත පදනම් වූ සංයුක්ත ඉලෙක්ට්‍රෝඩයක්, ග්‍රැෆීන් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අපජල පවිත්‍රාගාරයක්, අඩු වියදම් ජෛව හායනයට ලක්විය හැකි ප්ලාස්ටික් පටල, ඉහළ නිරවද්‍යතාවයකින් යුත් නාලිකා 4 wi -fi උෂ්ණත්වමානය සහ අපද්‍රව්‍ය whey වලින් ක්‍රියාකාරී බීම නිපැයීම ඇතුළත් වේ..

තාක්ෂණික සේවා

කාර්මික තාක්ෂණ ආයතනයේ පරීක්ෂණ සේවාවල ප්‍රායෝගික අත්දැකීම් සහ සාර්ථකත්වයන් අනුගමනය කරමින්, 2020 දී අපි මෙම ජාත්‍යන්තරව පිළිගත් ප්‍රතීතනය ලත් සේවාවන් කාර්මික තාක්ෂණ ආයතනයේ ප්‍රවීණතා පරාසය දේශීය කර්මාන්ත සහ රාජ්‍ය ආයතන පුරා ලබා දීමට දිගටම කටයුතු කළෙමු. මෙම පරීක්ෂණ සේවා රසායනික, ජලය, අපජලය, ආහාර, කෘෂි නිෂ්පාදන, විලවුන්, ඖෂධ, පළිබෝධනාශක, මධ්‍යසාර, ද්‍රව්‍ය, ලිහිසි තෙල් සහ පෙට්රෝලියම් තෙල්, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ඇසුරුම් සහ ශාකසාර ඖෂධ, කුළුබඩු සහ අත්‍යවශ්‍ය තෙල්, ජෛව තාක්ෂණය, පළිබෝධනාශක අපද්‍රව්‍ය, බැර ලෝහ සහ මයිකොටොක්සින් වැනි පාරිසරික දූෂිත ද්‍රව්‍ය අවම කිරීම සහ සොයා බැලීම යන ක්ෂේත්‍ර ආවරණය කරයි.

කාර්මික තාක්ෂණ ආයතනයේ ජංගම විද්‍යාගාරය භාවිතා කරමින් වායු ගුණාත්මක බව සහ වායු විමෝචක අධීක්ෂණය, වායු දූෂණ පාලනය සහ අවම කිරීම, අපජල පවිත්‍රකරණය, ඝන අපද්‍රව්‍ය

කළමනාකරණය, ජල තත්ත්ව අධ්‍යයනය, අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණය, සහ 2020 වසරේ පාරිසරික බලපෑම් ඇගයීම ඇතුළු පාරිසරික තාක්ෂණයේ විවිධ විෂය ක්ෂේත්‍රවල සේවා 500 කට අධික ප්‍රමාණයක් කාර්මික තාක්ෂණ ආයතනය විසින් ලබා දෙන ලදී. රට තුළ විදුලිබල හා බලශක්ති, මාර්ග, මහාමාර්ග, දුම්රිය, කර්මාන්ත සහ නාවික අංශ සඳහා මිනුම්, බලපෑම් අවම කිරීම, අනාවැකි සහ ධ්වනි ආකෘති නිර්මාණ සේවා ඇතුළු ශබ්ද සහ කම්පන තක්සේරු අධ්‍යයනයන් ද සපයන ලදී.

සමාලෝචිත වර්ෂය තුළදී, දේශීය කර්මාන්ත සහ අපනයන කර්මාන්ත සඳහා සහාය වීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය විෂය පථය පුළුල් කළ අතර සහ අත් සේදුම් කාරක, මුහුණු ආවරණ, නිරෝධායන, විෂබීජ නාශක, ධූම නාශක, ගෘහ සහ රෝහල් පිරිසිදු කිරීමේ නිෂ්පාදන, ආයුර්වේද සහ ශාකසාර නිෂ්පාදන සහ ප්‍රතිශක්තිය/ශක්තිය වැඩි කරන ආහාර නිෂ්පාදන ඇතුළුව කොවිඩ්-19 ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂණ සඳහා සහාය වීම සඳහා නව පරීක්ෂණ සේවා ස්ථාපිත කරන ලදී.

තත්ත්ව යටිතල පහසුකම්

ආයතනය, පර්යේෂණ සහ සංවර්ධන අංශය සහ තොරතුරු සේවා මධ්‍යස්ථානය සඳහා ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකය සමග අඛණ්ඩව ඉදිරියට ගමන් කළේ ය. කාර්මික තාක්ෂණ ආයතනයේ දැනට පවතින රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය, ISO/IEC 17025:2017 තාක්ෂණික සේවා අංශය සඳහා නඩත්තු කරන ලද අතර රසායන, ආහාර, සහ ජලය, අපජල, විලවුන්, ද්‍රව්‍ය, සිමෙන්ති, රබර් සහ පිහන් මැටි), ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරාමිතීන්, රසායනික අපද්‍රව්‍ය, ලෝහ අපද්‍රව්‍ය සහ කාර්මික ශබ්ද සහ කම්පන මිනුම්. සඳහා පරීක්ෂණ 675 කට අධික ප්‍රමාණයක් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) විසින් ප්‍රතීතනය කර ඇත. කාර්මික මිනුම් විද්‍යාගාරය ISO/IEC17025:2017 ස්කන්ධය, මානයන්, පරිමාව, විද්‍යුත්, බලය, පීඩනය සහ උෂ්ණත්වය මැනීම සඳහා රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය සහ කොරියානු ප්‍රමිති හා විද්‍යා පර්යේෂණ ආයතනය (KRISS), දකුණු කොරියාව සහ ජර්මනියේ Physikalisch -Technische Bundesanstalt (PTB) සහ තායිලන්තයේ ජාතික මිනුම් විද්‍යා ආයතනය හරහා SI ඒකක සඳහා මිනුම් සොයා ගැනීමේ හැකියාව අඛණ්ඩව පවත්වාගෙන ගියේය.

කාර්මික තාක්ෂණ ආයතනය වෙත, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ISO/IEC 17043:2010 ප්‍රවීණතා පරීක්ෂණ සඳහා ප්‍රතීතනය ප්‍රදානය කළ අතර ඒ අනුව කාර්මික තාක්ෂණ ආයතනය ශ්‍රී ලංකාවේ පිළිගත් පළමු PT සැපයුම්කරු බවට පත් විය. කාර්මික තාක්ෂණ ආයතනය ජල ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ආහාර ක්ෂුද්‍ර ජීව විද්‍යාව සහ ජාතික තත්ත්ව යටිතල පහසුකම තුළ වැදගත් අංගයක් වන සිමෙන්ති සඳහා රසායනික සහ භෞතික පරීක්ෂාව සම්බන්ධ PT වැඩසටහන් පවත්වයි. UNIDO හි සහාය ඇතිව අලුතින් ස්ථාපිත ඇසුරුම් පරීක්ෂණය රසායනාගාරයට ප්‍රතීතන තත්ත්වය යොදන ලදී.

යටිතල පහසුකම් සංවර්ධනය

කාර්මික තාක්ෂණ ආයතනයේ පරීක්ෂණ උපකරණ ඇතුළු අවශ්‍ය යටිතල පහසුකම් සඳහා රජයේ අරමුදල් යටතේ ඛනිජ තෙල් සහ ලිහිසි තෙල් පරීක්ෂණ රසායනාගාරය ස්ථාපිත කරන ලදී. රජයේ මූල්‍ය අනුග්‍රහය ඇතිව උසස් ඖෂධ පරාමිතීන් සඳහා පරීක්ෂණ ඇතුළු ඖෂධ නිෂ්පාදන පරීක්ෂා කිරීම සඳහා ජාතික ඖෂධ පරීක්ෂණ රසායනාගාරය කාර්මික තාක්ෂණ ආයතනයේ ස්ථාපිත කරන ලදී. කාර්මික තාක්ෂණ ආයතනය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හරහා FAO සහාය ඇතිව පෛව

තාක්ෂණ අංශය තුළ සජීව ක්ෂුද්‍ර ජීවීන් සඳහා පරිශීලක සහ පරීක්ෂණ රසායනාගාරයක් පිහිටුවීම ආරම්භ කරන ලදී. ජෛව තාක්ෂණ ඒකකය, කාර්මික තාක්ෂණ ආයතනයේ ජෛව තාක්ෂණ පර්යේෂණ සහ පරීක්ෂාවන් සඳහා පිළිගැනීමක් ලබාගැනීමට ජෛව තාක්ෂණ අංශය ලෙසට උත්ශ්‍රේණිගත කෙරිණි.

ප්ලාස්ටික් ද්‍රව්‍ය සාගරය වෙත ඇතුළු වීම සම්බන්ධව කටයුතු කිරීමට සහ සමුද්‍ර කසළ අඩු කිරීමට, එක්සත් රාජධානියේ පරිසර, ධීවර කටයුතු සහ ජලජීවී වගාව පිළිබඳ මධ්‍යස්ථානය (Cefas) විසින් අරමුදල් සපයන පොදු රාජ්‍ය මණ්ඩලීය කසළ වැඩසටහන (CLiP) වෙතින් ක්ෂුද්‍ර ප්ලාස්ටික් පරීක්ෂණ රසායනාගාරය පිහිටුවීමට කාර්මික තාක්ෂණ ආයතනයට උපකරණ ප්‍රදානයක් ලැබුණි. තවද, මෙම CLiP ව්‍යාපෘතියේ කොටසක් ලෙස, කාර්මික තාක්ෂණ ආයතනයේ පරිගණක ඒකකයේ කසළ එක් රැස් කිරීමේ දත්ත ගබඩා කිරීම සඳහා දත්ත පදනමක් සංවර්ධනය කිරීමටද කාර්මික තාක්ෂණ ආයතනයට ප්‍රදානයක් ලැබිණි.

චීනයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය (MOST) සහ ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන පර්යේෂණ අමාත්‍යාංශය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම සහ චීනයේ කුන්මිං හි යුනාන් ග්‍රාමීය විද්‍යා හා තාක්ෂණ සේවා මධ්‍යස්ථානය සහ යුනාන් කෘෂිකාර්මික විශ්ව විද්‍යාලය සමඟ කාර්මික තාක්ෂණ ආයතනය අත්සන් කරන ලද රාමු ගිවිසුම යටතේ විශේෂ ශාක සම්පත්, තේ, කුරුඳු සහ මුරුංගා සහ ඒවායේ කාර්මික යෙදීම් පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ රසායනාගාරය වෙනුවෙන් USD 600,000ක් වටිනා උපකරණ ප්‍රදානයක් කාර්මික තාක්ෂණ ආයතනයට ලැබුණි. කාර්මික තාක්ෂණ ආයතනය ජෛව තාක්ෂණය පිළිබඳ චීන-ශ්‍රී ලංකා ඒකාබද්ධ රසායනාගාරයේ අවසාන වැඩ කටයුතු සිදු කළේය.

විද්‍යා සහ තාක්ෂණ ව්‍යාපාරික මධ්‍යස්ථානය ආරම්භ කරන ලද්දේ කර්මාන්ත, පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සහ ආයෝජකයින් ඇතුළු පාර්ශවකරුවන්ට විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් සේවාවන් සැපයීමට, දේශීය හා ජාත්‍යන්තර ආයතන සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියා කිරීමට සහ 2020 දී ජාලකරණයට වඩා තරහකාරී වාසියක් ලබා ගැනීමට ය.

2020 වසරේ කොවිඩ්-19 වසංගතය අතරතුර මාලඹේ නවීන පර්යේෂණ හා සංවර්ධන සංකීර්ණයේ (MRDC) නියමු පරිමාණ නිෂ්පාදන මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලද අතර, වසංගතය පරාජය කිරීමට ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව සහ ලංකා සතොස අලෙවිසැල් හරහා අත් සේදුම් විෂබීජ නාශක නිෂ්පාදනය කර බෙදා හරින ලදී.

2020 දී, කොවිඩ්-19 වසංගතය ආරම්භ වීමත් සමඟ, රට වසා දැමීමේ සහ නිවසේ සිට වැඩ කිරීමේ කාලය තුළ කාර්මික තාක්ෂණ ආයතනය කාර්ය මණ්ඩලය සඳහා නම්‍යශීලී, සහභාගීත්ව සේවා පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ආයතනයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කරන ලදී. පරිගණක ජාලය ආරක්ෂා කර කළමනාකරණය කිරීම සඳහා වන ෆයර්වෝල්ලයක් මාලඹේ පරිශ්‍රයේ සවිකර ඇති අතර කාර්මික තාක්ෂණ ආයතනයේ කාර්ය මණ්ඩලයට VPN හරහා සෘජුවම අභ්‍යන්තර සම්පත් වෙත ප්‍රවේශ වීමට හැකි විය. LEARN Identity Access Federation හි සාමාජිකයෙකු ලෙස, කාර්මික තාක්ෂණ ආයතනයට 2020 දී Zoom සහ webinar පහසුකම් ලබා ගැනීමට හැකි විය. රැස්වීම්, සාකච්ඡා සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා කාර්ය මණ්ඩලයට සහාය වීම සඳහා Zoom වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම දියත් කරන ලදී. සමාලෝචන වර්ෂය තුළ, පරීක්ෂණ වාර්තා සහ අනෙකුත් පර්යේෂණ ලේඛන ගබඩා කිරීමට පහසුකම් සැලසීම සඳහා ITI Cloud දියත් කරන ලදී.

සම්මාන, පේටන්ට්, ප්‍රකාශන සහ පිළිගැනීම්

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් සංවිධානය කරන ලද ජනාධිපති සම්මාන උළෙලේදී කාර්මික තාක්ෂණ ආයතනයේ විද්‍යාඥයින් විසින් කෘෂිකාර්මික තාක්ෂණික ක්ෂේත්‍රය යටතේ ස්වභාවික කෘෂිකාර්මික පළිබෝධ පාලන කාරකයක් (NAPCA) සංවර්ධනය කිරීම සඳහා විවෘත අංශයෙන් රන් පදක්කම් දෙකක් සහ ක්ෂණික සහල් නිෂ්පාදනයක් වන "Ezy Rice" සංවර්ධනය සඳහා ආහාර තාක්ෂණ ක්ෂේත්‍රය යටතේ වාණිජකරණය වූ කාණ්ඩයෙන් රන් පදක්කම් දෙකක් දිනා ගන්නා ලදී. " ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ (SLASS) පශ්චාත් උපාධි පර්යේෂණ සම්මානයක් සහ SLASS GRC පශ්චාත් උපාධි සම්මාන දෙකක් කාර්මික තාක්ෂණ ආයතනයේ විද්‍යාලට ඔවුන්ගේ ආචාර්ය උපාධි පර්යේෂණ සඳහා ලැබිණි.

2020 වසරේදී ජර්නලවල පර්යේෂණ ලිපි 48 ක් පළ කරනු ලැබූ අතර දේශීය සහ ජාත්‍යන්තර සිම්පෝසියම් තුළ නිබන්ධන 24 ක් හා ජාත්‍යන්තර ප්‍රකාශකයන් සඳහා පොත් පරිච්ඡේද 5 ක් ලියන ලදී. මීට අමතරව, පේටන්ට් බලපත්‍ර 2ක් ලබාගත් අතර වසර තුළදී දේශීය පේටන්ට් 5 ක් සඳහා අයදුම්පත්‍ර ගොනුගත කරන ලදී.

මානව සම්පත් සංවර්ධන

පර්යේෂණ විද්‍යාඥයන් සහ ඉංජිනේරුවන්, පර්යේෂණ තාක්ෂණවේදීන් සහ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරි, ජ්‍යෙෂ්ඨ පරිභෝගික සම්බන්ධතා නිලධාරි, සහ කළමනාකරණ සහකාරවරුන් ඇතුළු තනතුරු තිස් අටක් කාර්ය මණ්ඩලය ලෙස 2020 වසරේ බඳවා ගන්නා ලදී. සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ විද්‍යාඥයන් හතර දෙනෙකු සහ පර්යේෂණ තාක්ෂණවේදියෙකු ඔවුන්ගේ ආචාර්යි උපාධි ලබාගත් අතර විද්‍යාඥයන් දෙදෙනෙක් රසායන විද්‍යාව සහ ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යාව සම්බන්ධ විද්‍යාපති උපාධි සම්පූර්ණ කළහ.

මූල්‍ය කාර්ය සාධනය

2019 දී රුපියල් මිලියන 105 ක ප්‍රාග්ධන ප්‍රදානයක් සහ රුපියල් මිලියන 125 ක ප්‍රතිපාදනයක් කාර්මික තාක්ෂණ ආයතනය වෙත ලැබිණි. නව තාක්ෂණ සංවර්ධනය සහ පරීක්ෂණ හා ක්‍රමාංකන සේවා හරහා වැඩි ආදායමක් උපයා ගැනීම පිණිස පර්යේෂණ සහ සංවර්ධන හා තාක්ෂණික සේවා සඳහා ඉහළ මට්ටමේ උපකරණ මිලදී ගැනීමට මෙම අරමුදල් යොදා ගන්නා ලදී. වසර තුළදී, රුපියල් මිලියන 125න් රුපියල් මිලියන 105ක් යොදා ගනිමින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් කාර්මික තාක්ෂණ ආයතනයට සිය මූල්‍ය ප්‍රගතිය 84%ක් ලෙස වාර්තා කිරීමට හැකි විය. ආයතනයේ පුද්ගල වැටුප් සහ පුනරාවර්තන වියදම් සඳහා පුනරාවර්තන ප්‍රදානයක් ලෙස 2020 වසරේදී රුපියල් මිලියන 250ක් ලැබිණි.

ආයතනයේ ආදායම 2019 දී රුපියල් මිලියන 335 සිට 2020 දී රුපියල් මිලියන 285 දක්වා අඩු වී ඇති අතර, එම කාලය තුළ පුනරාවර්තන වියදම් රුපියල් මිලියන 589 සිට රුපියල් මිලියන 553 දක්වා අඩු විය. ආදායම්/පුනරාවර්තන වියදම් අනුපාතය 51.4% සිට 46.4% දක්වා සුළු අඩුවීමක් පෙන්නුම් කළේය. පරීක්ෂණ සහ ක්‍රමාංකන සේවාවලින් ආයතනය තම ආදායමෙන් ඉහළ ප්‍රතිශතයක් උපයා ඇති අතර එය ජනනය කරන ලද ආදායමෙන් 63% (රුපියල් මිලියන 164) කි. තාක්ෂණ හුවමාරුව, තාක්ෂණික පුහුණුව ඇතුළු පුහුණු වැඩසටහන්, උපදේශනය සහ කොන්ත්‍රාත් ව්‍යාපෘතිවලින් ලැබූ ආදායම 37%ක් පමණ වේ.

තාක්ෂණය පැවරීම වලින් ලැබූ ආදායම 2019 දී තිබූ මි.7.5, 2020 වසරේදී මිලියන 11.5 දක්වා වැඩි විය. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් කොන්ත්‍රාත් ව්‍යාපෘතිය සහ පුහුණු ආදායම අඩු විය. වසංගතය නිසා රට වසා දැමීමේදී එයට ඔරොත්තු දෙන උපාය මාර්ගයක් ලෙස, කාර්මික තාක්ෂණ ආයතනය විසින් රජයෙන් අවශ්‍ය අනුමැතිය සහිතව අත් සේදුම් විෂබීජ නාශක නිෂ්පාදන ආරම්භ කරන ලද අතර එය 2020 දී මුළු ආදායමට රුපියල් මිලියන 28 ක දායකත්වයක් ලබා දුන්නේය. ආයතනය වසර සඳහා නියම කරන ලද සමස්ත ආදායම් ඉලක්කයක් සපුරා ගැනීම හේතුවෙන් කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා අඛණ්ඩව 17 වැනි වසර සඳහාත් කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලදී.

වර්ධනය වෙමින් ඉදිරියට යන, වෙනස් වන පරිසරයට අඛණ්ඩව හැඩගැසෙන කාර්මික තාක්ෂණ ආයතනය පූර්වේක්ෂිත අනාගතය සඳහාද හොඳින් මුහුණ දෙනු ඇති බවට මම විශ්වාස කරමි. නුදුරු අනාගතයේ දී, විශේෂයෙන් කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය යළි නගා සිටුවීම සහ එයට මහ පෙන්වීමට කාර්මික තාක්ෂණ ආයතනයට වැඩි මැදිහත්වීමක් සිදු කළ හැකි වෙනු ඇත. මෙම වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන්ට වඩා යහපත් අනාගතයක් සඳහා ඉලක්කගත සේවාවන් සැපයීමට සහ එහි අරමුණු සපුරාලීම සඳහා වෙනස්වන පරිසරයට අනුවර්තනය වීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට කාර්මික තාක්ෂණ ආයතනය විසින් දියත් කරන ලද මුලපිරීම් විස්තර කරයි.

ස්තුතිය

සභාපති සහ කළමනාකරණ මණ්ඩලය, කළමනාකරණ කමිටුව, කාර්ය මණ්ඩලය, පාර්ශ්වකරුවන් සහ ප්‍රදායක නියෝජිතායතන.

ආචාර්ය ජේ.කේ.ආර්.ආර්. සමරසේකර
අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරි
කාර්මික තාක්ෂණ ආයතනය

2.3 ක්‍රියාකාරී සැලැස්ම

අංකය	ව්‍යාපෘතියේ නම/'සෞභාග්‍යයේ දැක්ම' ජාතික ප්‍රතිපත්ති රාමුවට ක්‍රියාකාරකම්වල අදාළත්වය	ව්‍යාපෘතිය පිළිබඳ දළ විස්තරයක්	ප්‍රගතිය
01.	**04 පරිච්ඡේදය: ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්** **උප අංශය: වෘත්තීය පුහුණුව සහ හැකියා සංවර්ධනය** 1.1. අවශ්‍යතා ඇති සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය නොසලකා වෘත්තීය හා තාක්ෂණික අවස්ථා ලබා දීම **කාර්මික තාක්ෂණ ආයතනයේ ක්‍රියාකාරකම: රසායනාගාර සහය සඳහා NVQ 4 පාඨමාලා පැවැත්වීම** **උප අංශය: උසස් අධ්‍යාපනය** **කාර්මික තාක්ෂණ ආයතනයේ ක්‍රියාකාරකම:** **උපාධි/පශ්චාත් උපාධි පිරිනැමීමේ තත්ත්වය සහිත කාර්මික තාක්ෂණ ආයතනයට අනුබද්ධිත තාක්ෂණ විශ්වවිද්‍යාලය පිහිටුවීම**	• රසායනාගාරය සඳහා NVQ 4 පාඨමාලාව (මාස 6) හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට සහාය. • NVQ 4 පාඨමාලාව NVQ 5 වෙත උත්ශ්‍රේණිගත කරන ලදී. • කාර්මික තාක්ෂණ ආයතනයේ අනුබද්ධ තාක්ෂණ විශ්වවිද්‍යාලය පිහිටුවීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.	• NVQ 4 සහ කාර්මික තාක්ෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගත් සිසුන් 20 දෙනෙකුගෙන් යුත් පළමු කණ්ඩායම න්‍යාය/ප්‍රායෝගික සැසි පවත්වා ඇත. • NVQ 4, NVQ 5 මට්ටමට උසස් කරන ලෙස කාර්මික තාක්ෂණ ආයතනය NAITA වෙතින් ඉල්ලා සිටි අතර නව පාඨමාලා හඳුන්වා දීමෙන් විෂය පථය පුළුල් කිරීමට කටයුතු කරමින් පවතී. • අවශ්‍ය යටිතල පහසුකම් හඳුනාගත් අතර ප්‍රාග්ධන අයවැය මගින් අයවැය ප්‍රතිපාදන ඉල්ලා ඇත. • රේඛීය අමාත්‍යාංශය වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.
	1.2 ශ්‍රම බලකායට ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීමට පුළුල් අවස්ථාවක් ලබා දීම **කාර්මික තාක්ෂණ ආයතනයේ ක්‍රියාකාරකම: ආහාර තාක්ෂණය, ඔසු තාක්ෂණය, ද්‍රව්‍ය තාක්ෂණය සහ ජෛව තාක්ෂණය යන අංශවල පුහුණු වැඩසටහන් සහ කණ්ඩායම් තාක්ෂණ හුවමාරු ක්‍රියාකාරකම් පැවැත්වීම**	• නිෂ්පාදන සැකසීම, ඇසුරුම් ද්‍රව්‍ය සහ යන්ත්‍ර සූත්‍ර තෝරා ගැනීම, ලේබල් කිරීම සහ තත්ත්ව සහතිකය යනාදිය පිළිබඳ දැනුම ලබා දීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය විසින් ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා විවිධ ක්ෂේත්‍රවල පුහුණු වැඩසටහන් පවත්වන ලදී. • පාර්ශවකරුවන් අතර කාර්මික තාක්ෂණ ආයතනයේ ක්‍රියාකාරකම්	• ආහාර තාක්ෂණය, ශාකසාර, තාක්ෂණය, ද්‍රව්‍ය තාක්ෂණය සහ ජෛව තාක්ෂණය යන ක්ෂේත්‍රවල 275කට අධික තාක්ෂණික පුහුණුවක් පවත්වන ලදී. • තාක්ෂණ සංවර්ධනය සහ හුවමාරුව, පළතුරු සහ එළවළු විජලනය, කෝමාරිකා RTS, වට්ටක්කා පිටි, කිතුල් වයින්, දේශීයව වගා කරන ලද අර්තාපල් වලින් ශීත කළ අර්තාපල් විප්ස්, ඖෂධ පැළෑටි මත පදනම් වූ ආලේපන සහ ඖෂධ, ග්‍රැෆීන් තාක්ෂණය, ගෘහ

		ප්‍රවලිත කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක් පමණ පවත්වා ඉදිරිපත් කිරීම් සහ වෙබිනාර් සඳහා ආරාධනා කර ඇත (පශ්චාත් අස්වනු කළමනාකරණය, අගය එකතු කළ කෘෂි තාක්ෂණ, ශාකසාර තාක්ෂණය සහ තාක්ෂණික විශ්ලේෂණය). විද්‍යාත්මක ප්‍රදර්ශන පැවැත්වීම / ඒවාට දායක වීම සිදු කළ අතර කර්මාන්ත සහ සාමාන්‍ය ජනතාව සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ තාක්ෂණයන් සහ සේවාවන් ජනප්‍රිය කර ඇත. • අලුතින් පිහිටුවන ලද අදාළ අමාත්‍යාංශ (ග්‍රාමීය කර්මාන්ත, ධීවර, කෘෂිකර්ම, ඩිජිටල් තාක්ෂණ සහ ව්‍යවසායක සංවර්ධන අමාත්‍යාංශ) වෙත කාර්මික තාක්ෂණ ආයතනයේ ක්‍රියාකාරකම් සහ සේවාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. • විශේෂඥ සම්පත් දායකයින් ලබා දීමෙන් සහ දේශීය හා ජාත්‍යන්තර මට්ටමින් කාර්මික තාක්ෂණ ආයතනයේ ක්‍රියාකාරකම් ප්‍රවලිත කරමින් වෙබිනාර් 12 කට වැඩි ගණනකට ක්‍රියාකාරීව සහභාගී විය.	ආරක්ෂණ නිෂ්පාදන, අත් සනීපාරක්ෂක, අලි අනතුරු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය ආදිය ඉහත ක්ෂේත්‍රවලට අදාළ තාක්ෂණික හුවමාරු කිරීම් 45කට වැඩි ප්‍රමාණයක් සහ කොන්ත්‍රාත් ව්‍යාපෘති 75කට වැඩි ප්‍රමාණයක් සිදු කරන ලදී. • ප්‍රධාන වශයෙන්, කහ සැකසීම, පසු අස්වනු හානිය අවම කිරීම සහ කෘෂිකාර්මික භෝග සඳහා අගය එකතු කිරීම, COVID-19 වසංගතයට එරෙහිව සටන් කිරීමට නිෂ්පාදන, ආනයන ආදේශනය, අපනයන ප්‍රවර්ධනය, පොල්තෙල් තත්ත්ව නඩත්තුව, වස විසෙන් තොර ආහාර නිෂ්පාදන තාක්ෂණය ආදිය වැනි වත්මන් ගැටළු සහ රජයේ ප්‍රමුඛතා ක්ෂේත්‍ර වෙත තාක්ෂණික සංවර්ධනය සහ හුවමාරුවේදී අවධානය යොමු කරන ලදී. • පාරිභෝගික ඉල්ලීම් මත පදනම්ව ආහාර සහ ආහාර නොවන නිෂ්පාදන විශ්ලේෂණාත්මක පරීක්ෂණ සේවා 20,000 කට වඩා පවත්වන ලදී. • කාර්මික තාක්ෂණ ආයතනයේ තාක්ෂණයන් සහ සේවා ප්‍රදර්ශනය කිරීම සඳහා INNOVOTECH ප්‍රදර්ශනයට සහ ආයෝජක සංසද තුනකට සහභාගී විය. අගය එකතු කළ ආහාර තාක්ෂණ, ඔසු තාක්ෂණ, ද්‍රව්‍ය තාක්ෂණ, අලි අනතුරු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති තාක්ෂණය ආදිය පිළිබඳව අදාළ නව අමාත්‍යාංශ දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හතරක් පවත්වන ලදී. ධීවර ප්‍රජාව සඳහා තාක්ෂණ හුවමාරු පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය ධීවර අමාත්‍යාංශය සමග සාකච්ඡා කරමින් සිටී. • සිදු කළ හැකි තාක්ෂණ මාරුකිරීම් සඳහා ග්‍රාමීය කර්මාන්ත, පිත්තල සහ වේවැල් අමාත්‍යාංශය සහ තරුණ අමාත්‍යාංශය සඳහා කාර්මික තාක්ෂණ ආයතනය දැනටමත් යෝජනා ඉදිරිපත් කර ඇත. • අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය (GMOA), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DoA), ආහාර විද්‍යා හා තාක්ෂණ ආයතනය (IFTSL) යනාදී

			ආයතනවල සහයෝගීතාවයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පවත්වන ලදී.
02.	**04 පරිච්ඡේදය: ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්** **උප අංශය: බටහිර වෛද්‍ය ක්‍රමය** වස විසෙන් තොර සෞඛ්‍ය සම්පන්න ආහාර වේල් ජනප්‍රිය කිරීම **කාර්මික තාක්ෂණ ආයතනයේ ක්‍රියාකාරකම්** **2.1. සෞඛ්‍ය සම්පන්න ආහාර සංවර්ධනය සහ තාක්ෂණික වාණිජකරණය ඉලක්ක කරගත් පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති**	• සෞඛ්‍ය සම්පන්න ආහාර සංවර්ධනය පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කෙරේ. උදා: සාම්ප්‍රදායික සහල්වල පෝෂණ හා ක්‍රියාකාරී ගුණාංග, පොල්තෙල් සහ අගය එකතු කළ සෞඛ්‍ය සම්පන්න ආහාර වලංගු කිරීම, තේ සංවර්ධනය සහ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම, NCD වලට එරෙහිව නව ආහාර සැකසීම, ඌන උපයෝගි කරගත් ආහාර භෝග/ඖෂධ වර්ග වලින් අගය එකතු කළ නිෂ්පාදන සිදුවෙමින් පවතී.	• පොළොස්, හතු සහ ධාන්‍ය වර්ග වලින් මස් ආදේශක සංවර්ධනය කරන ලදී, තාක්ෂණික හුවමාරු තුනක් සිදු කරන ලද අතර අතිරේක තාක්ෂණික පැවරීම් පිළිබඳව කර්මාන්ත සමග සාකච්ඡා කරමින් පවතී. • දේශීය හා අපනයන වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් කොස්, ශීත කළ පළතුරු සහ එළවළු සැකසීම සඳහා ව්‍යවසායකයින් හතර දෙනෙකු ස්ථාපිත කරන ලදී. • සාම්ප්‍රදායික සහල් සහ ඌන ප්‍රයෝජනයට නොගත් ධාන්‍ය වර්ග (නිෂ්පාදන 5ක්) යොදා ගනිමින් සෞඛ්‍ය සම්පන්න උදැසන ආහාර වේලක් සකස් කරන ලද අතර එක් නිෂ්පාදනයක් වාණිජකරණය කරන ලදී. • ඉසින වියලන තාක්ෂණය භාවිතයෙන් පලතුරු සහ එළවළු කුඩු සංවර්ධනය කරන ලදී. • ව්‍යාපෘති හරහා ස්ථාපිත කරන ලද නව පරීක්ෂණ ක්‍රම කාර්මික තාක්ෂණ ආයතනයේ තාක්ෂණික සේවා සැපයීමේදී භාවිතා වේ.
		• කොවිඩ්-19 ට එරෙහිව සටන් කිරීමට ප්‍රතිශක්තිකරණ බූස්ටර නිපදවන ලදී.	•කොත්තමල්ලි, ඉඟුරු, කහ සහ අනෙකුත් ඖෂධීය ශාක පදනම් කරගත් නිෂ්පාදන තාක්ෂණයන් 10 කට වැඩි ප්‍රමාණයක් ප්‍රතිශක්තිකරණ වර්ධක ලෙස සංවර්ධනය කරන ලද අතර මෙම තාක්ෂණයන් පැවරීම සඳහා සූදානම් කර ඇත.
	2.2 කාබනික ආහාර සංවර්ධනය ජනප්‍රිය කිරීම	•කාබනික පාදක දිලීර නාශක සහ පළිබෝධනාශක සංවර්ධනය පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති සිදු කරන ලදී. එක් ජෛව පළිබෝධනාශකයක් නිපදවා ඇති අතර එය තාක්ෂණ පැවරීම සඳහා සූදානම් වේ. •ආකලන රහිත ආහාර නිෂ්පාදන සංවර්ධනය. •මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ජෛව පොහොර සාදන කොම්පෝස්ටරයක් නිර්මාණය කර ඇත.	•කාබනික පාදක දිලීර නාශක සහ පළිබෝධනාශක අතර අඛණ්ඩ පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති දෙකක් සිදුවෙමින් ඇත. •පළිබෝධනාශක අපද්‍රව්‍ය විශ්ලේෂණය සඳහා සාම්පල 150ක් පමණ සෑම මසකම කාර්මික තාක්ෂණ ආයතනයේ අවශේෂ විශ්ලේෂණ රසායනාගාරයේදී සිදු කරන ලදී. •ආකලනවලින් තොර ආහාර නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ එක් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පවතී. •පැය 24ක් ඇතුළත දිරාපත් වන ආහාර අපද්‍රව්‍ය වලින් කොම්පෝස්ට් නිපදවීමට ගෘහස්ථ කොම්පෝස්ටරයක් නිපදවා ඇති අතර තාක්ෂණ පැවරීමට සූදානම්ය.

			• කාබනික පොහොර පරීක්ෂණ, ජෛව පළිබෝධනාශක පරීක්ෂණ සහ වාරි ජලයේ තත්ත්ව පරීක්ෂණ සඳහා රසායනාගාර පහසුකම් ස්ථාපිත කර ඇත.
	2.3 සෑම වයස් කාණ්ඩයකම නිසි ආහාර පුරුදු ප්‍රවර්ධනය කිරීම	• තාක්ෂණික වැඩමුළු හරහා නිසි ආහාර සැකසුම් ශිල්පීය ක්‍රම හඳුන්වා දෙන ලදී. • ඉහළ මට්ටමේ වෙළෙඳපොළ අල්ලා ගැනීම සඳහා විදාතා ව්‍යවසායකයින්ගේ ආහාර නිෂ්පාදන වැඩිදියුණු කිරීම. • කොවිඩ් -19 වසංගත කාල පරිච්ඡේදය තුළ නිසි සැකසුම් ශිල්පීය ක්‍රම පිළිබඳව ආහාර කර්මාන්ත පුහුණු කිරීම.	• අගය එකතු කිරීම සඳහා නිසි ආහාර සැකසුම් තාක්ෂණයෙන් කර්මාන්තය පෝෂණය කිරීම සඳහා ආහාර තාක්ෂණ අංශය මගින් පුහුණු වැඩසටහන් 75 කට වැඩි ප්‍රමාණයක් පවත්වන ලදී. • විදාතා ව්‍යවසායකයින්ගේ ආහාර නිෂ්පාදන 100 කට වඩා වැඩි ප්‍රමාණයක් ආහාරවල ගුණාත්මක බව රැක ගනිමින් සහ ආරක්ෂිත ක්‍රම/ප්‍රමිති හඳුන්වාදීම මගින් වැඩිදියුණු කරන ලදී. • විවිධ ආහාර කර්මාන්ත නියෝජනය කරමින් සහභාගි වූවන් සඳහා පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී.
	2.4. තිරසර පරිසර ප්‍රතිපත්තියක් හරහා වාතය, ජලය සහ පස දූෂණය වීම වළක්වා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් නිර්මාණය කිරීම	• වායු තත්ත්ව පරීක්ෂණ විශ්ලේෂණය සහ පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම. • වායු තත්ත්ව අධීක්ෂණය, පරිසර දූෂණය පාලනය සහ පාරිසරික බලපෑම් තක්සේරු කිරීම් ආදිය සඳහා උපදේශන සහ කොන්ත්‍රාත් ව්‍යාපෘති මෙහෙයවීය.	• වායු තත්ත්ව අධීක්ෂණය පිළිබඳ සේවා 500 කට වැඩි ප්‍රමාණයක් පවත්වන ලදී. • සනීපාරක්ෂක, විෂබීජ නාශක, මුහුණු ආවරණ සහ ශාකසාර නිෂ්පාදන සඳහා පරීක්ෂණ සේවා සිදු කරන ලදී. පානීය ජලයේ ගුණාත්මකභාවය, පස සහ පොහොර පිළිබඳ පරීක්ෂණ සිදු කරන ලද අතර සාම්පල 2000 කට වැඩි ප්‍රමාණයක් විශ්ලේෂණය කරන ලදී.
	2.5 දේශීය වෛද්‍ය විද්‍යාව සහ ආයුර්වේද ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධනය	• **දේශීය වෛද්‍ය විද්‍යාව සංවර්ධනය පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක වෙමින් තිබේ.** • මී පැණි බාල කිරීම ඇගයීමට පරීක්ෂණ කට්ටලයක් වාණිජකරණය කරන ලදී. • කොවිඩ්-19 සඳහා ඖෂධ පැළෑටි මත පදනම් වූ මුඛ සේදීමක් නිපදවන ලදී. ඖෂධ පැළෑටි මත පදනම් වූ මුඛ සේදීම පරීක්ෂා කරන ලද අතර එහි කාර්යක්ෂමතාව කොරෝනා වයිරස් සහ ඉන්ෆ්ලුවෙන්සා වෛරස් වලට එරෙහිව ක්‍රියා කරන බව තහවුරු විය. • COVID-19 වසංගතයට ප්‍රතිචාර	• කොවිඩ්-19 ට එරෙහිව ශාකසාර පාදක සත්කාර නිෂ්පාදන 20කට වඩා වැඩි ප්‍රමාණයක් සංවර්ධනය කරන ලදී. • මී මැසි කර්මාන්තය මේ වන විට මී පැණි බාල කිරීම් හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ කට්ටලය භාවිතා කරයි. • නිෂ්පාදනවල පෝෂණය සහ ජෛව සක්‍රීය ගුණාංග පරීක්ෂණයට ලක් කරන ලද අතර මෙම ඖෂධ තාක්ෂණය මාරු කිරීම සඳහා සුදානම්ව පවතී. අත් පිරිසිදුකාරක නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ පැවරීම මේ වැඩමුළු සිදු කරන ලදී • මධ්‍යසාර මත පදනම් වූ දියර අත් පිරිසිදුකාරක, මධ්‍යසාර මත පදනම් වූ ඖෂධීය ද්‍රව අත් පිරිසිදුකාරක, මධ්‍යසාර මත පදනම් වූ ශාකසාර ජෙල් අත් පිරිසිදුකාරක, ඔසු මුඛ සේදීම,

		වශයෙන් අත් පිරිසිදුකාරක සහ වෙනත් ආශ්‍රිත තාක්ෂණයන් දියුණු කරන ලදී. •ආයුර්වේද ලියාපදිංචිය ලබා ගැනීම සඳහා පාරිභෝගික ඉල්ලීම මත ආයුර්වේද මිශ්‍රණ පරීක්ෂාව සිදු කරන ලද අතර රූපලාවන්‍ය පරීක්ෂණ සිදු කරන ලදී.	හරංකහ අත් පිරිසිදුකාරක ඉසින, වායු විෂබීජ නාශක, ප්‍රතිබැක්ටීරීය අත් සේදීම/පෙන මගින් සේදීම, පොල්තෙල් මත පදනම් වූ ජෙව මතුපිට විෂබීජ නාශක, පොල්තෙල් මත පදනම් වූ මතුපිට විෂබීජහරණය කරන ජෙව පලතුරු සහ එළවළු සෝදන, පොල් තෙල් මත පදනම් වූ ජෙව විනිවිද පෙනෙන සබන්, පොල් තෙල් මත පදනම් වූ ශරීර දියර, පොල් තෙල් මත පදනම් වූ ජෙව වෙට් වයිප්ස්, මුරුංගා තෙල් විලවුන්, මුරුංගා තෙල් ඉසින, මුරුංගා විරේචක මිශ්‍රණය, වට්ටක්කා මත පදනම් වූ සෞඛ්‍ය නිෂ්පාදන, ඖෂධ පැළෑටි ප්‍රතිශක්තිකරණ බූස්ටර, අල්ට්‍රා සවුන්ඩ් සංවේදක ස්වයංක්‍රීය අත් අත් පිරිසිදුකාරක ඩිස්පෙන්සර් සංවර්ධනය කරන ලදී. •ශාකසාර ආශ්‍රිත පාන වර්ග සහ රූපලාවන්‍ය නිෂ්පාදන නිපදවන ලදී. •මෙම කාලසීමාව තුළ පරීක්ෂණ සේවා 400කට වැඩි ප්‍රමාණයක් සිදු කරන ලදී.
03.	**5 පරිච්ඡේදය: මහජන කේන්ද්‍රීය ආර්ථිකය** කාර්මික තාක්ෂණ ආයතනයේ ක්‍රියාකාරකම් **3.1 පසු අස්වනු හානිය අවම කිරීම** **3.2 කෘෂිකාර්මික නවෝත්පාදන සඳහා පර්යේෂණ**	•කර්මාන්ත සහ සාමාන්‍ය ජනතාව සඳහා පසු අස්වනු හානි අවම කිරීම සහ භෝග සඳහා අගය එකතු කිරීම සඳහා පුහුණු වැඩසටහන්, වෙබිනාර් සහ ආරාධිත ඉදිරිපත් කිරීම් පවත්වන ලදී. •පසු අස්වනු පාඩු අවම කිරීම පිළිබඳ පාර්ලිමේන්තු අනුකමිටුවට දායක විය. •පසු අස්වනු තාක්ෂණය සීතල දාම කළමනාකරණය, අවම සැකසුම්, සහ ශීත කළ සහ අගය එකතු කළ පළතුරු සහ එළවළු තාක්ෂණයන් නව ව්‍යවසායකත්වය සඳහා කර්මාන්තයට හඳුන්වා දෙන ලදී. • කොස්, වට්ටක්කා, කෙසෙල් සහ මාළු වලින් සෞඛ්‍ය සම්පන්න ආහාර නිෂ්පාදන හඳුන්වා දීමෙන් පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සහ මෙම භාණ්ඩවල පසු අස්වනු පාඩු අවම කර ගැනීමට කටයුතු කරන ලදී.	• පසු අස්වනු හානිය අවම කිරීම සහ අගය එකතු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් හතරක් සහ එක් වෙබිනා වැඩසටහනක් පවත්වන ලදී. • අපනයන සහ සුපිරි වෙළඳසැල් ඉලක්ක කර ගනිමින් පසු අස්වනු නෙලීමේ ප්‍රොටෝකෝල හඳුන්වාදීම සඳහා තාක්ෂණ පුහුණු වැඩසටහන් පහක් පවත්වන ලදී. මෙයට කර්මාන්තයේ 50 ක් පමණ සහභාගී වූ අතර නව ව්‍යවසායකයින් වැඩසටහන් වලින් ප්‍රතිලාභ ලබා ඇත. • එම කෘෂිකාර්මික භාණ්ඩ මත පදනම්ව නව්‍ය නිෂ්පාදන 30ක් පමණ සංවර්ධනය කරන ලදී. • කොස් ආශ්‍රිත නිෂ්පාදන මත නව කර්මාන්ත හතරක් ස්ථාපිත කෙරෙනු ලැබේ. • අඹ පල්ප්, පොළොස් ටින් කිරීම, අවම වශයෙන් සැකසූ කොස් සහ ඉසිරි වියළි පලතුරු පිළිබඳ නියමු පරිමාණ අධ්‍යයනයන් හයක් සිදු කරන ලදී. •පසු අස්වනු කළමනාකරණය සහ අගය එකතු කිරීම සහ කෘෂිකාර්මික නවෝත්පාදන සම්බන්ධ තාක්ෂණ හුවමාරු වැඩසටහන් 50කට අධික ප්‍රමාණයක් පවත්වන ලදී.

	• **රබර් පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය**	•රබර්වල තාප සන්නායකතාව වැඩි කිරීම සම්බන්ධව පර්යේෂණ සිදු කිරීම.	•මිනිරන් මත පදනම් වූ නැනෝකොම්පොසිට් භාවිතයෙන් රබර් තාප සන්නායකතාවය වැඩි දියුණු කර ඇත.
	• **කුරුඳු පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය**	•කුරුඳු සඳහා අගය එකතු කිරීම පිළිබඳ පර්යේෂණ	•ශ්‍රී විජය සහ ශ්‍රී ගැමුණු නම් ඉහළ - ඵලදාවක් සහිත කුරුඳු විශේෂවල (*Cinnamomum zeylanicum* Blume) රසායනික, ක්‍රියාකාරීත්වය සහ සෞඛ්‍ය ප්‍රතිලාභ තහවුරු කරන ලදී. •කුරුඳු කරල් නිපදවන ලද අතර වාණිජකරණය සඳහා තාක්ෂණයන් සූදානම් කර ඇත. •කුරුඳු ඇතුළත් ශාකසාර ආලේපන මාලාවක් සංවර්ධනය කර ඇති අතර තාක්ෂණික පැවරීම සඳහා සූදානම්ව ඇත.
04.	**6 පරිච්ඡේදය: තාක්ෂණය මත පදනම් වූ සමාජයක් පිහිටුවීම** (ජෛව තාක්ෂණය, නැනෝ තාක්ෂණය, විද්‍යුත් තාක්ෂණය ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධන, තාක්ෂණ හුවමාරු සහ පර්යේෂණ සහ සංවර්ධන සේවා)	• ජෛව තාක්ෂණය / නැනෝ තාක්ෂණය / විද්‍යුත් තාක්ෂණ නවෝත්පාදන පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.	• PCR මත පදනම් වූ ආහාර පරීක්ෂාව, ඩෙංගු වෛරසය සඳහා මොනොක්ලෝනල් ප්‍රතිදේහ සංවර්ධනය, තිරිඟු මත පදනම් වූ අගය එකතු කිරීම, ක්‍රියාකාරී පාන සංවර්ධනය ආදිය කෙරෙහි අවධානය යොමු කරමින් ජෛව තාක්ෂණ නවෝත්පාදන ආශ්‍රිත ව්‍යාපෘති 9ක් ක්‍රියාත්මක වෙමින් පවතී. • මිනිරන්, ස්වාභාවික රබර් සංයුක්ත සහ ඉලෙක්ට්‍රෝඩය මත නිපදවන ලද නිෂ්පාදන තුනක් ක්‍රියාත්මක වෙමින් පවතී. • AC/DC උපපථ සහ රැහැන් රහිත ආර්ද්‍රතා සහ උෂ්ණත්ව නිරීක්ෂණ පද්ධතියක් නිර්මාණය කර සංවර්ධනය කරන ලදී. • කන් පරීක්ෂා කිරීමේ උපකරණය තහවුරු කිරීම සඳහා සායනික පරීක්ෂණයක් පවත්වන ලදී. • අලි මිනිස් ගැටුම විසඳීම සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් සකස් කරන ලද අතර දැනටමත් වාණිජකරණය වෙමින් පවතී.
		•පර්යේෂණ ප්‍රකාශන, පේටන්ට් බලපත්‍ර සහ වෙනත් විද්‍යාත්මක ජයග්‍රහණ.	•සම-සමාලෝචනය කරන ලද සඟරා ප්‍රකාශන 49ක්. •සන්නිවේදන/සාරාංශ 70 •පේටන්ට් ලැබීම් 02 •පේටන්ට් 05 අයදුම් කරන ලදී. •ජාතික ත්‍යාග 02. •සිදු කළ හැකි තාක්ෂණ සංවර්ධන සහ පැවරීම්

			සඳහා කර්මාන්ත 100 කට වැඩි ප්‍රමාණයක් සම්බන්ධ කරන ලදී. •තාක්ෂණික හවුල්කාරිත්වය සඳහා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල, කර්මාන්ත, අමාත්‍යාංශය සහ අනෙකුත් අධිකාරීන් සමග කාර්මික තාක්ෂණ ආයතන ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් 14කට අත්සන් තැබීය. • සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රමුඛතා ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කරන නව පර්යේෂණ යෝජනා පනස් දෙකක් අරමුදල් අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ලදී. මෙම යෝජනා ආහාර තාක්ෂණය, ඔසු තාක්ෂණය, රසායනික තාක්ෂණය, ජෛව තාක්ෂණය, පාරිසරික තාක්ෂණය සහ දේශගුණික විපර්යාස සහ ද්‍රව්‍ය තාක්ෂණය සම්බන්ධ වේ.
		• කාර්මික තාක්ෂණ ආයතනයේ විෂය පථය පුළුල් කිරීම සහ නව රසායනාගාර පිහිටුවීම.	•යුනෑන් ග්‍රාමීය විද්‍යා හා තාක්ෂණ සේවා මධ්‍යස්ථානය, යුනෑන් කෘෂි විශ්ව විද්‍යාලය සහ කුන්මින්ග් විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලය සමග චීන - ශ්‍රී ලංකා ඒකාබද්ධ ජෛවතාක්ෂණ විද්‍යාගාරය. අභ්‍යන්තර අලංකරණ කටයුතු සම්පූර්ණ කර ඇති අතර උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා චීන නියෝජිතයන් සහභාගි වන තෙක් අපේක්ෂාවෙන් සිටී. •ජාතික LMO/GMO රසායනාගාරය ස්ථාපනය කරන ලදී: පරිසර අමාත්‍යාංශයේ සහ FAO හි සහයෝගීතා වැඩසටහන හරහා රසායනාගාර අභ්‍යන්තර සැලසුම් සම්පූර්ණ කර ඇති අතර උපකරණ ලබා ගනිමින් සිටී. •ඇසුරුම් පරීක්ෂණ රසායනාගාරය වැඩිදියුණු කිරීම මගින් ජාතික ඇසුරුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම - පරීක්ෂණ දැනටමත් ආරම්භ කර ඇත. •පෙට්‍රෝලියම් සහ ලිහිසි තෙල් පරීක්ෂණ රසායනාගාරයක් පිහිටුවීම - පරීක්ෂණ දැනටමත් ආරම්භ කර ඇත. •STC හරහා සතොස අලෙවිසැල් වෙත ගුණාත්මක බව සහතික කරන ලද මධ්‍යසාර පදනම් කරගත් අත් පිරිසිදුකාරක සැපයීම සඳහා අත් පිරිසිදුකාරක නිෂ්පාදන පහසුකම ස්ථාපිත කරන ලදී - සාර්ථකව වාණිජකරණය කර ඇත.

		•වෙනත් කටයුතු: පරීක්ෂණ සේවා, උපදේශන, කොන්ත්‍රාත් ව්‍යාපෘති සහ දේශීය කර්මාන්ත සහ අපනයන ප්‍රවර්ධනය සඳහා සහාය වීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය විසින් සිදු කරනු ලබන අනෙකුත් සේවාවන්.	•කර්මාන්තවලට සහය දැක්වීම සඳහා පරීක්ෂණ සේවා 400කට වැඩි ප්‍රමාණයක් සිදු කරන ලදී. •කර්මාන්තවලට සහය දැක්වීම සඳහා උපදේශනය 1000කට වැඩි ප්‍රමාණයක් සිදු කරන ලදී.
05.	**7 පරිච්ඡේදය:** **ජාතික අවකාශීය පද්ධතියක නව ප්‍රවේශයන්**	•නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය, කාර්මික අපද්‍රව්‍ය සහ අපජල කළමනාකරණය.	• ශ්‍රී ලංකාවේ අන්තරායකර අපද්‍රව්‍ය උත්පාදන කර්මාන්ත පිළිබඳ උපදේශන කිහිපයක් (100 කට වඩා) පවත්වන ලදී. • නිර්වායු ජීර්ණය භාවිතයෙන් කුකුළු අපජල පිරිපහදු කිරීම සඳහා නව ප්‍රවේශයන් සකස් කරන ලදී
06.	**දැහැමි විනයගරුක සහ නීතිගරුක සමාජයක්** විදාතා ව්‍යවසායකයින් පුහුණු කිරීම/කාන්තා සවිබල ගැන්වීම්	•විදාතා සහ සමෘද්ධි ව්‍යවසායකයින් සඳහා තාක්ෂණ පුහුණුව. •කාන්තා සවිබල ගැන්වීමේ වැඩසටහන්.	•විදාතා ව්‍යවසායකයින් 100 කට වැඩි පිරිසක් සඳහා තාක්ෂණ පැවරීම් වැඩමුළු 20 ක් සහ නිෂ්පාදන වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී. •බොහෝ විදාතා ව්‍යවසායකයින් කාන්තාවන් වන බැවින් රටේ කාන්තා සවිබල ගැන්වීමට දායක විය.

03 වන පරිච්ඡේදය: පාලනය සහ පාරිශ්‍රමික

3.1 මණ්ඩල කරුණු

කාර්මික තාක්ෂණ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයට ආයතනයේ පරිපාලනය, කළමනාකරණය සහ කටයුතු පාලනය කිරීම පැවරී ඇති අතර එමඟින් ආයතනය සඳහා වන මෙහෙවර, උපාය මාර්ග, අරමුණු, මෙහෙයුම් ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතා අනුමත කරන අතර ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම අධීක්ෂණය කරයි.

3.2 කළමණාකරණ මණ්ඩලය

රනිල ධාන්‍ය වර්ග ප්‍රෝටීන්, කාබොහයිඩ්‍රේට් සහ තන්තු මෙන්ම විටමින් සහ ඛණිජ අනගි මූලාශ්‍රයකි. ශ්‍රී ලංකාවේ රනිල කුලයට අයත් ප්‍රභේදවල පෝෂණ දත්ත අධ්‍යයනය කර ප්‍රකාශයට පත් කරන ලද නමුත් පෝෂණ විරෝධී සාධක සහ ජෛව ක්‍රියාකාරී ප්‍රෝටීන පිළිබඳ දත්ත නොමැත. මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ බහුලව වගා කරන දේශීය ආහාරයට ගත හැකි රනිල කුලයට අයත් බෝගවල පෝෂණ විරෝධී සාධක (ANFs) සහ ජෛව ක්‍රියාකාරී සංයෝගවල ක්‍රියාකාරීත්වය හඳුනාගෙන ඇත. අධ්‍යයනය කරන ලද රනිල කුලයට අයත් බෝග අතර, කොල්ලු (Macrotyloma uniflorum) වර්ග; ANK-Black, ANK-Brown සහ කව්පි (Vigna unguiculata) ප්‍රභේද වන Waruni, ABTS සහ DPPH අමු සහ පිසූ ආකාරවල පිරිසිදු කිරීමේ ක්‍රියාකාරීත්වය පෙන්නුම් කරන ලදී. මෙම අධ්‍යයනය දේශීයව වගා කරන ලද රනිල කුලයට අයත් ප්‍රභේදවල ප්‍රතිඔක්සිකාරක විභවය පිළිබඳ පළමු ක්‍රමානුකූල අධ්‍යයනය වන අතර විවිධ හඳුනා ගැනීම සඳහා දත්ත සපයනු ඇත.

4.8 නව මූලාරම්භයන්

අණුක ක්‍රම භාවිතයෙන් ආහාර මගින් රෝග කාරක බීජ හඳුනා ගැනීම

ආහාර කර්මාන්තයේ දී ආහාරවල රෝග කාරක බීජ අඛණ්ඩව අධීක්ෂණය කිරීම වැදගත් වේ. SLSI විසින් සකස් කරන ලද ශ්‍රී ලාංකේය ආහාර තත්ත්ව ප්‍රමිතීන් ආහාර සහ ජලයෙහි ඇති ආහාර රෝග කාරකවල පිළිගත් සීමාවන් නියම කරයි. කාර්මික තාක්ෂණ ආයතනය දැනට ව්‍යාධිජනක සැල්මොනෙල්ලා, ස්ටැෆිලොකොකස් සහ කැම්පිලොබැක්ටර් හඳුනාගැනීම සඳහා ප්‍රොටෝකෝල (දේශීය හා ජාත්‍යන්තර ආහාර තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූලව) පිහිටුවීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

සාම්ප්‍රදායික රෝග කාරක හඳුනාගැනීමේ ක්‍රමවලට වඩා ආහාරවල රෝග කාරක බීජ අණුක හඳුනාගැනීම සඳහා අඩු කාලයක් අවශ්‍ය වන බැවින්, දේශීය ආහාර කර්මාන්තයට තම නිෂ්පාදනවල ගුණාත්මකභාවය, ප්‍රමාණය සහ අඛණ්ඩතාව පවත්වා ගැනීමට මෙම මුලපිරීම උපකාර වනු ඇත.

අපජල පවිත්‍රකරණය සඳහා ප්‍රකාශ උත්ප්‍රේරකයක් ලෙස ටයිටේනියම් ඩයොක්සයිඩ් සහ මැටි මත පදනම් වූ ස්ථාවර සංයෝගයක් යොදා ගැනීම

පරමාර්ථය වූයේ අපජලයේ පවතින කාබනික දූෂකයන් ඛනිජකරණය කිරීම සඳහා, යෂ්ටියක් තහඩුවක්, ගෝලයක් යන ආකාරයෙන් ඵලදායී සහ ස්ථායී TiO2-මැටි සංයුක්ත ප්‍රකාශ උත්ප්‍රේරකයක් සංවර්ධනය කිරීමයි.

ළමුන් සහ නව යොවුන් වියේ දරුවන් සඳහා පෝෂ්‍යදායී සහ සෞඛ්‍ය සම්පන්න ආහාර මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම

දේශීය අමුද්‍රව්‍ය වන ඇට වර්ග, බීජ, ධාන්‍ය වර්ග, රනිල කුලයට අයත් බෝග, කිරි ආදේශක සහ මාළු හා මස් වැනි දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් රටේ නියම කර ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව ළමුන් සහ නව යොවුන් වියේ දරුවන් සඳහා පෝෂ්‍යදායී සහ සෞඛ්‍ය සම්පන්න ආහාර නිෂ්පාදන සංවර්ධනය කිරීම මෙහි අරමුණ විය.

4.9 දායකත්වයන්

දක්ෂිණ කලාපයේ තිරසර සංවර්ධනය සඳහා විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (COMSATS), කාර්මික සහ තාක්ෂණික පර්යේෂණ සංවිධාන සංගමය (WAITRO), Iඋණ සහ වේවැල් පිළිබඳ ජාත්‍යන්තර ජාලය (INBAR), එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO), එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO), Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP). චීනයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, කරච්චි විශ්ව විද්‍යාලයේ රසායනික ජීවවිද්‍යා සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය, අර්ධ ශුෂ්ක නිවර්තන කලාප සඳහා ජාත්‍යන්තර බෝග පර්යේෂණ ආයතනය (ICRISAT) සහ එක්සත් ජනපදයේ ටොලේඩෝ විශ්ව විද්‍යාලය සමග කාර්මික තාක්ෂණ ආයතනය දීර්ඝකාලීන සහයෝගයන් සහ ඒකාබද්ධ වැඩසටහන් ඉදිරියට ගෙන ගියේය.

පහත පර්යේෂණ සහයෝගිතා දැනට සිදු වෙමින් පවතී;

- තාප නොවන ක්‍රියාවලිය භාවිතා කරමින් කුළුබඩු මතුපිට වානුහරණය කිරීමේ අධ්‍යයනය පිළිබඳව ඉන්දියාවේ රසායනික තාක්ෂණ ආයතනය සමග ඉන්දු ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන.
- ජෛව සංවේදක සංවර්ධනය සහ අන්‍යෝන්‍ය පුහුණුව පිළිබඳ ආසියානු තාක්ෂණ ආයතනය, තායිලන්තය.
- ජෛව වෛද්‍ය ආහාර පර්යේෂණ ඉංජිනේරු විද්‍යාව සඳහා චූලන්ග්කෝන් විශ්ව විද්‍යාලය, බැංකොක්, තායිලන්තය.
- ප්ලාස්මා විද්‍යාව සහ ආහාර පර්යේෂණ සහ පර්යේෂණ පුහුණු හුවමාරුව සඳහා ශ්‍රී ශක්ති ඉංජිනේරු හා තාක්ෂණ ආයතනය.

- KIPO/KIPA සුදුසු තාක්ෂණ සංවර්ධනය සඳහා රතු මැටි කැට යොදා ගනිමින් පූර්ව ප්‍රතිකාර ක්‍රමය සංවර්ධනය කිරීම පිළිබඳ විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන (COSTI), ශ්‍රී ලංකා සහ කොරියානු බුද්ධිමය දේපළ කාර්යාලය (KIPO), කොරියානු රාජ්‍ය පරිපාලන ආයතනය (KIPA) සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය ව්‍යාපෘතිය - ජල පිරිපහදු පද්ධති සංවර්ධනය.
- පිළිකා ප්‍රතිකාරය වැඩි දියුණු කිරීම සඳහා ඖෂධීය ශාක සහ ක්ෂුද්‍ර ඇල්ගී වලින් ක්‍රියාකාරී අණු මත පදනම් වූ නැනෝ සංයෝග සංවර්ධනය කිරීම පිළිබඳව නැනෝ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව තමිල්නාඩු කෘෂිකාර්මික විශ්ව විද්‍යාලය, ඉන්දියාවේ කොයිම්බතූර්.
- සහයෝගී පර්යේෂණ හරහා විද්‍යාත්මක, පර්යේෂණ, තාක්ෂණික සහ ශාස්ත්‍රීය සහයෝගීතාව වර්ධනය කිරීම, ලබාගත් දැනුම සහ දැනුම ප්‍රජාව වෙත පැවරීම සඳහා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIS), පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
- පලතුරු, එළවළු සහ විසිතුරු පැලෑටිවල උරාබොන පලිබෝධයන් කළමනාකරණය කිරීම සඳහා දේශීය ඖෂධීය පැලෑටිවලින් පැලෑටි ආරක්ෂණ නිෂ්පාදන (PPP) නිස්සාරණය, වෙන් කිරීම සහ සම්පාදනය.
- ජාතික පර්යේෂණ සභාව, කැලණිය විශ්වවිද්‍යාලය, බහු වාහක පාලන මැදිහත්වීම් භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ ඩෙංගු මර්දනය කිරීමේ මෙහෙයුම් ආකෘතිය පිළිබඳ නව නිෂ්පාදන සංවර්ධනය සහ ප්‍රජා සහභාගීත්වය.
- සර්ම කලාපීය පරිසරයකට සහ උණ නිෂ්පාදන සංවර්ධනයට ගැලපෙන ලෙස උණ තෘණ දණ්ඩ සැකසීම.
- අඹ සහ ගස්ලබු වල ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය කිරීම සඳහා ශාක පදනම් වූ දිලීර නාශක සැකසීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මාකඳුර පර්යේෂණ ස්ථානය, .
- පිළිකා, දියවැඩියා විරෝධී සහ ප්‍රතිශක්තිකරණ බලපෑම් සහ ශ්‍රී ලංකාවෙන් තෝරාගත් සාගර ඇල්ගී වලින් හුදකලා වූ සංයෝගවල අණුක ලක්ෂණ, ශ්‍රී ලංකාව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,.
- Gyrinopswallageatner (වල්ලපට්ටා) රසායනික විශ්ලේෂණය පිළිබඳ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
- ඖෂධ පැළෑටි පිළිබඳව පර්යේෂණ පිළිබඳ ශ්‍රී ලංකා දේශීය වෛද්‍ය ආයතනය.

5 වන පරිච්ඡේදය: පරිසර දූෂණය අධීක්ෂණය සහ අවම කිරීම

කාර්මික තාක්ෂණ ආයතනය, වායු දූෂණ පාලනය සහ අවම කිරීම, අපජලය පිරියම් කිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, ජල ගුණාත්මක බව පිළිබඳ අධ්‍යයන, අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණය, පාරිසරික බලපෑම් ඇගයීම ඇතුළු පාරිසරික විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය තුළද සේවාවන් 170 ක් සපයන ලදී.

5.1 අපජලය පවිත්‍රකරණය

කාර්මික තාක්ෂණ ආයතනය අපජලය පිරිපහදු කිරීම පිළිබඳ ආදර්ශන සහ අපජල පවිත්‍රාගාර ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ උපදේශන සපයයි. සමාලෝචන වර්ෂය තුළ, තෙලිප්පලෙයි සහ පේදුරුතුඩුව මූලික රෝහල්වල සහ කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලේ අපජල පවිත්‍රාගාර ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ආදර්ශන සහ උපදේශන ඉදිරිපත් කරන ලදී. රෙදිපිළි කර්මාන්තයේ අපජල පිරිපහදුව වැඩිදියුණු කිරීම සඳහා පූගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් සහ පොළොන්නරුව අධිකරණයේ සහල් මෝලකට එරෙහිව වායු හා ජල දූෂණය පාලනය කිරීමේ නඩුවක් සඳහා තාක්ෂණික උපදේශන ලබා දෙන ලදී.

කාර්මික තාක්ෂණ ආයතනයේ පාරිසරික තාක්ෂණ අංශයේ තාක්ෂණික උපදේශනය යටතේ CIC හි කෘෂි රසායන සැකසීමේ සහ ඇසුරුම් කර්මාන්තයක අපජල පිරිපහදු කිරීමේ පහසුකම සහ දුවිලි හා දුම නිස්සාරණ පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2020 වසර සඳහා ජනාධිපති පරිසර සම්මානය දිනා ගත්තේය.

යාපනය කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන නූල් සායම් කර්මාන්තයක් සඳහා අපජල පිරිපහදු පහසුකම් ක්‍රියාත්මක කිරීමේ අදියර තුනකින් යුත් ව්‍යාපෘතියේ පළමු අදියර දෙක 2018 දී ආරම්භ කරන ලද අතර එය සමාලෝචිත වර්ෂය තුළ අවසන් කරන ලදී. මෙම අදියර යටතේ අපජල පිරිපහදු කිරීමේ පහසුකම සැලසුම් කරන ලද අතර, බලාගාරය ආරම්භ කිරීම සහ ක්‍රියාකරවන්නන්ගේ පුහුණුව සහ ඉදිකිරීම් අධීක්ෂණය සිදු කරන ලදී.

5.2 වායු දූෂණය පාලනය

අවට වාතයේ ගුණාත්මකභාවය සහ දුම්කවුළු විමෝචනය අධීක්ෂණය කිරීම

1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ 32 වන වගන්තිය යටතේ 2008 අගෝස්තු 15 වන දින පළ කරන ලද 1562/22 අතිවිශේෂ ගැසට් පත්‍රයේ ජාතික පරිසර (අවට වාතයේ ගුණාත්මකබව) රෙගුලාසි තුළ නිර්දේශ කර ඇති ක්‍රම අනුව අවට වාතයේ ගුණාත්මකභාවය අධීක්ෂණය කරන ලදී. සමාලෝචන වර්ෂය තුළ, අනුරාධපුර ශ්‍රී මහා බෝධි පරිශ්‍රය, විල්පත්තු ජාතික වනෝද්‍යානය, ලක්විජය බලාගාරය, නොරොච්චලේ ගල් අඟුරු බලාගාරය සහ කොළඹ CHEC වරාය නගරය ආශ්‍රිතව වාතයේ ගුණාත්මකභාවය නිරීක්ෂණය කරන ලදී. හම්බන්තොට ඛනිජ තෙල් පිරිපහදුව සහ මුතුරාජවෙල එල්එන්ජී ව්‍යාපෘතිය සඳහා වාතයේ ගුණාත්මකභාවය පිළිබඳ මූලික සමීක්ෂණ සිදු කරන ලදී.

වාතයේ ගුණාත්මක බව ඇගයීම

කර්මාන්තශාලාවල සාමාන්‍ය ක්‍රියාකාරකම් හරහා මීතේන් නොවන VOC අවට පරිසරයට විමෝචනය කළ හැකිය. මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිතීන්ට අනුව විමෝචන මට්ටම් තක්සේරු කිරීම සඳහා සාමාන්‍ය මෙහෙයුම් වලදී ක්ෂණික මීතේන් නොවන වාෂ්පශීලී කාබනික සංයෝග (VOC) සඳහා වායු තත්ත්ව තක්සේරුවක් සිදු කරන ලදී. කැලණියේ Kent Display, රත්මලානේ ETAL සමූහය, දිවුලපිටියේ Sanken constructions, කොටදෙණියාවේ Access Engineering PLC, පිළියන්දල Wilton Metal Box සහ මහරගම Toyota Lanka ඇතුළු කර්මාන්තවල වාර්ෂික වායු තත්ත්ව තක්සේරුව සිදු කරන ලදී.

ගෘහස්ථ වාතයේ ගුණාත්මක බව ඇගයීම

CO, CO_2, RH, DBT, TVOCs සහ PM_{10} සඳහා ගෘහස්ථ වායු ගුණාත්මක බවට අදාළව Jones Lang Lasalle Lanka හි කොළඹ ස්ථාන හතරක පිහිටා ඇති මෙහෙයුම් මධ්‍යස්ථානවල ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරන ලදී. එමෙන්ම, ලක්දනව් සමාගමෙහි මෙගාවොට් 350 ඒකාබද්ධ චක්‍ර බලාගාරය සඳහා වායු තත්ත්ව ආකෘති නිර්මාණය සිදු කෙරිණි.

වායු දූෂණ පාලන පද්ධති නිර්මාණය

පාරිසරික අධිකාරීන්ට අවශ්‍ය නියාමන ප්‍රමිතීන් සපුරාලීම සඳහා වායු දූෂණ පාලන පද්ධති සැලසුම් කිරීමේ ; සිට ක්‍රියාත්මක කිරීමේ අදියර දක්වා නවීන තාක්ෂණයන් සමඟින් කාර්මික තාක්ෂණ ආයතනය උපදේශන සේවා සපයයි.

ෆයිබර්ග්ලාස් බෝට්ටු නිෂ්පාදන සහ අලුත්වැඩියාවෙන් නික්මෙන මීතේන් නොවන වාෂ්පශීලී කාබනික සංයෝග (NMVOCs) නිස්සාරණය කිරීම, ප්‍රතිකාර කිරීම සහ විසුරුවා හැරීම සඳහා ප්‍රධාන වැඩ කරන අංගනය සහ සහායක වැඩ අංගනය සඳහා සක්‍රිය කාබන් අවශෝෂණ ඒකකයක් සහ තොගයක් සහිත වෙනම සාමාන්‍ය පිටාර වාතාශ්‍රය පද්ධති දෙකක් යෝජනා කරන ලදී. එසේම, Shifa enterprises සහ Vista Creation (Pvt) Ltd වෙත අඛණ්ඩව සහාය දක්වන ලදී.


5.3 ශබ්ද සහ කම්පන පාලනය

විවිධ සෞඛ්‍ය උවදුරු හා බාධා ඇති කරන ප්‍රධාන පරිසර දූෂණ කාරකයක් වන්නේ ශබ්දයයි. පාරිසරික රෙගුලාසිවලට අනුව, ශබ්දය සහ කම්පනය පිළිබඳ පාරිසරික ගැටළු වැළැක්වීම සඳහා කර්මාන්ත විසින් විසඳුම් ගත යුතුය. කාර්මික තාක්ෂණ ආයතනය විසින් ශබ්දය අවම කිරීම සඳහා විශේෂඥ දැනුම සහ උපකරණ පිරිනමයි. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ, බලාගාරයේ සවිස්තරාත්මක ශබ්ද විශ්ලේෂණයකින් පසු හොරණ පෞද්ගලික බලාගාරයක් සඳහා ශබ්ද අඩු කිරීමේ යෝජනාවක් නිර්මාණය කරන ලදී. PET බෝතල් නිෂ්පාදන කර්මාන්තය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා, ශබ්ද ප්‍රභවයන් හඳුනාගෙන බලාගාරය පිළිබඳ සවිස්තරාත්මක විමර්ශනයක් කිරීමෙන් පසු ශබ්ද අවම කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

6 වන පරිච්ඡේදය - තිරසර සංවර්ධනය

6.1 සේවා නියුක්ති සංඛ්‍යාලේඛන

කාර්මික තාක්ෂණ ආයතනය විසින් අලුතින් ස්ථාපිත කරන ලද ඛනිජ තෙල් සහ ලිහිසි තෙල් පරීක්ෂණ රසායනාගාරය සහ ඖෂධ රසායනාගාරය සඳහා සේවකයන් 17 දෙනෙකු බඳවාගෙන ඇති අතර, මේ වන විට සම්පූර්ණ ස්ථිර කාර්ය මණ්ඩලය 350 කි. මුළු ස්ථිර සේවක සංඛ්‍යාව තාක්ෂණික සේවා අංශයේ 156 (44%)කින්, පර්යේෂණ සහ සංවර්ධන අංශයේ 87 (25%)කින් සහ පරිපාලන සහ මෙහෙයුම් අංශයේ 52 (15%) කින්. සභාපතිගේ කාර්යාලය, අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යාලය, අභ්‍යන්තර විගණන අංශය, ඉංජිනේරු සේවා අංශය, පරිගණක ඒකකය, තොරතුරු සේවා මධ්‍යස්ථානය සහ තත්ව සහතික අංශය වැනි අනෙකුත් අංශවල ස්ථිර සේවකයන් 55 (16%) ක් සේවය කරයි. රසායනික සහ ක්ෂුද්‍රජීව විද්‍යා රසායනාගාරය ආයතනයේ විශාලතම අංශය වන අතර එහි මුළු කාර්ය මණ්ඩලයෙන් 46 ක් (16.8%) ක් සේවය කරයි. රූකියා නියුක්ති සංඛ්‍යාලේඛන පහත දක්වා ඇත.




කාර්ය මණ්ඩලයේ බෙදී යාම

තාක්ෂණික අංශයට තාක්ෂණික කාර්ය මණ්ඩලයේ 94 ක්, පර්යේෂණ කාර්ය මණ්ඩලයේ 81 ක්, පරිපාලන කාර්ය සහ කළමනාකරණ සහකාරවරුන් 25 ක් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය 33 ක් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 10 දෙනෙකු ඇතුළත් වේ.


සහාය අංශවලට පරිපාලන සහ කළමනාකරණ සහකරුවන් 39, ප්‍රාථමික මට්ටමේ 24, තාක්ෂණික කාර්ය මණ්ඩලයේ 16 ක්, පර්යේෂණ කාර්ය මණ්ඩලයේ 05, ශිල්පීන් 16 සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 7 දෙනෙකු අයත් වේ. කාර්ය මණ්ඩලය බෙදා හැරීම පහත ප්‍රස්ථාරවල - දක්වා ඇත.

ප්‍රවර්ගය අනුව කාර්ය මණ්ඩලයේ බෙදී යාම
තාක්ෂණ අංශය



Technical	- 94
Research	- 81
Administrative & Clerical	- 25
Management	- 10
Others (Aides, Helpers)	- 33

ප්‍රවර්ගය අනුව කාර්ය මණ්ඩලයේ බෙදී යාම
සහය අංශ




Administrative & Clerical	- 39
Others (Drivers, Helpers)	- 24
Technical	- 16
Research	- 05
Management	- 07
Craftsmen (Skilled and Semi skilled)	- 16

පර්යේෂණ කාර්ය මණ්ඩලය


පර්යේෂණ කාර්ය මණ්ඩලයට විද්‍යාඥයන් 94 ක් සහ ඉංජිනේරුවන් 16ක් ඇතුළත් වේ. පර්යේෂණ කාර්ය මණ්ඩලයේ 22 ක් ආචාර්ය උපාධි ලබා ඇති අතර 28 දෙනෙකු විද්‍යාපති/දර්ශනපති/පශ්චාත් උපාධි ඩිප්ලෝමා ලබා ඇත. පර්යේෂණ කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනික පසුබිම පහත - ප්‍රස්තාරවල දක්වා ඇත.

පර්යේෂණ කාර්ය මණ්ඩලය - අධ්‍යාපන පසුබිම



Bachelor's degree	- 50
MSc/MPhil/PG Diploma	- 28
Doctoral degree	- 22

පර්යේෂණ කාර්ය මණ්ඩලය - විද්‍යාඥයන්/ඉංජිනේරුවන්



Scientists	- 84
Engineers	- 16

පර්යේෂණ කාර්ය මණ්ඩලයේ විශේෂඥතාව

ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන අංශය අංශ පහකින් සමන්විත වෙයි,. ආහාර තාක්ෂණය, ඖෂධ තාක්ෂණය, ද්‍රව්‍ය තාක්ෂණය, පරිසර තාක්ෂණය සහ ජෛව තාක්ෂණය වශයෙනි. පර්යේෂක කාර්ය මණ්ඩලය, මාලබේ සහ කොළඹ පිහිටා ඇති නවීන පර්යේෂණ හා සංවර්ධන සංකීර්ණයේ නවීන පර්යේෂණ සහ සංවර්ධන රසායනාගාර හරහා බහුවිධ ක්ෂේත්‍රවල ඉල්ලුම මත පදනම් වූ, ජාතික වැදගත්කමකින් යුත් අධි තාක්ෂණික පර්යේෂණ පිළිබඳ ඔවුන්ගේ විශේෂඥ ක්ෂේත්‍රවල පර්යේෂණ සහ සංවර්ධන සහ නවෝත්පාදන සිදු කරයි. පර්යේෂණ සහ සංවර්ධන අංශයේ පර්යේෂණ කාර්ය මණ්ඩලය, විසඳුම් අභිමුඛ නවෝත්පාදනයන් සපයන අතර තාක්ෂණික පැවරීම, තාක්ෂණයන් ගලපා ගැනීම සහ කාර්මික ප්‍රවර්ධනය, ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්, ආරම්භක ව්‍යාපාර, කාන්තා ව්‍යවසාය සහ කුඩා ව්‍යාපාර ඉලක්ක කරගනිමින් ව්‍යවසාකත්ව සංවර්ධනය හා සම්බන්ධ කාර්යයන්ගේ නියැලෙයි. අපනයන කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා සහ ආනයන විකල්ප සහ දේශීය අගය එකතු කිරීම සඳහා තාක්ෂණය සැපයීමටද පර්යේෂණ කාර්ය මණ්ඩලය සම්බන්ධ වේ. පාරිසරික තාක්ෂණ ක්ෂේත්‍රය තුළ අපි, කාර්මික දූෂණ පාලනය සහ ශබ්ද හා කම්පන අධික්ෂණය ඇතුළු පාරිසරික අධීක්ෂණ අංශ තුළ ප්‍රධාන වැඩ කොටසක් ඉටු කරන්නෙමු. පර්යේෂණ කාර්ය මණ්ඩලයට තොරතුරු කළමනාකරණය සහ තත්ත්ව කළමනාකරණ පද්ධති පිළිබඳ විශේෂඥ දැනුමක් ද ඇත.


කාර්මික තාක්ෂණ ආයතනයේ තාක්ෂණික සේවා අංශය රසායනාගාර පරීක්ෂණ සහ ක්‍රමාංකන සේවාවන්හි පුරෝගාමියා බවට පත් වී ඇති අතර එහි ප්‍රතීතන විෂය පථය පුළුල් කරගනිමින් එහි පරීක්ෂණ වාර්තා සහ සේවාවන්හි නිරවද්‍යතාවය සහ ජාත්‍යන්තර පිළිගත හැකි බව සහතික කරයි. රටේ ශීඝ්‍ර කාර්මීකරණයට සහය වීම සඳහා මෙම පහසුකම සතුව ඉහළ මට්ටමේ විශ්ලේෂණ පරීක්ෂණ සහ නවීන අධීක්ෂණ උපකරණ මෙන්ම ජංගම විද්‍යාගාරද ඇත. කාර්මික තාක්ෂණ ආයතනය යනු අපනයනකරුවන්, රාජ්‍ය සංවිධාන සහ දේශීය හා ජාත්‍යන්තර නියාමන අධිකාරීන් සඳහා බලයලත් පරීක්ෂණාගාරයයි. සමාලෝචන වර්ෂය තුළ වැදගත් පරීක්ෂණ ක්ෂේත්‍ර දෙකක් සැලකිල්ලට ගැණින: ඛනිජ තෙල් හා ලිහිසි තෙල් සහ ඖෂධ නිෂ්පාදන

ප්‍රවණතා විශ්ලේෂණය


අලුතින් පිහිටුවන ලද ඛනිජ තෙල් සහ ලිහිසි තෙල් රසායනාගාරය සහ ඖෂධ රසායනාගාරය සඳහා 17 ක් ඇතුළුව කාර්ය මණ්ඩලය 39 ක් බඳවා ගන්නා ලදී. අනුමත සේවක සංඛ්‍යාව 439ට සාපේක්ෂව ආයතනයේ සම්පූර්ණ ස්ථිර කාර්ය මණ්ඩලය 350 දක්වා වැඩි විය. වසර තුළදී, පර්යේෂණ කාර්ය මණ්ඩලය ප්‍රතිශතය නොවෙනස්ව පැවති අතර තාක්ෂණික ශ්‍රේණියේ කාර්ය මණ්ඩලය 3% ක මද වැඩිවීමක් පෙන්නුම් කළේය. පරිපාලන, ලිපිකරු, ශිල්පීන් සහ අනෙකුත් තනතුරුවල ආන්තික අඩුවීමක් පෙන්නුම් කළේය.

2015 සිට 2020 දක්වා ආචාර්ය උපාධිධාරීන් සහ පශ්චාත් උපාධිධාරීන් සංඛ්‍යාව නොවෙනස්ව පැවතිණි. පර්යේෂණ විද්‍යාඥයින් සහ පර්යේෂණ ඉංජිනේරුවන් අතර අනුපාතය වන 1:5 නොවෙනස්ව පැවතුනි.


2016 - 2020 අතර කාලය තුළ කාණ්ඩ අනුව බෙදී යාම



පර්යේෂණ කාර්ය මණ්ඩලයේ අධ්‍යාපන පසුබිම



විද්‍යාඥ/ඉංජිනේරු අනුපාතය 2016-2020



6.2 තත්ව සහතික

ISO/IEC 17043: 2010 ප්‍රවීණතා පරීක්ෂණ සඳහා ප්‍රතිතනය

කාර්මික තාක්ෂණ ආයතනය වෙත, ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය (SLAB) විසින් ISO/IEC 17043:2010 ප්‍රවීණතා පරීක්ෂණ සඳහා ප්‍රතිතනය ප්‍රදානය කළ අතර ඒ අනුව කාර්මික තාක්ෂණ ආයතනය ශ්‍රී ලංකාවේ පිළිගත් පළමු ප්‍රවීණතා පරීක්ෂණ සැපයුම්කරු බවට පත් විය. ජාතික තත්ත්ව යටිතල පහසුකම්වල ඉතා වැදගත් අංගයක් වන ප්‍රවීණතා පරීක්ෂණ, කාර්මික තාක්ෂණ ආයතනය විසින් ශ්‍රී ලංකාවේ රසායනාගාර වෙත ලබා දෙනු. ජල ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ආහාර ක්ෂුද්‍රජීව විද්‍යාව සහ සිමෙන්ති පිළිබඳ රසායනික හා භෞතික පරීක්ෂණ යන ක්ෂේත්‍රවල ප්‍රවීණතා පරීක්ෂණ වැඩසටහන් හරහා ඔවුන්ගේ නිපුණතාවය පිළිබඳ සාක්ෂි සනාථ කිරීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය දැනට රසායනාගාර විශාල සංඛ්‍යාවකට සේවය කරයි. 2020 දී දේශීය කර්මාන්තය සඳහා සිමෙන්ති ප්‍රවීණතා පරීක්ෂණ වැඩසටහනක් පැවැත්වීමෙන් ප්‍රවීණතා පරීක්ෂණ ප්‍රතිතන තත්ත්වය පවත්වා ගෙන යන ලදී.

කාර්මික තාක්ෂණ ආයතනයේ යටිතල පහසුකම්වල තත්ත්වය වැඩි දියුණු කිරීම

කාර්මික තාක්ෂණ ආයතනයේ දැනට පවතින රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය ISO/IEC 17025:2017, අභ්‍යන්තර විගණන පැවැත්වීමෙන් සහ පළිබෝධනාශක සඳහා වන විෂය පථය පරාමිති 100කට වඩා වැඩි ප්‍රමාණයකින් පුළුල් කිරීම මගින් නඩත්තු කරන ලදී. UNIDO හි සහාය ඇතිව අලුතින් ස්ථාපිත ඇසුරුම් රසායනාගාරයට ප්‍රතිතන තත්ත්වය යොදන ලදී.

6.3 තොරතුරු සේවාවන්

තොරතුරු සේවා මධ්‍යස්ථානය (ISC) පොත් 22000කට අධික ප්‍රමාණයක්, ප්‍රමිති, නැවත මුද්‍රණ 100,000කට අධික ප්‍රමාණයක්, මාර්ගගත දත්ත සමුදායන් සහ අනෙකුත් විවිධ ප්‍රකාශන ඇතුළත් පුළුල් පරාසයක සම්පත් නඩත්තු කිරීම සහ වැඩි කිරීම අඛණ්ඩව කරගෙන ගියේය. මධ්‍යස්ථානය Science Direct දත්ත ගබඩාවේ කොටස් හතරකට අඛණ්ඩව දායක විය; රසායන විද්‍යාව, ද්‍රව්‍ය, කෘෂිකර්මය සහ ජීව විද්‍යා සහ ඖෂධවේදය, විෂ විද්‍යාව සහ ඖෂධ විද්‍යාව.Science Direct යනු බාහිර භාවිතා කරන්නන් අතර පවා වඩාත් ජනප්‍රිය තොරතුරු මූලාශ්‍රය විය. කොවිඩ් -19 වසංගතය හමුවේ රට වසා දැමූ කාලය අතරතුර, ප්‍රකාශකයන් විසින් Science Direct හි සියලුම සඟරා සහ පොත් සඳහා දුරස්ථ ප්‍රවේශය ලබා දුන් අතර පර්යේෂකයන්ට ඔවුන්ගේ නිවෙස්වලින් දත්ත ගබඩාවට ප්‍රවේශ වීමට හැකි විය.

වසර තුළ පොත් 4ක් මිල දී ගත් අතර 31ක් පරිත්‍යාග ලෙස ලැබී තිබිණි. එහි මුළු පොත් සංඛ්‍යාව 35කි. ISC විසින් සිය ඉ- පොත් එකතුව අඛණ්ඩව සංවර්ධනය කරන ලද අතර, අභ්‍යන්තර පරිශීලකයින්ට I.net හරහා පොත් වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසන පොත් 37ක් සේවාදායකය යා වෙත උඩුගත කරන ලදී. කාර්ය මණ්ඩලයේ ඉල්ලීම මත ප්‍රමිති මිලදී ගෙන ඇති අතර මෙම කාලය තුළ දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිතීන් 72 ක් මිලදී ගැණිනි. EDB හි සාමාජිකත්වය ද අඛණ්ඩව පවත්වා ගත් අතර අවශ්‍ය විටෙක වෙළඳ සංඛ්‍යාලේඛන ලබා ගැනීමට මෙය උපකාරී විය.

කාර්මික තාක්ෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් මෘදු පිටපත්, ස්කෑන් කරන ලද ලේඛන සහ ප්‍රකාශන කාර්මික තාක්ෂණ ආයතන වෙබ් අඩවියට සම්බන්ධ කර ඇති D-Space ඩිජිටල් ගබඩා දත්ත ගබඩාවට ඇතුළත් කරන ලදී. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ පර්යේෂණ ලිපි 122ක් D-Space ඩිජිටල් ගබඩාවට උඩුගත කරන ලදී.

COVID-19 වසංගතය හේතුවෙන්, පුස්තකාලය මාර්තු මාසයෙන් පසු විමර්ශන කාර්යයන් සඳහා වසා දැමුණු නමුත් පොත් ලබා ගැනීමට අවසර දෙන ලදී. සමාලෝචිත කාල සීමාව තුළ පරිශීලකයින් 240 ක් පුස්තකාලයට පැමිණ ඇති අතර පොත් 118 ක් සහ ප්‍රමිති 60 ක් නිකුත් කර ඇත.

6.4 සම්මාන

- ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් සංවිධානය කරන ලද සම්මාන ප්‍රදානෝත්සවයේදී කේ.වී.ටී. ගුණවර්ධන, ඒ.ඩබ්ලිව්. ඩී ප්‍රියංගනී මෙනවිය සහ ඒ.ඒ.එන්. ලලන්ත යන මහත්ම මහත්මීහු ආහාර තාක්ෂණ ශිල්පීය ක්ෂේත්‍රය යටතේ ක්ෂණික සහල් නිෂ්පාදනයක් වන “Ezy Rice” සංවර්ධනය සඳහා වූ වාණිජ අංශයේ රන් පදක්කම දිනා ගත්ත.

- ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් සංවිධානය කරන ලද සම්මාන උළෙලේදී කෘෂිකාර්මික පළිබෝධ පාලනය සඳහා ශ්‍රී ලංකාවේ වගා කරන ලද ඖෂධීය සහ ඇරෝමැටික ශාක සාරය භාවිතා කරමින් ස්වභාවික කෘෂිකාර්මික පළිබෝධ පාලන නියෝජිතයන් (NAPCA) සංවර්ධනය කිරීම සඳහා වූ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය යටතේ විවෘත අංශයේ රන් පදක්කම මහාචාර්ය ආර්. එම්. ධර්මදාස දිනා ගත්තේය. .

- ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLAAS) විසින් පිරිනමන GRC පශ්චාත් උපාධි පර්යේෂණ සම්මානය ආචාර්ය කෞෂල්‍යා අබේසේකර දිනා ගන්නා ලදී.

- ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLAAS) D කොටස විසින් පිරිනමන GRC පශ්චාත් - උපාධි සම්මාන සම්මානය ආචාර්ය වසුන්දරා දිවිසේකර දිනා ගන්නා ලදී.

- ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLAAS) GRC පශ්චාත් උපාධි සම්මාන සම්මානය ආචාර්ය සචින්ද්‍ර පෙරේරා දිනා ගන්නා ලදී.

6.5 ධාරිතා සංවර්ධනය

පශ්චාත් උපාධි අධ්‍යයන

- ආචාර්ය ජේ.කේ.ආර්.ආර්.සමරසේකර, ආචාර්ය ජී.එච්.සී.එම්.හෙට්ටිආරච්චි සහ ආචාර්ය එම්.ජේ. ගුණරත්න ගේ අධීක්ෂණය යටතේ සචිනි ජයවර්ධන මෙය “Prebiotic and bioactive properties of Sri Lankan finger millet (*Eleusine coracana*) varieties”පිළිබඳ අධ්‍යයනය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ලබා ගත්තාය.

- ආචාර්ය. ජේ.කේ.ආර්.ආර්. ස්මරසේකර, මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම සහ ආචාර්ය කේ.පී හේමලාල් ගේ අධීක්ෂණය යටතේ, ගවිනි ලියනාරච්චි මෙය “Antioxidant and enzyme inhibitory

activities of selected medicinal plants and chemical characterization of phytoceuticals of *Artocarpus nobilis* and its topical applications" පිළිබඳ අධ්‍යයනය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ලබා ගත්තාය.

- ආර්.ටී. නිලූෂා මෙය "Anaerobic ceramic membrane bioreactor for treating domestic wastewater at ambient temperature for tropical areas" පිළිබඳ අධ්‍යයනයක් සඳහා චීනයේ චීන විද්‍යා ඇකඩමියේ පරිසර විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානයෙන් සිය ආචාර්ය උපාධිය ලබා ගත්තාය.

- ෂර්ලි රණතුංග මහතා "Spatial-temporal variation of rainfall and stream flow basin and associated mechanism" පිළිබඳ අධ්‍යයනයක් සඳහා චීනයේ චීන විද්‍යා ඇකඩමියේ පරිසර පරිසර විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානයෙන් සිය ආචාර්ය උපාධිය ලබා ගත්තේය.

- දිනෙත් සමරවික්‍රම මහතා "ශ්‍රී ලංකාවේ අඹ අස්වැන්නෙන් පසු සිදුවන පාඩුව විසඳීම සඳහා ස්වභාවික තන්තු ආශ්‍රිත, ස්මාර්ට් ඇසුරුම් ද්‍රව්‍ය සංවර්ධනය කිරීම" පිළිබඳ අධ්‍යයනය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ලබා ගත්තේ ය.

- ඩී.එම්.ඒ. පීරිස් මෙය මොරටුව විශ්වවිද්‍යාලයෙන් තිරසාර ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ගත්තාය.

- G. S. ලියනගේ මෙය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් නැනෝ විද්‍යාව සහ නැනෝ තාක්ෂණය පිළිබඳ විද්‍යාපති සම්පූර්ණ කළාය.

සිදු කෙරෙමින් යන ආචාර්ය උපාධි / විද්‍යාපති / දර්ශනපති අධ්‍යයන

- හිමාෂි කරුණාරත්න මෙය කැලණිය විශ්වවිද්‍යාලයේ "Microflora in different types of tea produced in three different elevations in Sri Lanka" පිළිබඳ සිය ආචාර්ය උපාධි අධ්‍යයනය සිදු කරමින් සිටී.

- උපේකා රාජවර්ධන මෙය කොළඹ විශ්වවිද්‍යාලයේ "Isolation, identification and characterization of health beneficial bacteria and pathogenic micro-flora of dairy origin in Sri Lanka."පිළිබඳ සිය ආචාර්ය උපාධි අධ්‍යයනය සිදු කරමින් සිටී.

- එච්.ඩී වීරතුංග මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ "Investigation on natural fragrances and other volatiles from Sri Lankan flora and their industrial applications" පිළිබඳ සිය ආචාර්ය උපාධි අධ්‍යයනය සිදු කරමින් සිටී.

- ජී.වී.වී. ලියනආරච්චි මෙය කොළඹ විශ්ව විද්‍යාලයේ “Amino acid profiling of selected Sri Lankan rice (*Oryza sativa*) varieties using liquid chromatographic techniques”පිළිබඳ සිය ආචාර්ය උපාධි අධ්‍යයනය සිදු කරමින් සිටී.

- ඩී.ඒ.ටී.ඩබ්ලිව්.කේ දිසානායක මෙය පේරාදෙණියේදී“Research study on degradation kinetics of glyphosate residues, metabolites and additives in conventional fields of application and simulated environments” පිළිබඳ සිය ආචාර්ය උපාධි අධ්‍යයනය සිදු කරමින් සිටී.

- ජී.යූ.චන්ද්‍රසිරි මෙය කොළඹ විශ්ව විද්‍යාලයේ “Investigation on trace elements content in selected rice varieties and the uptake of toxic elements by rice under simulated environments” පිළිබඳ සිය ආචාර්ය උපාධි අධ්‍යයනය සිදු කරමින් සිටී.

- කේ.ඩී.එස්.එම් කරුණාරත්න මෙය කොළඹ විශ්ව විද්‍යාලයේ “Development of a database for mineral profiles, TLC profiles and phenolic profiles of selected traditional and widely consuming, improved rice varieties of Sri Lanka” පිළිබඳ සිය ආචාර්ය උපාධි අධ්‍යයනය සිදු කරමින් සිටී.

- ගයත්‍රි ද සිල්වා මෙය මොරටුව විශ්ව විද්‍යාලයේ “Design and optimization of non-thermal plasma sterilization system for selected powdered spices” පිළිබඳ සිය ආචාර්ය උපාධි අධ්‍යයනය සිදු කරමින් සිටී.

- එච්.එච්.කේ අචලා මෙය චීන මහජන සමූහාණ්ඩුවේ Wuhan, Hubei හි මධ්‍යම චීන සාමාන්‍ය විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා විද්‍යාලයේ “Genetic and Phenotypic Studies of Synthetic Abscisic Acid Signal Modulators” පිළිබඳ සිය ආචාර්ය උපාධි අධ්‍යයනය සිදු කරමින් සිටී.

- මදාරා සමරනායක මෙය කොළඹ විශ්ව විද්‍යාලයේ “A study on selected nutritional properties and seed chemical characteristics of a range of Sri Lankan rice varieties” පිළිබඳ සිය ආචාර්ය උපාධි අධ්‍යයනය සිදු කරමින් සිටී.

- රුවිනි පූර්ණිකා දසනායක මෙය කොළඹ විශ්ව විද්‍යාලයේ “Investigation on trans fats, omega 6:3 ratio and cholesterol in selected food commodities to establish the local permissible levels of fatty acid composition” පිළිබඳ සිය දර්ශනපති අධ්‍යයන කටයුතු සිදු කරයි.

- එල්.ඩී.සී. නයනජිත් මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ “Microwave synthesis and characterization of graphene and graphene polymer composites for conducting and other applications” පිළිබඳ සිය ආචාර්ය උපාධි අධ්‍යයනය සිදු කරමින් සිටී.

- කේ.එස්.පී. කරුණාදාස මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ "Conversion of readily available Sri Lankan natural quartz to solar grade silicon for applications in electronic industries" පිළිබඳ සිය ආචාර්ය උපාධි අධ්‍යයනය සිදු කරමින් සිටී.

- ආර්.සී.ඩබ්ලිව් මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ "Development of Red-clay based water filter/apparatus for the removal of hardness and other contamination in the drinking water" පිළිබඳ සිය ආචාර්ය උපාධි අධ්‍යයනය සිදු කරමින් සිටී.

- ඉංජිනේරු ඩබ්ලිව්.ආර්.එල්. විජේසේකර කොළඹ විශ්ව විද්‍යාලයේ " Application of anaerobic degradation for the treatment of poultry processing wastewater and its potential for global warming due methane emission" පිළිබඳ සිය ආචාර්ය උපාධි අධ්‍යයනය සිදු කරමින් සිටී.

- ඒ.එම්.කේ.එල්. අබේකෝන් මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ "Synthesis and characterization of nanostructures advanced materials for solar water splitting hydrogen production" පිළිබඳ ඔහුගේ දර්ශනපති අධ්‍යයනය සිදු කරමින් සිටී.

- ප්‍රසාජී ද සොයිසා මෙය කොළඹ විශ්වවිද්‍යාලයේ "Evaluation and quantification of sugar and metal composition of commonly consumed foods based on WHO nutrient profile model for south-east Asian region" පිළිබඳ ඇයගේ දර්ශනපති අධ්‍යයනය සිදු කරමින් සිටී.

- මහේෂි ජයසිංහ මහත්මිය කැලණිය විශ්වවිද්‍යාලයේ "Identification of potential spoilage and pathogenic microorganisms associated with the production of thermally processed king coconut water (*Cocos nucifera* var. aurantiaca) in Sri Lanka"පර්යේෂණය සමඟින් සිය විද්‍යාපති අධ්‍යයනය සිදු කරමින් සිටී.

- සවිද්‍යා ලියනගේ මෙය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ "Physicochemical, nutritional and antioxidants properties of selected pipeline rice varieties of Sri Lanka". පර්යේෂණය සමඟින් සිය විද්‍යාපති අධ්‍යයනය සිදු කරමින් සිටී.

- එච්.එම්.බී.අයි. ගුණතිලක මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ "Development of LiCl based gel electrolyte and their applications on electrochromic devices" පිළිබඳ විද්‍යාපති අධ්‍යයනය සිදු කරමින් සිටී.

- එස් ජයරත්න මෙය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ "Identification of aroma compounds, heavy metals and aflatoxin in value-added coconut oil and coconut oil-based cosmetic products" පිළිබඳ විද්‍යාපති අධ්‍යයනය සිදු කරමින් සිටී.

- ඒ.යූ.ඩබ්. දිසානායක මෙය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ “Assessment of proximate composition, physical properties and antioxidant properties of flour made from underutilized tuber crops in Sri Lanka” පිළිබඳ විද්‍යාපති අධ්‍යයනය සිදු කරමින් සිටී.

- ජේ.ඒ. හසරා අබේරත්න මෙය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආහාර විද්‍යාව හා තාක්ෂණවේදය පිළිබඳ විද්‍යාපති අධ්‍යයනය සිදු කරමින් සිටී.

- පී.මනුෂිකා කලුපෙරුම මෙය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආහාර විද්‍යාව හා තාක්ෂණවේදය පිළිබඳ විද්‍යාපති අධ්‍යයනය සිදු කරමින් සිටී.

- එස්.වී. අමරසේන මෙය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආහාර විද්‍යාව හා තාක්ෂණවේදය පිළිබඳ විද්‍යාපති අධ්‍යයනය සිදු කරමින් සිටී.

- කේ.එම්.බී.පී.පී. කලාටුවාවේ මෙය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ පරිසර දූෂණ පාලන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති අධ්‍යයනය සිදු කරමින් සිටී.

- එච්. ප්‍රතිභා මහත්මිය කාර්මික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති අධ්‍යයනය සිදු කරමින් සිටී.

- පී.ඩී.බුද්ධික මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාපති අධ්‍යයනය සිදු කරමින් සිටී.

- යූ.අයි. මැදවත්ත මෙය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යාපති අධ්‍යයනය සිදු කරමින් සිටී..

6.6 විදේශ පුහුණු වැඩසටහන්

- ඉංජිනේරු ඩී.එම්.එච්.එස්. දිසානායක 2020 සැප්තැම්බර් 15 වන දින ස්විට්සර්ලන්තයේ ජිනීවා හි මිනමාටා ලේකම් කාර්යාලය විසින් පවත්වන ලද “මර්කරි පිළිබඳ මිනමාටා සම්මුතිය: සඵලතා ඇගයීම සඳහා අධීක්ෂණ මාර්ගෝපදේශය පිළිබඳ පළමු වෙබිනාර්” (Webex) සඳහා සහභාගී විය.

- ෂර්ලි රණතුංග මහතා 2020 ඔක්තෝම්බර් 12 වන දින චීනයේ ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරන ලද චීන-පකිස්ථාන කොරිඩෝ ව්‍යාපෘති සාකච්ඡාව පිළිබඳ වෙබිනාර් සඳහා සහභාගී විය.

- ආර්.ටී.නිලූෂා මෙය 2020 නොවැම්බර් 21 සිට දෙසැම්බර් 13 දක්වා Global Young Academy හි දකුණු ආසියාවේ විද්‍යා රාජ්‍යතාන්ත්‍රික ක්‍රියාකාරී කණ්ඩායම විසින් සංවිධානය කරන ලද “දකුණු ආසියාවේ විද්‍යා රාජ්‍යතාන්ත්‍රික මාර්ගගත වැඩමුළුවට” සහභාගී විය.

- සුරේකා ලියනගේ මෙය 2020 ඔක්තෝබර් 26 සිට 2021 ජනවාරි 17 දක්වා නෙදර්ලන්තයේ විවෘත විශ්ව විද්‍යාලයේ “ක්ෂුද්‍ර ප්ලාස්ටික් පිළිබඳ දැවැන්ත විවෘත මාර්ගගත පුහුණුවක්” පිළිබඳ මාර්ගගත වැඩසටහනකට සහභාගී විය.

6.7 දේශීය පුහුණු වැඩසටහන්

- ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) විසින් පවත්වන ලද “ISO/IEC 17025: 2017 අනුව රසායනාගාර කළමනාකරණ පද්ධතියේ අභ්‍යන්තර විගණනය” පිළිබඳ වැඩමුළුවකට කේ.ආර්. මධුෂානි ගුණරත්න මෙය සහ ඩබ්. පුබුදුනි හරිස්චන්ද්‍ර මෙය සහභාගී වූහ.
- ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) විසින් පවත්වනු ලබන ISO/IEC 17025:2017 පරීක්ෂණ රසායනාගාර ප්‍රතීතනය පිළිබඳ තක්සේරුකරු පුහුණුවකට කුෂානි මහතන්තිල මෙය සහභාගී වූවාය.
- එම්.ඩී.වයි මිලානි සහ ඊ.එම්.එස්. ඉසංකා 2020 පෙබරවාරි 17 සිට 20 දක්වා ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේදී WIPO විසින් පවත්වන ලද “IP-පාදක නවෝත්පාදනය සඳහා පේටන්ට් සෙවීම සහ පූර්ව කලා තක්සේරුව” පිළිබඳ වැඩමුළුවකට සහභාගී විය.
- ඉංජිනේරු ඩී.එම්.එච්.එස්. දිසානායක මෙය 2020 පෙබරවාරි 26 වැනි දින පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද “ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සංවර්ධනය කිරීම පිළිබඳ පාර්ශවකරුවන්ගේ වැඩමුළුවට සහභාගී විය.
- ඉංජිනේරු ඒ.එච්.එස්. ජයසේකර මෙය VOC මීටරයක් සහ PM විශ්ලේෂකය ඇතුළු වායු තත්ත්ව මැනීමේ උපකරණ පිළිබඳ ධාරිතාව ගොඩනැගීමේ වැඩමුළුවට සහභාගී විය.
- ඉංජිනේරු ඩී.එම්.එච්. එස් දිසානායක මෙය 2020 අගෝස්තු 24 සිට 20 දක්වා පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස පිළිබඳ ශ්‍රී ලංකාවේ 3 වන ජාතික සන්නිවේදනයේ GHG ඉන්වෙන්ටරි සහ අවම කිරීමේ විකල්ප පරිච්ඡේද අවසන් කිරීම පිළිබඳ පාර්ශවකරුවන්ගේ වැඩමුළුවකට සහභාගී විය.
- 2020 අගෝස්තු 24 සිට 28 දක්වා ශ්‍රී ලංකා න්‍යෂ්ටික හා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් සංවිධානය කරන ලද “න්‍යෂ්ටික හා පරමාණුක ශක්තිය” පිළිබඳ පුහුණුව සඳහා ආචාර්ය ආර්.සී.එල්. ද සිල්වා සහ ආර්.සී.ඩබ්ලිව්.ආරච්චිගේ මහතා සහභාගී විය.
- ඉංජිනේරු ඩී.එම්.එච්.එස්. දිසානායක මෙය 2020 සැප්තැම්බර් 18 සහ 24 යන දිනවල ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද, සමස්ත ප්‍රතිපත්ති සංගතභාවය සහ ප්‍රශස්ත ප්‍රතිපත්ති පැකේජයක් සඳහා වන නිර්දේශ ඇගයීම පිළිබඳ 24 වැනි ආරම්භක වැඩමුළුව සඳහා උපදේශන වැඩමුළුවට සහභාගී විය.
- IFSTSL විසින් පවත්වන ලද ආහාර සුරක්ෂිතතාව සහ රෙගුලාසි පිළිබඳ වැඩමුළුවට වජිරා නිලුක්ෂි මෙය සහ මදාරා සමරනායක මෙය සහභාගී වූහ.
- WIPO විසින් සංවිධානය කරන ලද “පේටන්ට් කෙටුම්පත්” පිළිබඳ වෙබිනාර් සඳහා සචිනි ජයවර්ධන මෙය සහභාගී විය.

- උපේක්‍ෂා රාජවර්ධන මෙය ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය/PTB විසින් 2020 නොවැම්බර් 11, 25 සහ දෙසැම්බර් 9 යන දිනවල පවත්වන ලද "SLAB තක්සේරුකරුවන් සඳහා අවශ්ෂ විශ්ලේෂණය පිළිබඳ ක්‍රම වලංගුකරණය සහ යොමු ද්‍රව්‍ය දැනුම පිළිබඳ මාර්ගගත පුහුණුවට සහභාගී විය.
- ආර්.ටී. නිලූෂා මෙය 2020 ඔක්තෝම්බර් 3 වන දින පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කරන ලද පාරිසරික බලපෑම් තක්සේරුව පිළිබඳ වෙබිනාර් සඳහා සහභාගී විය.
- ආර්.ටී. නිලූෂා මෙය 2020 ඔක්තෝම්බර් 6 වන දින පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කරන ලද නාගරික ජල කළමනාකරණය පිළිබඳ වෙබිනාර් සඳහා සහභාගී විය.
- ආර්.ටී.නිලූෂා මෙය 2020 ඔක්තෝම්බර් 9 වන දින පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කරන ලද "අපජල පවිත්‍රකරණයේ දියුණුව" පිළිබඳ වෙබිනාර් සඳහා සහභාගී විය.
- ආර්.ටී.නිලූෂා මෙය 2020 දෙසැම්බර් 11 වන දින පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කරන ලද තිරසර නිර්මිත පරිසරය පිළිබඳ 1 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට (ICSBE) සහභාගී වූවාය.

6.8 ප්‍රචර්ධන අවස්ථා


- උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ‘INNOTECH 2020’ ජාතික තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රදර්ශනය 2020 මාර්තු 12 සිට 14 දක්වා හෝමාගම පිටිපනදී පැවැත්විණි.
- ස්වාධීන රූපවාහිනියේ “ඒක මගේ රට” රූපවාහිනී වැඩසටහන.
- කොවිඩ්-19 වසංගත කාල සීමාව තුළ 2020 මැයි 27 වන දින ගංගාරාම විහාරස්ථානයේදී නිෂ්පාදන ප්‍රවලිත කිරීම සඳහා ආයෝජකයින්ගේ සංසදය පවත්වන ලදී.
- කොවිඩ්-19 වසංගත කාල සීමාව තුළ 2020 ජූලි 1 වන දින ගංගාරාම විහාරස්ථානයේදී නිෂ්පාදන ප්‍රවලිත කිරීම සඳහා ආයෝජකයින්ගේ සංසදය පවත්වන ලදී.


07 පරිච්ඡේදය- මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය වාර්තාව

ආදායම්

ආයතනය, ව්‍යාපාර කටයුතුවලින් රු.මි. 259 ක උත්පාදිත ආදයමක් වාර්තා කර අතර එය පෙර වසරේ වාර්තා වූ මි.304 ට වඩා රු.මි.45 ක අඩුවීමකි. මෙයට හේතුව වූයේ කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් රට මාස තුනකට ආසන්න කාලයක් වසා තිබීමත් එහි ප්‍රතිඵලයක් ලෙස ආයතනයේ පරීක්ෂණ, උපකරණ ක්‍රමාංකනය, තාක්ෂණික මාරු කිරීම්, පුහුණුව, උපදේශන සහ කොන්ත්‍රාත්තු ව්‍යාපෘති වැනි ව්‍යාපාරික කටයුතුවලට බලපෑම් ඇති වීමත් ය. වසංගත තත්ත්වය හේතුවෙන් ආයතනයට රුපියල් මිලියන 72 ක ආදායමක් අහිමි විය. කෙසේ වෙතත්, රුපියල් මිලියන 28 කට අත් සේදුම් කාරක නිෂ්පාදනය කර සැපයීමෙන් නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ආයතනයට හැකි වූ අතර එමගින් ආදායම් පරතරය රුපියල් මිලියන 45 කින් අඩු කර ගැනීමට සහාය විය.







වියදම්- පුනරාවර්තන

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් මුළු රටම මාස තුනක කාලයක් වසා දමා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ආයතනයේ මෙහෙයුම් වියදම් පෙර වසරේ මෙහෙයුම් පිරිවැය වූ රුපියල් මිලියන 588 ට සාපේක්ෂව රුපියල් මිලියන 32 කින් අඩු විය. දේශීය ප්‍රවාහන සීමා කිරීම් සහ විදේශ ගමන් සීමා කිරීම් රුපියල් මිලියන 10 කින් පිරිවැය අඩු කිරීමට ධනාත්මක ලෙස දායක විය. රට මාස 3 කින් අගුලු දැමීම හේතුවෙන් අනෙකුත් මෙහෙයුම් වියදම් රුපියල් මිලියන 20 කින් අඩු විය. ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය සහිත මුළු වියදම් පෙර වසරේ රුපියල් මිලියන 813 ට සාපේක්ෂව රුපියල් මිලියන 766 ක් ලෙස සටහන් විය.

ආයතනය වසර සඳහා නියම කරන ලද සමස්ත ආදායම් ඉලක්කයක් සපුරා ගැනීම හේතුවෙන් කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා අඛණ්ඩව 18 වැනි වසර සඳහාත් කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලදී.



Recurrent Expenses Trend 2016 to 2020
RS IN MILLIONS
Others
Contractual Services
Maintenance
Supplies
Travelling
Personnel Emmolouments
40.58
53.09
48.01
62.09
42.18
44.56
59.99
60.08
59.63
51.49
25.56
33.82
45.23
41.25
42.97
28.85
34.43
31.84
37.67
34.76
8.55
16.72
13.60
14.63
2.02
300.44
348.73
352.90
373.43
382.98
0%
10%
20%
30%
40%
50%
60%
70%
80%
90%
100%
2016 Rs(mn)
2017 Rs(mn)
2018 Rs(mn)
2019 Rs(mn)
2020 Rs(mn)


Recurrent Expenses-2020
Others, 8%
Contractual Services, 9%
Maintenance, 8%
Supplies, 6%
Travelling, 0%
Personnel Emmolouments, 69%
Personnel Emmolouments
Travelling
Supplies
Maintenance
Contractual Services
Others

ප්‍රතිසාධන අනුපාතය

කාර්මික තාක්ෂණය ආයතනයේ වියදම් ප්‍රතිසාධන අනුපාතය මත ආදායම 51.5%ක් ලෙස සටහන් වී ඇති අතර එය පෙර වසරේ පැවති 46.6%ට වඩා සුළු වශයෙන් අඩු වීමකි. එයට හේතුව වූයේ ශුද්ධ ආදායම රුපියල් මිලියන 44.97 කින් අඩු වී ඇති අතර මෙහෙයුම් පිරිවැය රුපියල් මිලියන 32.3 කින් අඩු වීමයි. වියදමට වඩා ආදායමට ශුද්ධ අහිතකර බලපෑම රුපියල් මිලියන 12.6 ක් වූ අතර එහි බලපෑම 5% කින් අහිතකර විය.

.



ලැබූ ප්‍රදාන

ආයතනයට 2020 දී රුපියල් මිලියන 270 ක් (2019 දී රුපියල් මිලියන 250 ක්) පුද්ගලික දීමනා වියදම් සඳහා සහනාධාර ලෙස පුනරාවර්තන ප්‍රදාන ලැබුණි.

රජය විසින් 2020 දී ආයතනයට ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රුපියල් මිලියන 212ක් වෙන් කරන ලදී. කෙසේ වෙතත්, ආයතනය රජය විසින් නිකුත් කළ ප්‍රදානයට සමාන වන රු.මි 105ක් දක්වා සියලුම ප්‍රාග්ධන වත්කම් ප්‍රසම්පාදනය කළමනාකරණය කරයි. ආයතනය විසින් ලැබුණු අරමුදල්වලින් 59% කට වඩා වැඩි ප්‍රමාණයක් අනාගතයේ දී ආදායම් වැඩි දියුණු කිරීමට දායක වන ඉහළ මට්ටමේ උපකරණ ලබා ගැනීම සඳහා භාවිතා කරන ලදී.

8 වන පරිච්ඡේදය - පර්යේෂණ ප්‍රතිඵල

8.1 යොමුගත ජර්නලවල පළ කිරීම්

1. Abeysekera, W.K.S.M., Abeysekera, W.P.K.M., Suraweera, T.L, Samaranayake, M.D.W., Liyanage, S.L., Arachchige, S.P.G., Ratnasooriya, W.D., Abeysiriwardena, D. S. de Z. (2020). Antioxidant properties of selected pigmented and white long grain rice varieties of Sri Lanka at market available polishing rates. *Tropical Plant Research* 7(2): 415-423. DOI: 10.22271/tpr.2020.v7.i2.049.
2. Alvitigala, B.Y., Gooneratne, L.V., Constantine, G.R., Wijesinghe, R.N.K., Arawwawala, L.D.A.M. (2020). Pharmacokinetic, pharmacodynamic, and pharmacogenetic assays to monitor clopidogrel therapy. *Pharmacology Research and Prospectives* 8(6): e00686 DOI:10.1002/prp2.686.
3. Amarasiri, S.S., Attanayake, A.P., Arawwawala, L.D.A.M., Jayatilaka, K.A.P.W., Mudduwa, L.K.B. (2020). Protective effects of three selected standardized medicinal plant extracts used in Sri Lankan traditional medicine in adriamycin-induced nephrotoxic. *Journal of Ethnopharmacology* 259, 112933.
4. Amarasiri, S.S., Attanayake, A.P., Arawwawala, L.D.A.M., Jayatilaka, K.A.P.W., Mudduwa, L.K.B. (2020). Acute and 28-day repeated dose oral toxicity assessment of *Abelmoschus moschatus* Medik. In healthy Wistar rats. *Evidence-Based Complementary and Alternative Medicine*. ID. 1359050.
5. Amarasiri, S.S., Attanayake, A.P., Arawwawala, L.D.A.M., Jayatilaka, K.A.P.W., Mudduwa, L.K.B., (2020). The standardized aqueous bark extract of *Gmelina arborea*roxb. possesses nephroprotection against adriamycin-induced nephrotoxicity in Wistar rats. *Drugs and Toxicology*, DOI: 10.1080/01480545.2020.1811721.
6. Chandrakantha, M., Handunnetti, S. M., Premakumara, G.A.S., Kathirgamanathar, S. (2020). Topical anti-inflammatory activity of essential oils of *Alpiniacalcarata*Rosc., its main constituents and possible mechanism of action, *Evidence-Based Complementary and Alternative Medicine: 1-19*, Article ID 2035671.
7. Comestor, K.G.R.F., Rupasinghe, A.D.J., Deshapriya, A.L., Hewajulige, I., Divisekera, W., Madage, S.S.K., Walliwala, S. Binduhewa, U. (2020). Impact of three-hour power discontinuation of refrigerators on microbiological stability of food. *CEBR & D Journal*: 23-26.
8. Dahanayake, J.M., Perera, P.K., Galappatty, P., Arawwawala, M. (2020). A mini-review on therapeutic potentials of *Phyllanthus niruri* Linn. *Trends in Phytochemical Research* 4(3): 101-108.
9. De Silva, G.B.V.U., Dharmadasa, R.M., Senanayake, R.A.S.P., Lintha, A., Sewwandi,S.K.U. (2020). Comparison of essential oil content and composition of different

parts of *Cymbopogan citrates* (DC.) Stapf (Poaceae) grown in Sri Lanka." *World Journal of Agricultural Research* (8)1: 1-5. DOI: 10.12691/wjar-8-1-1.

10. Dharmadasa, R.M., Jayasinghe, J.A.T.U., Arawwawala, L.D.A.M., Fonseka, D.L.C.K., (2020). Compositional analysis of volatile compounds of *Paspangiri*- A mixture of leaves of five Rutaceaeplants used as an effective remedy for respiratory system microbial infections in Traditional Systems of Medicine. *World Journal of Agricultural Research* 8(3): 84-88. doi: 10.12691/wjar-8-3-3http://www.sciepub.com/wjar/abstract/12007.
11. Dirukshi, M.K.D.T., Dharmadasa, R.M., Abeysinghe, D.C. (2020). Selection of superior quality *Annona*species by means of bioactive compounds and antioxidant capacity. *World Journal of Agricultural Research8* (2): 39-44. DOI: 10.12691/wjar-8-2-3.
12. Fonseka, H.R.D., Arawwawala, L.D.A.M., Kulathunga, W.M.S.S.K. (2020). Comparison ofphytochemical physicochemical parameters of *Ocimum sanctum* Linn grown in different locations of Sri Lanka. *Scholars International Journal of Traditional and Complementary Medicine*3(7), 157 -161.
13. Gobalarajah, K., Prabagar, S., Jayawardena, U.P., Rasiah, G., Rajendra, S., Prabagar, C. (2020). Impact of water quality on Chronic KidneyDisease of unknown aetiology (CKDu) inThunukkai Division in Mullaitivu District, SriLanka.*BMC nephrology*November. DOI: 10.1186/s12882-020-02157-1.
14. Gunathilaka, N., Perera, H., Wijerathna, T., Rodrigo, W., Wijegunawardana, N. D. A. D. (2020). The diversity of midgut bacteria among wild-caught *Phlebotomus argentipes* (Psychodidae: Phlebotominae), the vector of Leishmaniasis in Sri Lanka. *BioMed Research International* Article ID 5458063.
15. Gunathilaka, N., Ranasinghe, K., Amarasinghe, D., Rodrigo, W., Mallawarachchi, H. Chandrasena, N. (2020). Molecular characterization of culturable aerobic bacteria in the midgut of field-caught *Culex tritaeniorhynchus*, *Culex gelidus*, and *Mansonia annulifera* mosquitoes in the Gampaha district of Sri Lanka. *BioMed Research International* Article ID 8732473. https://doi.org/10.1155/2020/8732473.
16. Gunathilaka, T. L., Samarakoon, K., Ranasinghe, P., Peiris, L. D. C. (2020). Antidiabetic potential of marine brown algae-a Mini Review. *Journal of Diabetes Research* https://doi.org/10.1155/2020/1230218.
17. Handunnetti, M.C.S.M, Premakumara, G.A.S. Kathirgamanathar, S. (2020). Topical anti-inflammatory activity of essential oils of *Alpinia calcarata* Rosc., its main constituents and possible mechanism of action, *Evidence-Based Complementary and Alternative Medicine*, Article ID 2035671, 1–19.
18. Hawageegana, H.G.S.P., Arawwawala, L.D.A.M. (2020). A mini review on *Mallotus phillipinensis* (Lam) Muell. Arg. (Kampillaka). *Sri Lanka Journal of Indigenous Medicine* 5(1) : 364-368.

19. Hawageegana, H.G.S.P., Hewageegana, A.U., Arawwawala, L.D.A.M. (2020). Chemical analysis on two traditional decoctions for Diabetes Mellitus. *Journal of Natural and Ayurvedic Medicine* 4(2). DOI:10.23880/JONAM-16000249.
20. Herath, H. M. T., Samaranayake, M. D. W., Liyanage, S. and Abeysekera, W. K. S. M. (2020). Horse Gram: an incredible food grain as a potential source of functional and nutritional food ingredients. *International Journal of Food Science and Nutrition* (5)4: 93-101.
21. Jayasinghe, J.A.T.U., Dharmadasa, R. M., Fonseka, D.L.C.K., Arawwawala, L.D.A.M. (2020). Phytochemicals and antioxidant capacity of selected Rutaceae species used in Sri Lanka. *Research Journal of Chemical Sciences* 10(3): 1-10.
22. Jayawardana, S. A. S., Samarasekera, J. K. R. R., Hettiarachchi, G. H. C. M., Gooneratne, M. J., Choudhary, M. I., Imad, R., Naz, A. (2020). Glutathione S-transferase and β-glucuronidase enzyme inhibitory and cytotoxic activities of ethanolic and methanolic extracts of Sri Lankan finger millet (*Eleusine coracana* (L.) Gaertn.) varieties. *South Asian Research Journal of Natural Products*, 3(2):1-9.
23. Jayawardana, S.A.S., Samarawickrama, D. S., Samarasekera, J. K. R. R., Hettiarachchi, G. H. C. M., Gooneratne, M. J. (2020). Consumer awareness and preference towards finger millet in Sri Lanka. *Asian Food Research Journal* 18(3):24-3.
24. Karunagoda, K., Perera, P.K., Senanayake, H., Arawwawala, L.D.A.M. (2020). Comparative phytochemical analysis and antioxidant activities of two herbal powdered drugs used in the treatment of uterine fibroids. *Asian Journal of Pharmacognosy*. 4(3): 30-36.
25. Karunarathna, S., Somasiri, S., Mahanama, R. (2020). Development of minerals profile including heavy metals of selected rice varieties (Oryza sativa L.) consumed in Sri Lanka. *International Journal of Scientific and Research Publications (IJSRP)* 10(9):759-766.
26. Karunarathne, Y.A.U.D., Amarasinghe, A.P.G., Weerasooriya, T.R., Samarasinghe, U.K.A., Arawwawala, L.D.A.M. (2020). *Asparagus racemosus* (Willd) of Indian origin: In terms of physicochemical, phytochemical and nutritional profiles. *International Journal of Traditional and Complementary Medicine* 3(7): 140-143.
27. Kodikara, K. A. S., Ranasinghe, P., Irfan, A., LokuPullukuttige, J., Madarasinghe, S. K., Farid, D. G., Nico, K. (2020). Oxidative stress, leaf photosynthetic capacity and dry matter content in young mangrove plant Rhizophora mucronate Lam. under prolonged submergence and soil water stress. *Physiology and Molecular Biology of Plants*. http:// doi.org/10.1007/s12298-020.
28. Kodikara, K.A.S., Lokupulukkutuge, J., Ranasinghe, P., Kanishka, M., Dahdouh-Guebas, F., Koedam, N. (2020). "Stress-induced carbon starvation in Rhizophora mucronata Lam. seedlings under conditions of prolonged submergence and water deficiency: Survive or succumb. *Botanica Serbica* 44(2):149–162 https://doi.org/10.2298/BOTSERB2001011S.

29. Lakshan, S.A.T., Pathirana, C.K., Jayanath, N.Y., Abeysekara, W.P.K.M., Abeysekara, W.K.S.M. (2020). Antioxidant and selected chemical properties of the flowers of three different varieties of Butterfly Pea (*Clitoriaternatea* L.), *Ceylon Journal of Science* 49(2): 195-201.
30. Lin, Z., and Shelton, S, (2020). Decadal changes of drought characteristics in Mahaweli River Basin Sri Lanka and associated circulations. *Frontiers in Earth Science* 8, 306.IF-2.689.
ක්ෂය - 2002 දක්වා ජංගම නොවන වත්කම් සඳහා				
2003 සිට ජංගම නොවන වත්කම් සඳහා	127,845,193		115,945,950	
පරිත්‍යාගික ජංගම නොවන වත්කම්	49,167,472	177,012,665	52,793,464	168,739,413
පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති සහ මානව සම්පත් සංවර්ධන				
මහා භාණ්ඩාගාර ප්‍රදානිත	740,519		23,526,215	
පර්යේෂණ හා සංවර්ධන	306,530		354,042	
මානව සම්පත් සංවර්ධන පුහුණු කිරීම්			1,072,047	
දායක මුදල්	1,492,450		3,719,738	
පුස්තකාල විද්‍යා සඟරාව			9,164,563	
තත්ත්ව පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ශිල්ප සේනා	1,594,419		7,192,921	
පර්යේෂණ හා සංවර්ධන වැය		4,133,918	-	45,029,526
පුනරුත්ථාපන සහ ප්‍රතිෂ්ඨාපන - ගොඩනැගිලි සහ ආකෘති	18,497,543		9,317,611	
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	1,020,792		1,083,597	
රථවාහන වැඩිදියුණු කිරීම			199,500	
වෙනත් ස්ථාවර වත්කම් වැඩිදියුණුව සඳහා		19,518,335	187,535	10,788,244
		200,664,918		**224,557,183**

අසම්භාව්‍ය අය (සටහන 5 ආ)				
රාජ්‍ය දායකත්වය - ප්‍රාග්ධන - 2003 සිට	රු.	රු.	රු.	රු.
(ගි.අං.- 300102 සහ ගි.අං. - 300104)				
2020.01.01 දිනට ශේෂය	941,578,871		992,342,590	
වසර තුළ වකතු කිරීම් -				
මාළඹේ නවීන පර්යේෂණ සහ සංවර්ධන සංකීර්නය සඳහා ප්‍රාග්ධන ප්‍රදානය				
කාර්මික තාක්ෂණ ආයතනය සඳහා ප්‍රාග්ධන ප්‍රධාන		941,578,871	121,000,000	1,113,342,590
උපලේඛණ ගැලපුම්				
ක්‍රමක්ෂය (ජංගම නොවන වත්කම් ක්ෂය)	(127,845,193)		(115,945,950)	
ක්‍රමක්ෂය (පර්යේෂණ හා සංවර්ධන - (ප්‍රතීතන)	(306,530)		(354,042)	
ක්‍රමක්ෂය (භාණ්ඩාගාර ප්‍රදානිත ව්‍යාපෘති වැය)	(740,519)		(23,526,215)	
ක්‍රමක්ෂය (පුනරුත්ථාපන වැය)	(19,518,335)		(10,788,244)	
ක්‍රමක්ෂය (මානව සම්පත් සංවර්ධන)			(1,072,047)	
ක්‍රමක්ෂය (පුස්තකාල විද්‍යා සඟරාව සඳහා වාර්ෂික දායක මුදල)			(9,164,563)	
ක්‍රමක්ෂය (දායක මුදල්)	(1,492,450)		(3,719,738)	
ක්‍රමක්ෂය (තත්ත්ව පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ශිල්ප සේනා)	(1,594,419)		(7,192,921)	
ක්‍රමක්ෂය (පර්යේෂණ හා සංවර්ධන)		(151,497,446)	-	171,763,719
2020.12.31 වන දිනට ශේෂය		**790,081,425**		**941,578,871**

සමුච්චිත අරමුදල (සටහන - 6 අ)	2019		2018	
රාජ්‍ය දායකත්වය ප්‍රාග්ධන - 2002 දක්වා සහ	රු.	රු.	රු.	රු.
ආදායම් සහ වියදම් ගිණුමෙහි ශේෂය				
(ගි.අං.- 300101-30000 සහ ගි.අං. - 300300-30400)				
රාජ්‍ය දායකත්වය - ප්‍රාග්ධන - 2002 - 2020.01.01 දක්වා	619,826,595		619,826,595	
ආදායම් සහ වියදම් ගිණුම - 2020.01.01	76,567,767	696,394,362	80,889,950	700,716,546
කාර්මික තාක්ෂණ ආයතනය සඳහා වසර තුල ප්‍රාග්ධන දායකත්වය	105,000,000	105,000,000	121,000,000	
උපලේඛණ ගැලපුම්			(121,000,000)	
පාරිතෝෂික අරමුදල ප්‍රතිසටහන		18,801,735		(263,263)
ක්‍රමක්ෂය - ප්‍රාග්ධන				
2020 කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය	(11,065,299)		(4,058,920)	
		(11,065,299)		**4,058,920**
2020.12.31 වන දිනට ශේෂය		**809,130,799**		**696,394,362**

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වි. හා කා.ප.ආ)

2020.12.31 දිනට පරිත්‍යාග සහ ප්‍රදානයන්

ඇටහන් 6ආ

පරිත්‍යාග	ගිණුම් අංකය	ශේෂය 01.01.2020 රු.	වසර තුළ එකතු කළ අගය	වසර තුළ නිමිසමය	ශේෂය 31.12.2020 රු.
වෙනත් පරිත්‍යාග	300204	53,072		26,536	26,536
ප්‍රාග්ධන සංචිත	300205	1,523,209		-	1,523,209
ආසියානු සංවර්ධන බැංකු පරිත්‍යාග	300207	3,366,507		1,122,175	2,244,332
ජයිකා ආයතනිය ත්‍යාගය - එප්පි 42	300213	22,122		7,374	14,748
එම්.එච්.අයි.එම් ත්‍යාගය - එප්පි 36	300214	1,775		592	1,183
කාප් ත්‍යාගය - එප්පි 48	300215	1,350		450	900
ටී.වී.ර්.සී ත්‍යාගය	300219	8,742		2,914	5,828
ජපන් 2කේආර් ව්‍යාපෘතිය	300222	16,247		1,731	14,516
ජාතික විද්‍යා පදනම - එස් ර් එම් සඳහා උපාංග	300228	111,000		111,000	-
වෙළඳ ද්‍රව්‍ය පිළිබඳ පොදු අරමුදල	300231	132,513		43,138	89,375
භාණ්ඩාගාර ප්‍රදානය - කැබි රථය (තා. හා ප. අමාත්‍යාංශය)	300232	970,110		970,110	-
ජෙව තාක්ෂණ අංශය සඳහා පරිත්‍යාගය	300234	587,814		195,938	391,876
ලයන් බ්‍රෘවරි සමාගම - ත්‍යාග	300237	5,599,187		1,120,451	4,478,736
එන් ආර් සී වෝටර්ස් එච්පීඑල්සී	300238	1,962,877		350,000	1,612,877
ජාතික විද්‍යා පදනම - පරිත්‍යාග	300239	316,748		52,791	263,957
ආයුර්වේද දෙපාර්තමේන්තුව	300240	25,500		4,250	21,250
ජපන් 2කේආර් ප්‍රතිරූප අරමුදල	300241	706,565,778		41,562,693	665,003,085
ජාතික විද්‍යා පදනම - එප්පී 99	300242	302,428		37,804	264,625
ග්ලෝරියා මුණ්ඩ් බලශක්ති ආයතනය පීඑෆ් 112	300243	117,560		14,695	102,865
සමුද්‍ර විද්‍යා තාක්ෂණය පිළිබඳ කොරියානු ආයතනය එප්පී 117	300244	50,378		6,297	44,081
ජාතික විද්‍යා පදනම - එප්පී 113	300245	304,077		40,780	263,297
එන් ආර් සී - එප්පී 106	300246		1,197,413	-	1,197,413
එන් ආර් සී - එප්පී 111	300248		1,615,775	-	1,615,775
සීඅයිඩීඒ - අයිඩීආර්සී ව්‍යාපෘතිය	300403	18,805,352		3,495,754	15,309,597
වෙළඳ අමාත්‍යාංශය	300404	-	18,500,000	-	18,500,000
එකතුව		**740,844,344**	**21,313,188**	**49,167,472**	**712,990,060**

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වි. හා කා.ප.ආ)
2020.12.31 වන දිනට ප්‍රත්‍යාගණන ශේෂය

සටහන - 6 ඇ

	2019	2018
2008 ප්‍රත්‍යාගණනය	රු.	රු.
යන්ත්‍ර සුත්‍ර සහ රසායනාගාර උපකරණ	26,950,099	26,950,099
ලීබඩු වැද්දුම් සහ කාර්යාල උපකරණ	6,404,627	6,404,627
පරීක්ෂණාක උපකරණ	(7,197,654)	(7,197,654)
	26,157,073	**26,157,073**
2009 ප්‍රත්‍යාගණනය		
ගොඩනැගිලි	102,685,357	102,685,357
	128,842,430	**128,842,430**
2016 ප්‍රත්‍යාගණනය		
මෝටර් රථවාහන	24,600,000	24,600,000
	153,442,430	**153,442,430**

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වි. හා කා.ප.ආ)
2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන්වූ කාල පරිච්ඡේදය සඳහා ආදායම් ප්‍රකාශය පිළිබඳ සටහන්

	2020		2019	
ආදායම් (සටහන 7 අ)	**රු.**	**රු.**	**රු.**	**රු.**
ආදායම් ප්‍රමිත සේවා	148,244,004		172,564,965	
අඩුකලා : නැවත ගෙවීම්	323,038	147,920,966	533,168	172,031,797
උපදේශණ සේවා		25,404,178		28,531,332
තාක්ෂණ හුවමාරු		11,485,600		7,515,894
ගිවිසුම්ගත ව්‍යාපෘති	18,613,729		57,013,235	
අඩුකලා : අනු ගිවිසුම් ව්‍යාපෘති	6,000	18,607,729	155,345	56,857,890
වරණාත්මක සේවා		16,397,612		19,719,157
පුහුණු කිරීම්		10,725,524		18,078,448
ලද කතෘභාග		933,650		1,515,532
අත් සේදුම්කාරක ව්‍යාපෘතිය		27,866,970		
		259,342,229		**304,250,050**

වෙනත් ආදායම් (සටහන - 7 ආ)

වෙනත් මෙහෙයුම් ආදායම්

පුස්ථකාල	96,385		140,074	
වෙනත් / පොදු	4,405,594	**4,501,979**	11,069,641	**11,209,715**
වෙනත් මෙහෙයුම් නොවන ආදායම්				
සේවක මණ්ඩල ණය පොළි	874,450		1,351,337	
ආයෝජන පොළි (කාරක ප්‍රාග්ධන, පාරිතෝෂික, ණයවර ලිපි තැන්පත්)	19,386,234		17,089,735	
ව්‍යාපෘති දායකත්වය	-		-	
විනිමය ලාභ/අලාභ	106,474		9,809	
වත්කම් අපහරණය ලාභ/අලාභ		**20,367,158**	763,400	**19,214,282**
		24,869,137		**30,423,996**

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වි. හා කා.ප.ආ)

2020.12.31 වන දිනෙන් අවසන්වූ කාල පරිච්ඡේදය සඳහා ආදායම් ප්‍රකාශය පිළිබඳ සටහන්

	2020	2019
සේවක ප්‍රතිලාභ (සටහන - 8 අ)		
වැටුප් හා වේතන	268,117,509	232,130,192
අනියම් සේවක වැටුප්	2,933,113	9,288,246
කාර්ය්‍ය මත පදනම් සේවක වැටුප්		5,473,684
පර්යේෂණ සහ සංවර්ධන දීමනා	18,458,511	18,310,576
සේවක අර්ථසාධක අරමුදල	35,531,682	31,930,327
සේවක භාරකාර අරමුදල	7,119,175	6,384,501
පාරිතෝෂික දීමනා	22,350,655	20,624,734
අතිකාල දීමනා	6,733,040	11,840,672
ගරු සේවා දීමනා - පාලක මණ්ඩල සාමාජික	617,740	480,300
වෛද්‍ය ගාස්තු ප්‍රතිපූර්ණය	485,823	2,965,171
දිරි දීමනා (කාර්ය්‍ය සාධනයමත පදනම්)	5,176,056	4,725,445
දිරි දීමනා - රා. මු. චක්‍රලේඛ අංක 380	11,430,364	26,648,870
සමූහ සේවක මණ්ඩල වෛද්‍ය රක්ෂණය	4,030,823	2,628,232
	382,984,490	**373,430,949**
ගමන් වියදම් (සටහන - 8 ආ)		
ගමන් වියදම් - දේශිය	959,094	1,638,522
ගමන් වියදම් - විදේශිය	2,568	9,640,927
ගමන් වියදම් - සමූහ ප්‍රවාහන	1,063,203	3,356,539
	2,024,865	**14,635,988**

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වි. හා කා.ප.ආ)
2020.12.31 වන දිනෙන් අවසන්වූ කාල පරිච්ඡේදය සඳහා ආදායම් ප්‍රකාශය පිළිබඳ සටහන්

	2020	2019
සැපයුම් හා පරිභෝජන (සටහන - 8 අ)		රු.
රසායන ද්‍රව්‍ය	12,525,284	10,687,571
රසායනාගාර උපකරණ	8,586,127	8,208,573
විද්‍යුත් මෙවලම්	154,455	273,926
ලිපිද්‍රව්‍ය	4,029,933	6,257,108
අනෙකුත් සැපයුම්	1,091,354	1,572,419
වෙනත් / අර්ධ ස්ථාවර	228,914	2,738,042
උවදුරු මැඩලීමේ මෙවලම්	1,032,708	315,502
නිල ඇඳුම් - මුරකරු, රියදුරු ආදි	914,895	952,849
ක්‍රීඩා ඇතුළු සුභසාධන	83,463	123,217
ඉන්ධන	6,121,663	6,541,497
	34,768,795	**37,670,704**
නඩත්තු (සටහන - 8 ඇ)		
ගොඩනැගිලි සහ පරිශ්‍රය	15,104,067	15,139,592
යන්ත්‍ර සූත්‍ර	15,705,590	7,457,416
ලීබඩු උපකරණ	1,872,266	2,918,675
පුස්තකාල පොත්	241,525	-
රසායනාගාර උපකරණ	20,784	97,142
පරීක්ෂණාක	4,227,638	7,150,008
ආපනශාලාව	18,500	69,530
විදුලිජනක යන්ත්‍රය	364,017	1,374,107
රථවාහන	5,421,836	7,052,445
	42,976,223	**41,258,914**
ගිවිසුම්ගත සේවා (සටහන - 8 ඉ)		
විදුලි ගාස්තු	27,006,137	32,249,501
දුරකථන සහ අන්තර්ජාල ගාස්තු	10,738,428	13,504,864
තැපැල් ගාස්තු	343,676	396,694
වරිපනම් සහ බදු	2,023,560	2,023,560
ආරක්ෂක සේවා ගාස්තු	10,283,223	10,086,189
ජල ගාස්තු	1,104,757	1,374,256
	51,499,781	**59,635,064**

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වී. හා කා.ප.ආ)
2020.12.31 වන දිනෙන් අවසන්වූ කාල පරිච්ඡේදය සඳහා ආදායම් ප්‍රකාශය පිළිබඳ සටහන්

	2020
<u>ව්‍යාපෘති සහ මානව සම්පත් සංවර්ධන (සටහන - 8 ඊ)</u>	**රු.**
මහා භාණ්ඩාගාර ප්‍රදානිත ව්‍යාපෘති වැය	740,519
පර්යේෂණ සහ සංවර්ධන (ප්‍රතීතන)	306,530
මානව සම්පත් සංවර්ධන - පුහුණුකිරීම්	
සාමාජික මුදල්	1,492,450
පුස්තකාල විද්‍යා, සඟරාව - වාර්ෂික - දායක මුදල්	9,165,000
තත්ත්ව පද්ධතිය වැඩිදියුණු කිරීම	1,594,419
	13,298,918
<u>ක්ෂය සහ ක්‍රමක්ෂය වැය (සටහන - 8 උ)</u>	
ගොඩනැගිලි	58,450,201
භූමිය සංවරධනය	6,600,776
යන්ත්‍ර සූත්‍ර	79,291,432
ලීබඩු සහ උපකරණ	3,745,664
පරීක්ෂණාක	9,771,501
රථවාහන	15,930,960
මෘදුකාංග	1,389,181
පුස්තකාල පොත්	1,832,948
	177,012,665
<u>පුනරුත්ථාපන වියදම් (සටහන - 8 එ)</u>	
ගොඩනැගිලි සහ ආකෘති වැඩිදියුණු කිරීම	18,497,543
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ පුනරුත්ථාපනය	1,020,792
මෝටර් රථවාහන වැඩිදියුණු කිරීම	
වෙනත් ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීම	
	19,518,335

කාර්මික තාක්ෂණ ආයතනය (අනුප්‍රාප්තික ලං.වී. හා කා.ප.ආ)
2020.12.31 වන දිනෙන් අවසන්වූ කාල පරිච්ඡේදය සඳහා වත්කම් ප්‍රකාශය පිළිබඳ සටහන්

	2020
<u>වෙනත් මෙහෙයුම් වියදම් (සටහන 8 ඌ)</u>	**රු.**
සේවක මණ්ඩල පුහුණු කිරීම්	89,700
නියැදි ගාස්තු	3,347,275
සංයුක්ත දීමනා	1,766,975
දායක මුදල් - දේශීය / විදේශීය / වෙනත්	160,591
රසායනාගාර සාමාජික ගාස්තු (දේශීය)	-
ගරු සේවා දීමනා	622,812
වෛද්‍ය පරීක්ෂණ ගාස්තු (නව බඳවා ගැනීම්)	114,000
සංග්‍රහ දීමනා	114,714
රක්ෂණ ගාස්තු	1,882,682
මුද්‍රණ ගාස්තු	382,240
පුවත්පත් සහ සාමාජික ගාස්තු	126,796
විගණන ගාස්තු	1,536,000
බාහිර සේවක වැටුප්	618,930
නීතිඥ ගාස්තු	125,000
බැංකු ගාස්තු	84,283
ණයපත් කොමිස්	143,047
දැන්වීම් පළකිරීම්	883,644
සඟරා - වාර්ෂික වාර්තා	121,425
ප්‍රවර්ධන සහ ප්‍රචාරක වියදම්	7,430
ප්‍රතික්ෂේපිත චෙකතු කල අගය මත බද්ද	1,410,745
ජාතිය ගොඩනැගීමේ බදු	-
සම්ක්ෂණ ගාස්තු - සම්ක්ෂණ මණ්ඩල	168,725
පේටන්ට් සහ උපදේශණ ගාස්තු	289,570
වියදම් - ප්‍රමිතසේවා	549,971
වියදම් - උපදේශක සේවා	756,745
වියදම් - තාක්ෂණ හුවමාරුව	545,155
වියදම් - ගිවිසුම්ගත සේවා	1,356,603
වියදම් - වරණාත්මක සේවා	299,032
වියදම් - පුහුණු කිරීමේ කටයුතු	612,106
වියදම් - අත් සේදුස්කාරක	16,025,214
පර්යේෂණ සහ සංවර්ධන සහ තාක්ෂණ සේවා වැය	65,374
ජාතික වෘත්තීය සුදුසුකම මට්ටම 04 සහතිකපත් පාඨමාලාව	134,993
නිශ්කාෂණ ගාස්තු	22,332
කාර්මික තාක්ෂණ ආයතන වාර්ෂික පර්යේෂණ වැඩමුළුව- පර්යේෂණ සහ සංවර්ධන	-
ප්‍රදර්ශන වැය (කාර්මික තාක්ෂණ ආයතනය)	532,628
ප්‍රදර්ශන/විද්‍යාත්මක/අමාත්‍යාංශ කාර්යන්	295,171
ශිල්පසේනා ප්‍රදර්ශනය	344,646
කොමිසැට් රැසවීම් සඳහා වැය	-
මුද්දර බදු	58,800
අර්ථසාධක අරමුදල සඳහා ලිපිද්‍රව්‍ය	74,751
විවිධ වියදම්	22,684
සෙන්ටෙක් ප්‍රදර්ශන - ප්‍රතිශත දායකත්වය	-
තත්ත්ව යටිතල පහසුකම්	-
මාළඹේ විතැන්වීමේ වැය	-
	35,692,790

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } අයිඑමවී/සී/අයිටිඅයි/එෆ්ඒ/2020/14

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 මාර්තු 08 දින

සභාපති
කාර්මික තාක්ෂණ ආයතනය

කාර්මික තාක්ෂණ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනයකළ මතය

කාර්මික තාක්ෂණ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනයකළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි (35) වගන්තිය අනුව ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමය (FIFO) හෝ භරිත සාමාන්‍ය ක්‍රමය(WAC) යන ක්‍රම දෙකෙන් එක් ක්‍රමයක් තෝරාගෙන භාණ්ඩ තොගයේ පිරිවැය අගය කළ යුතු වුවත් එසේ කටයුතු නොකොට සරල සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිතා කර ආයතනය විසින් 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ තොගය රු.22,966,848 කට අගය කර ගිණුම්ගත කර තිබුණි. එසේ වුවත් සරළ සාමාන්‍ය ක්‍රමය අනුගමනය කිරීමට හේතු වූ කරුණු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 අනුව වත්කම්වල ඵලදායී ජීව කාලය නිවැරදි ලෙස හඳුනාගෙන ගිණුම්කරණ ඇස්තමේන්තුවල නිවැරදි කිරීම් සිදු කිරීම කළ යුතු වුවත් සම්පූර්ණයෙන් ක්ෂය කළ නමුත් දැනටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.804,936,305 ක් වූ ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව 2002 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දක්වා කාලයට අයත් උපයෝජනය නොවී පැවති භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන රු.619,826,595 ක් සමුච්චිත අරමුදලට එකතුකර දක්වා තිබූ අතර මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 ප්‍රකාරව කළයුතු හෙළිදරවු කිරීම් ආයතනය විසින් සිදු කර නොතිබුණි.

(ඈ) පෙට්‍රෝලියම් තෙල් රසායනාගාරය හා ඖෂධ රසායනාගාරය ස්ථාපනය කිරීම සඳහා 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුල කාර්මික තාක්ෂණ ආයතනයට මහා භාණ්ඩාගාරයෙන් රු.මි 219 ක ප්‍රාග්ධන ප්‍රදානය මඟින් ලැබී තිබුණු අරමුදල් සහ ඒ මඟින් දරණ ලද වියදම් නියමිත ගිණුම් පරිපාටියෙන් බැහැරව පිළිවෙලින් ව්‍යාපෘති ගිණුම් දෙකක හර හා බැර වශයෙන් සටහන් කිරීම හේතුවෙන් ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදානය සහ එම ප්‍රදාන උපයෝජනය කර මිලට ගෙන තිබුණු රු.මි 211.2 ක් වූ රසායනාගාර උපකරණවල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් නිරූපණය නොවුනි. එසේම දැනටමත් භාවිතා කරනු ලබන ඉහත උපකරණ සඳහා වන ක්ෂය වියදමද මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නොතිබුණි.

(ඉ) කාර්මික තාක්ෂණ ආයතනයේ සේවක පාරිතෝෂික (පශ්චාත් සේවා ප්‍රතිලාභ) සඳහා බහුසේවක සැලසුමක් අනුගමනය කලද එය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි 141 වන වගන්තියේ නියමයන්ට අනුව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඊ) මාලඹේ පර්යේෂණ හා සංවර්ධන ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ පිරිවැය රු 40,000,000.ක් ගොඩනැගිලි යටතේ 2017අවසන් ගිණුම් ප්‍රකාශ තුළ දක්වා තිබීමේ වරද නිවැරදි කර තිබුණද එම ඉඩමේ පිරිවැය මත සියයට 5ක ප්‍රතිශතයකින් ක්ෂය කිරීම නිසා වාර්ෂික ක්ෂය වියදම රු.2,000,000 ක වැඩියෙන් දක්වා තිබීම සමාලෝචිත වර්ෂය තුළදී ද නිවැරදි කර නොතිබුණි.

(උ) 2020 දෙසැම්බර් 31 දින දක්වා පැවති හඳුනා නොගත් සෘජු බැංකු බැර කිරීම් රු.12,756,253 ක් සමාලෝචිත වර්ෂයේදීද ආයතනය විසින් හඳුනා ගැනීමට කටයුතු නොකර ගෙවිය යුතු වියදම් ලෙස ජංගම වගකීම් යටතේ මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) කාරක ප්‍රාග්ධන විචලනයන් නිවැරදි නොවන ආකාරයට දක්වා තිබීම නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 81,203,438 කින් අඩුවෙන් දක්වා තිබුණි. තවද කෙරීගෙන යන වැඩ වටිනාකම ආයෝජන ක්‍රියාකාරිත්වයෙන් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය රු.91,690,122 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3 ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින්ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන

සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයනලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන ඡේදයේ සඳහන් වන මෙම කරුණු හැර විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ඊ) සහ (උ) ඡේදවල සඳහන් නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති, රීති, රෙගුලාසි හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධිවිධානවලට යොමුව	**විස්තරය**
(අ)	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 15 වන වගන්තිය	රජයේ මූල්‍ය ප්‍රකාශ රජයේ එක් එක් මුදල් වර්ෂය අවසන් වී මාස 03ක් ඉකුත් වීමට පෙර ලේකම්වරයා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශ විගණනය වෙත ඉදිරිපත් කරනු ලැබුවේ 2021 ඔක්තෝබර් 22 දිනදීය. එනම් මූල්‍ය වර්ෂයට අදාළ ගිණුම් ඉදිරිපත් කළ යුතු දිනට මාස 07කට පසුවය.
(ආ)	අංක 03/2015 සහ 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5)	නිකුත් කරන ලද අතුරු අග්‍රිමයක වියදම් නොවී ඉතිරිවන මුදල් ශේෂය අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31දින ඉක්මවා ප්‍රමාද නොකළ යුතු වුවද 2020 ,වර්ෂයේදී නිකුත් කළ රු.1,188,770 ක අත්තිකාරම් මුදල් එසේ පියවා නොතිබූ අතර තත්කාර්ය අතුරු අග්‍රිමයක් නිකුත්

කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10ක් ඇතුළත නැවත පියවිය යුතු වුවත් ,සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් මුදල් පියවීම මාස 01සිට මාස 07 දක්වා කාල පරාසයක් තුළ ප්‍රමාද වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි සංග්‍රහයේ 396 (ඇ) වගන්තිය

2020 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ නිකුත් කළ මාස 06 ඉක්මවා තිබූ ගෙවීමට ඉදිරිපත් නොවූ වටිනාකම රු. 1,599,117 ක් වූ චෙක්පත් 51 ක් මාස දෙක ඉක්මවූ චෙක්පත් ණයහිමි ගිණුම නම් වූ ගිණුමකට (02 Months Cheque validity Expired creditors) බැරකර තිබූ නමුත් කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් උක්ත මුදල් රෙගුලාසිය අනුව කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 **වෙනත් කරුණු**

(අ) වසර 1 ත් 7 ත් කාලයක් පැරණි එකතුව රු. 14,535,683 ක් වූ ලැබිය යුතු ශේෂ තුළ පවත්නා විවිධ ණයගැති ශේෂ සමාලෝචිත වර්ෂයේදීද අයකර ගෙන නොතිබුණි.

(ආ) විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම්වල කොන්දේසි කඩකළ නිලධාරීන් 20 දෙනෙකුගෙන් අයවිය යුතු රු.16,799,429 ක් වූ මුදල 2020 දෙසැම්බර් 31දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) කාර්මික තාක්ෂණ ආයතනයෙහි මාලබේ පරිශ්‍රයෙහි අභ්‍යන්තර පාරවල් සැකසීම, වැට ඉදිකිරීම, වාහන රථගාල හා උද්‍යාන අලංකාරය ආදී බාහිර සංවර්ධන කටයුතු සඳහා රු.මිලියන 217 ක් වූ ඇස්තමේන්තු වටිනාකමට 2017 දෙසැම්බර් 14 දින කොන්ත්‍රාත්කරු සමඟ මාස 05 කින් නිම

කිරීම සඳහා ගිවිසුම්ගතව තිබුණද අදාළ කාර්යයන් ඉටුකිරීම සඳහා 2020 වර්ෂය දක්වාම කාලය ගෙන තිබුණි.

(ඇ) ඛණිජතෙල් හා ලිහිසිතෙල් පරීක්ෂණ රසායනාගාරය ස්ථාපනය කිරීම සඳහා යන්ත්‍රෝපකරණ සපයා ගැනීමේදී තාක්ෂණ ඇගයීම් කමිටුව අනුමත කළ දින සිට උපකරණ ඇණවුම් කිරීම සඳහා මාස 09 සිට අවු 01 දක්වා ප්‍රමාද කිරීම් සිදුකර තිබූ බව නිරීක්ෂණය වූ අතර උපකරණ 12 ක් සපයා ගැනීමේදී ප්‍රසම්පාදන කමිටුව නිර්දේෂ කළ මිලට වඩා රු. 2,562,464 ක් වැඩිපුර වැයකිරීමට සිදුවී තිබුණි.

(ඉ) වටිනාකම රු. 6,443,743 ක් වූ බැංකු ගිණුම් 06ක් අක්‍රිය බැංකු ගිණුම් ලෙස වසර 06 කට අධික කාලයක සිට පවත්වාගෙන ගොස් තිබුණි.

(ඊ) ඖෂධ පරීක්ෂණ රසායනාගාර සේවාවන් ලබාගැනීම සඳහා විදේශ රටවලට විශාල ගාස්තුවක් වැය කිරීමට සිදුවීම වැළැක්වීම මෙම රසායනාගාරය පිහිටුවීමේ අරමුණක් වුවද එම අරමුණ ඉටු නොවීමෙන් තවදුරටත් විදේශ විනිමය වැයවීම වළක්වා ගැනීමට නොහැකිවී තිබුණි.

(උ) රසායනාගාරයෙන් ඉටුකරනු ලබන සේවාවන් පරීක්ෂාවේදී පෞද්ගලික අංශයේ නිෂ්පාදනවල සාම්පල් සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීමෙන් ආදායම් උත්පාදනය කර තිබුණද එකී නිෂ්පාදනයන් සිදුකිරීමේදී සාම්පල පරීක්ෂණ වාර්තාවෙන් තහවුරු කළ ගුණාත්මක භාවය අඛණ්ඩව රැකෙන බවට රසායනාගාරයේ වගකීමක් නොවන බැවින් වෙළඳපොළට සැපයෙන නිෂ්පාදන වලින් පාරිභෝගිකයා ආරක්ෂාවීමක් සිදු නොවේ. මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා සම්බන්ධිත ආයතන සමඟ එක්ව කටයුතු කළ වුවත් එලෙස කටයුතු කිරීමක් සිදු නොවන බවට විගණනයේදී නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

කාර්මික තාක්ෂණ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් තෙතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

අංකය	**විගණකාධිපතිවරයාගේ වාර්තාවේ කරුණු**	**31.12.2020 ආයතනයීය කරුණු දැක්වීම**
01	මූල්‍ය ප්‍රරකාශන	
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි (35) වගන්තිය අනුව ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමය (FIFO) හෝ හරිත සාමාන්‍ය ක්‍රමය (WAC) යන ක්‍රම දෙකෙන් එක් ක්‍රමයක් තෝරාගෙන භාණ්ඩ තොගයේ පිරිවැය අගය කළ යුතු වුවත් එසේ කටයුතු නොකොට සරල සමනය පිරිවැය ක්‍රමය භාවිතා කර ආයතනය විසින් 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ තොගය රු. 22,966,848 කට අගය කර ගිණුම්ගත කර තිබුණි. එසේ වුවත සමනය ක්‍රමය අනුගමනය කිරීමට හේතුවූ කරුණු මූල්‍ය ප්‍රකෂනාවය අනාවරණය කර නොතිබුණි.	පවතින පරිගණක පද්ධතිය තුල හරිත සාමාන්‍ය පිරිවැය අනුව තොග ආගණනය සිදු කිරීමට අවශ්‍ය පහසුකම් නොමැති බැවින් සරල සාමාන්‍ය ක්‍රමය තොග ආගණනය සඳහා යොදා ගනු ලබයි. මෙම පහසුකම ඇති නව පරිගණක පද්ධතිය මේ වනවිට ස්ථාපිත කර ඇත. 2022 වසරේ සිට හරිත සාමාන්‍ය ක්‍රමයට තොග ආගණනය සිදු කළ හැක.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිත අංක 03 අනුව වතකමවල ඵලදායි ජීව කාලය නිවැරදි ලෙස හඳුනාගෙන ගිණුම්කරණ ඇස්තමේන්තුවල නිවැරදි කිරීම සිදු කිරීම කළ යුතු වුවත් සම්පූර්ණයෙන් ක්ෂය කළ නමුත් දැනටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.804,936,305 ක් වූ ස්ථාවර වතකම්වල ඵලදායි ජීවිත කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම තොරතුරු ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය තුළ ඇතුලත් කර ඇත. රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 88 වන වගන්තියට අනුව හඳුනාගත හැකි ආකාරයට තොරතුරු ඉදිරිපත් කළ යුතු අතර එහි දක්වා ඇත්තේ **"පාලන ආයතනයේ හිමිකරුවන්ට ආරෝපණය කළ හැකි ශුද්ධ වත්කම්/කොටස්"** ලෙසය. 2009 වසරේ සිටම ප්‍රතිපාදන පිලිබඳ විස්තර ඉහත කී ආකාරයට ඉදිරිපත් කර ඇත. මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලෙස ලද රු. 105,000,000/- ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙන් විලම්භීත ආදායම් ගිණුමට මාරුකළ යුතු වුවද එය මග හැරීම නිසා මෙලෙස සමුච්චිත අරමුදල ඉහල ගොස් ඇත. හුදෙක් මෙය ගිණුම් සටහනක් මගහැරීම නිසා සිදුවූවකි. 2021 වසරේ ගිණුම් තුලින් මෙම ගැලපීම සිදුකර ඇත.
(ඇ)	මූල්‍ය ප්‍රකාශන අනුව 2002 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දක්වා කාලයට අයත් උපයෝජනය නොවී පැවති භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන රු.619,826,595 ක් සමුච්චිත අරමුදලට එකතු කර දක්වා තිබූ අතර මේ සම්බන්ධයෙන් ශ්‍රී ලක්නක් රාජ්‍ය අංශ ගිමුන්කරන ප්‍රමිත අංක 11 ප්‍රකාරව කළ යුතු හෙළිදරව් කිරීම් ආයතනය විසින් සිදු කර නොතිබුණි.	සම්පූර්ණයෙන් ක්ෂය කළ, එහෙත් දැනට භාවිතා කරන වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද මෙම වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා පවතින ප්‍රායෝගික අපහසුතා මත හා රට තුළ පැවති වාතාවරණය මත මෙය සිදුකිරීම අපහසු වී ඇත. එනමුත් ඒ සඳහා ප්‍රවීන පළපුරුදු සේවාදායකයෙකුගේ සේවය ලබාගැනීමට කටයුතු කරමින් සිටී.
(ඈ)	පෙට්‍රෝලියම් තෙල් රසායනාගාරය හා ඖෂධ රසායනාගාරය ස්ථාපනය කිරීම සඳහා 2017 වර්ෂයේ සිට 20119 වර්ෂය දක්වා කාලය තුල කාර්මික තාක්ෂණ ආයතනයට මහා භාණ්ඩාගාරයෙන් රු.මි. 219 ක ප්‍රාග්ධන ප්‍රදානය මගින් ලැබී තිබූ අරමුදල් සහ ඒ මඟින් දරන ලද වියදම් නියමිත පටිපාටියෙන් බැහැරව පිළිවලින් වව්‍යාපෘති ගිණුම් දෙකක හර හා බැර වශයෙන් සටහන් කිරීම හේතුවෙන් ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදානය සහ එම ප්‍රදාන උපයෝජනය කර මුදලට ගෙන තිබුණු	පෙට්‍රෝලියම් තෙල් රසායනාගාරය හා ඖෂධ පරීක්ෂණ රසායනාගාරය අදාළ ප්‍රතිපාදන ලැබීම් හා දරන ලද වියදම් වෙනම ව්‍යාපෘති ගිණුම් ලෙස පවත්වාගෙන යන අතර ව්‍යාපෘතිය අවසන් කර මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද 2021 වසරේදී අදාළ වත්කම් ගිණුම් වලට මාරුකර ඇත.

කාර්මික තාක්ෂණ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් තෙතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

	රු.මි. 2112.2 ක් වූ රසායනාගාර උපකරණ වටිනාකම මුල්‍ය ප්‍රකාශන වලින් නිරූපණය නොවුනි. එසේම දැනටමත් භාවිතා කරනු ලබන ඉහත උපකරණ සඳහා වන ක්ෂය වියදමද මුල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නොතිබුණි.	
(ඉ)	කාර්මික තාක්ෂණ ආයතනයේ සේවක පාරිතෝෂික (පශ්චාත් සේවා ප්‍රතිලාභ) සඳහා බහුසේවක සැලැස්මක් අනුගමනය කලද එය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි 141 වන වගන්තියේ නියමයන්ට අනුව මුල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.	කාර්මික තාක්ෂණ ආයතනය පාරිතෝෂික සඳහා ගිණුම් කටයුතු පූරව වසර වල සිදු කළ ආකාරයට සමාලෝචිත වසරේද (2020) සිදුකර ඇත. මේ පිළිබඳව ගිණුම්කරණ සටහන් තුළ කරුණු ඉදිරිපත් කර ඇත.
	නීති රීති / විධිවිධානවලට යොමුව	
(අ)	රජයේ මූල්‍ය ප්‍රකාශ රජයේ එක් එක් මුදල් වර්ෂය අවසන් වී මස 03ක් ඉකුත් වීමට පෙර ලේකම්වරයා විසින් විගනකාධිපතිවරයා වෙත ඉදිරිඅප්ත් කළ යුතු වුවත් ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශ විගණනය වෙත ඉදිරිපත් කරනු ලැබුවේ 2021 ඔක්තෝම්බර් 22 දිනදීය. එනම් මූල්‍ය වර්ෂයට අදාළ ගිණුම් ඉදිරිපත් කළ යුතු දිනට මාස 07කට පසුවය.	2020 වසරේ දී COVID-19 (කොරෝනා) වසංගතය හේතුවෙන් ආයතනය LOCKDOWN කිරීම හේතුවෙන් මූල්‍ය අංශයේ කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. මූල්‍ය අංශයේ සේවක පිරිසෙන් කිහිප දෙනෙකුම වෛරසය අසාදනය වීම මත මූල්‍ය අංශය වසා තැබීමට සිදුවීම නිසා ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම පමා විය.
(ආ)	නිකුත් කරන ලද අතුරු අග්‍රිමයක වියදම් නොවී ඉතිරිවන මුදල් ශේෂය අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31දින ඉක්මවා ප්‍රමාද නොකළ යුතු වුවද 2020 වර්ෂයේදී නිකුත් කළ රු. 1,188,770 ක අත්තිකාරම් මුදල් එසේ පියවා නොතිබූ අතර තත්කාර්ය අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්ය අවසන් කර දින 10ක් ඇතුළත නැවත පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් මුලද පියවීම මාස 01 සිට මාස 07 දක්වා කාල පරාසයක් තුළ ප්‍රමාද වී තිබුණි.	මෙම අත්තිකාරම් දෙන ලද්දේ අමාත්‍යාංශ මට්ටමින් සිදුකරනු ලද හදිසි වැඩසටහන් සඳහා වන අතර, අත්තිකාරම් ලබාදෙන ලද්දේ අලවිකරණ හා ව්‍යාපාර සංවර්ධන අංශයේ ඉහළ නිලධාරිනියක් වෙතය. කෙසේ නමුත් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 03/2015, 02 වගන්තියේ (ආ) උපවගන්තිය ප්‍රකාරව උපරිම අත්තිකාරම් සීමාව තුළ අප කටයුතු කරනු ලබයි.
(ඇ)	2020 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ නිකුත් කළ මාස 06 ඉක්මවා තිබූ ගෙවීමට ඉදිරිපත් නොවූ වටිනාකම රු. 1,599,117 ක් වූ චෙක්පත් 51ක් මාස 02 ඉක්මවූ චෙක්පත් ණය හිමි ගිණුම නම් වූ ගිණුමකට (02 Months Cheque validity Expired creditors) බැහැර කර තිබූ නමුත් කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් උක්ත මුදල් රෙගුලාසිය අනුව කටයුතු කර නොතිබුණි.	2020 වසරේ දී COVID-19 (කොරෝනා) වසංගතය හේතුවෙන් ආයතනය LOCKDOWN කිරීම මත මෙලෙස කල් ඉකුත් වන චෙක්පත් පිළිබඳව අවශ්‍ය තහවුරු කිරීම් ලබා ගැනීමේ අපහසුව නිසා මු.රේ 396 සඳහන් ආකාරයට කටයුතු කිරීම අපහසු විය. තවද බොහෝ සැපයුම් කරුවන් තම චෙක්පත් පිළිබඳව දැනුවත් අතර පැවති තත්වය මත චෙක්පත් රැගෙන යාම අපහසු වීම හේතුවෙන් මු.රේ 396 අනුව ක්‍රියාත්මක වීම සිදු නොකරන ලදී. එමෙන්ම 02 Months cheques Validity Expired Creditors ගිණුම පවත්වාගෙන යනු ලබන්නේ පසුව හිමිකම පාන චෙක්පත් දිනය යාවත්කාලීන කර නැවත නිකුත් කිරීමේ පහසුව සඳහාය.

කාර්මික තාක්ෂණ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් තෙතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

අංකය	**විගණකාධිපතිවරයාගේ වාර්තාවේ කරුණු**	**31.12.2020 ආයතනයීය කරුණු දැක්වීම**
	වෙනත් විගණන නිරීක්ෂණ	
(අ)	වසර 1ත් 7ත් කාලයක් පැරණි එකතුව රු. 14,535,683 ක් වූ ලැබිය යුතු ශේෂ තුළ පවත්නා විවිධ ණයගැති ශේෂ සමාලෝචිත වර්ෂයේදීද අයකර ගෙන නොතිබුණි.	විද්‍යා හා තාක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය කුලී පදනම මත කාර්මික තාක්ෂණ ආයතනයේ සිටි කාලයට ආදාලව ලැබිය යුතු කුලිය වන අතර මෙය ලබා දෙන ලෙස කිහිප විටක්ම ඉල්ලිම් කර ඇත. කළමනාකරණ තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ඔක්සිජන් හවුස් , WHT Tax, VAT WHT යන අයිතම වසර 10 පෙර සිට පැවතෙන ශේෂයන් වන අතර මෙම ශේෂ අයකරගැනීම අසීරු වී ඇත. ආපසු ගෙවිය හැකි ගුවන් ටිකට්පත් සඳහා මුදල් ගෙවන ලෙසත් මුදල් නොගෙවන්නේනම් නීතිමය කටයුතු සඳහා යොමුවන බවට අදාල පාර්ශව දැනුවත් කර ඇත.
(ආ)	විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම්වල කොන්දේසි කඩකළ නිලධාරීන් 20 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 16,799,429 ක් වූ මුදල 2020 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.	මෙයින් රු 4,020,392/- මුදල නිලධාරීන් 17 දෙනෙකුට සම්බන්ධ වන අතර ගිවිසුම් කඩකළ නිලධාරීන්ගෙන් අදාල මුදල් අයකර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග සිදුකළ මුත්, එම ක්‍රියාමාරග ව්‍යාර්ථ වුයේ එම නිලධාරීන් දිවයින හැරගොස් සිටින බැවිනි ඔවුන්ගේ බොහෝ ඇප කරුවන්ද දිවයිනෙන් බැහැරව ගොස් සිටින අතර ඇතැමෙක් ජීවතුන් අතර නැත. ගිවිසුම් කඩකල නිලධාරීන්ගේ කාල විශ්ලේෂණයක් පහත දක්වා ඇත. වසර 30 ට වැඩි නිලධාරීන් 04 වසර 20 ට වැඩි නිලධාරීන් 08 වසර 10 ට වැඩි නිලධාරීන් 06 රු 12,541,165/- වටිනා ගිවිසුම් කඩකළ නිලධාරිනියන් දෙදෙනා සඳහා අවශ්‍ය කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව සමග මේ වනවිටත් සිදු කෙරෙමින් පවතියි. මින් එක් නිලධාරී මහතෙකු ගිවිසුම් ප්‍රකාරව මෙම මුදල ගෙවීමට කටයුතු කර ඇත.
(ඇ)	කාර්මික තාක්ෂණ ආයතනයෙහි මාලබේ පරිශ්‍රයෙහි අභ්‍යන්තර පාරවල් සැකසීම, වැට ඉදිකිරීම, වාහන රථගාල හා උද්‍යාන අලංකාරය ආදී බාහිර සංවර්ධන කටයුතු සඳහා රු. මිලියන 217 ක් වූ ඇස්තමේන්තු වටිනාකමට 2017 දෙසැම්බර් 14 දින කොන්ත්‍රාත්කරු සමග මස 05කින් නිම කිරීම සඳහා ගිවිසුම්ගතව තිබුනද අදාල කාර්යන් ඉටුකිරීම සඳහා 2020 වර්ෂය දක්වාම කාලය ගෙන තිබුණි.	බාහිර කාර්යයන් සහ භූමි සංවර්ධන කාර්යයන්හි අතිරේක වැඩ හේතුවෙන් විෂය පථය වෙනස් සහ පිළිගත හැකි හේතු මත අවස්ථා 04 දී ව්‍යාපෘතිය සඳහා කාල දිගු ලබා දෙන ලදී. අයහපත් කාලගුණ තත්වයන්, මැතිවරණ කටයුතු, සීමා නිර්ණය කිරීමේදී බාහිර පාර්ශවයන්ගෙන් සිදුවූ කාල ප්‍රමාදයන් ආදී හේතු මත කාල දිගු උපදේශන සමාගමෙහි නිර්දේශ මත ලබාදෙන ලදී. මේ හේතුවෙන් මෙම ව්‍යාපෘති අපේක්ෂිත දිනට නිම කිරීම අපහසු විය.

කාර්මික තාක්ෂණ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් තෙතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

අංකය	විගණකාධිපතිවරයාගේ වාර්තාවේ කරුණු	31.12.2020 ආයතනයීය කරුණු දැක්වීම
(ඇ)	ඛනිජ තෙල් හා ලිහිසිතෙල් පරීක්ෂණ රසායනාගාරය ස්ථාපනය කිරීම සඳහා යන්ත්‍රෝපකරණ සපයා ගැනීමේදී තාක්ෂණ ඇගයීමේ කමිටුව අනුමත කළ දින සිට උපකරණ ඇනවුම් කිරීම සඳහා මස 09 සිට අවු 01 දක්වා ප්‍රමාද කිරීම් සිදුකර තිබූ බව නිරීක්ෂණය වූ අතර උපකරණ 12ක් සපයා ගැනීමේදී ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කළ මිලට වඩා රු, 2,562,464ක් වැඩිපුර වැය කිරීමට සිදුවී තිබුණි.	තොරාගන්නා ලද සැපයුම්කරුවන්ගේ උපකරණ (12) ක නිර්දේශිත මිල ගණන් වල (US $) කිසිදු වෙනසක් සිදු නොවූ අතර එය ඉහත කාල ප්‍රමාදයන් හේතු කොටගෙන රුපියල හා ඩොලරය අතර විනිමය අනුපාත අවප්‍රමාණය වීමෙන් වූ මිළ වැඩිවීම හේතු කොටගෙන රුපියල් මිලියන 2,562,464/- ක් වැඩිපුර ගෙවීමට සිදුවී ඇත. ජාතික අයවැයෙන් අනුමත වූ රුපියල් මිලියන 100 ක මුදල නිසි වේලාවට නොලැබීමත්, අනුමත වූ රුපියල් මිලියන 100 ම නොලැබීමත් හා මිළ ගණන් සංසන්දනය කිරීම තාක්ෂණික කරුණු මත සිදුකිරීම සඳහා වැඩිපුර කාලය ගතකිරීමත් මෙම තත්ත්වයට හේතු විය.
(ඉ)	වටිනාකම රු. 6,443,743 ක් වූ බැංකු ගිණුම් 06ක් අක්‍රිය බැංකු ගිනුම් ලෙස වසර 06කට අධික කාලයක් සිට පවත්වාගෙන ගොස් තිබුණි.	අංක 000-0351 ගිණුම 567 කාර්මික තාක්ෂණ ආයතනය හා පිහන් ගඩොල් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදුකරන ආයතන කිහිපයක් එක්ව පවත්වාගෙන යන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය වසර කිහිපයක් අක්‍රීයව පැවති අතර මේ වනවිට අදාළ ව්‍යාපෘතිය යලි ක්‍රියාකාරීව පවතී. මෙම මුදල නැවත ලබා ගැනීමට ලිඛිත ඉල්ලීමක් කර ඇත. 000-2876-229 දරණ ගිණුම කොහු ආශ්‍රිත ව්‍යාපෘතියක් වූ coir ව්‍යාපෘතිය සඳහා භාවිතා කළ අතර, 000-9283-122 ගිණුම හා 000-8174-439 ගිණුම EEPEX ව්‍යාපෘතියේ ගිණුම් වන අතර මෙම ව්‍යාපෘතිය මේ වනවිට අත්හිටුවා ඇත.
(ඊ)	ඖෂධ පරීක්ෂණ රසායනාගාර සේවාවන් ලබාගැනීම සඳහා විදේශ රටවලට විශාල ගාස්තුවක් වැය කිරීමට සිදුවීම වැළැක්වීම මෙම රසායනාගාරය පිහිටුවීමේ අරමුණක් වුවද එම අරමුණ ඉටු නොවීමෙන් තවදුරටත් විදේශ විනිමය වැයවීම වළක්වා ගැනීමට නොහැකිවී තිබුණි.	අපගේ මෙම රසයනාගාරය සඳහාද නියාමන අධිකාරී (Regularity Authority) බලයක් නොමැති බැවින් සියලුම සාම්පල අප රසායනාගාරයට නොලැබේ. මෙම ක්‍රියාවලිය මූලික පරමාර්ථය තුළ පවතින අතර එය ජාතික අවශ්‍යතාවයක් බැවින් ඒ සඳහා බලශක්ති අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ පූර්ණ කැපවීම මත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි හැකි ඉක්මනින් ක්‍රියාවට නැංවීම සඳහා කටයුතු සිදුවෙමින් පවතී.
(උ)	රසයනාගාරයෙන් ඉටුකරනු ලබන සේවාවන් පරීක්ෂාවේදී පෞද්ගලික අංශයේ නිෂ්පාදනවල සාම්පල් සඳහා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීමෙන් අදායම් උත්පාදනය කර තිබුනද එකී නිෂ්පාදනයන් සිදු කිරීමේදී සාම්පල පරීක්ෂණ වාර්තාවෙන් තහවුරු කළ ගුණාත්මක භාවය අඛණ්ඩව රැකෙන බවට රසායනාගාරයේ වගකීමක් නොවන බැවින් වෙළඳපොලට සැපයෙන නිෂ්පාදන වලින් පාරිභෝගිකයා ආරක්ෂාවීමක් සිදු නොවේ. මෙම තත්ත්වය මග හරවා ගැනීම සඳහා	පෞද්ගලික අංශය සඳහා වාර්තා නිකුත්කර අදායම ලබාගන්නා නමුත් නිරතුරු සාම්පල පරීක්ෂාව සඳහා යොමුවන්නේ එම පෞද්ගලික අංශයේ අවශ්‍යතාවය අනුවය. සාම්පල පරීක්ෂාවෙන් තහවුරු කළ ගුණාත්මක බව නිරතුරු සොයා බැලීමට අපවෙත නෛතික තත්වයක් නැත.

කාර්මික තාක්ෂණ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් තෙතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

	සම්බන්ධිත ආයතන සමග එක්ව කටයුතු කළ වුවත් එලෙස කටයුතු කිරීමක් සිදු නොවන බවට විගණනයේදී නිරීක්ෂණය විය.	